ISSN 1391 - 1031
2012 මාර්තු
17 වෙළුම 12 කලාපය

ආධාරය රු 30/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

'' විප්ලවවාදීන්ගේ ශක්තිමත් සංවිධානයකින් සැදුම්ලත්, දැඩි පදනමක් ඇතිව අපි කටයුතු අරඹන්නෙමු නම්, අපට ව්‍යාපාරයේ ස්ථායීතාවය තහවුරු කළ හැකි වන අතරම සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ හා නියම වෘත්තීය සමිතිය යන දෙකෙහිම අරමුණ ඉටුකළ හැකි වේ.''

*ලෙනින් (තෝරාගත් කෘති -1 වෙළුම, 242 පිටුව)*

## 3 පුපුරා යාමේ...



දැන් රාජපක්ෂ පාලනයේ සැළියද රත්වන්නට පටන්ගෙන තිබේ. කකුළු රංගනය නවතා 'බයිනෙත්තු අතට ගැනීමට, වහසි බස් දෙඩීමට හා දේශප්‍රේමයට මුවාවීමට' රාජපක්ෂ පාලනයට සිදුව තිබෙන්නේ ඒ නිසාය....

## 4 තරුණ



වත්මන් ධනවාදය මුහුණ දී සිටින අර්බුදය යනු හුදු පුටු මාරුවකින් පක්ෂ හෝ පාට මාරුවකින්, පුද්ගල මාරුවකින් විසඳුම් දිය හැක්කක් නොවේ. අඳුරේ අතපත ගාන, මංමුලා කරන ලද පීඩිත අසරණ පොදු ජනතාවට නිසි මග...

## 5 සංවාදය



කේඩර්ය පක්ෂය තමයි සමාජයේ විවිධ ජන කොටස් අතරට පක්ෂයේ මතවාදය පක්ෂයේ සංවිධානය පුළුල් කිරීම රැගෙන යන ප්‍රධාන සාධකය. එය පක්ෂ ක්‍රියාකාරීත්වයක පදනම වෙනවා. ඒ වගේම නිර්ධන පන්තියට අයත් විවිධ ජනතා කොටස්...

## 8 කලාව බිහි වූ අයුරු



මිනිසා ඇතුළු ලොව සියලු දේ දෙවියන්ගේ නිර්මාණයන් ලෙස පවසා විඥානවාදයේ කරවටක් ගිල්වා සිටි ජනතාව...

## 9 සංදර්ශන ආර්ථිකයේ



සංදර්ශන ආර්ථිකයෙන් සිදුකළ පිම්බීම පුපුරා ජනතාවගේ දෑස් ඉදිරිපිටම රාජපක්ෂ පාලනයේ බහින කලාව දැන් ඇරඹී ඇත. එකවරම ඉන්ධන මිල...

මතවාද...................07
දැනුම..................... 10
කාලීන......................11
කාන්තා....................12
ජාත්‍යන්තර..............13
විශේෂාංග...............14




අහස උසට ගිය තෙල් මිල ගිනි ඇවිළුවේ, කැණි මඬලටය. දරු පැටවුන්ගේ කුසේ ගින්න ඊටත් වැඩිය. සහනයක් දෙන්නැයි මොරගෑවේ, එසේ නොකර බැරිකමටය. එහෙත් ආණ්ඩුව නොඉල්ලූ ජල ප්‍රහාර දුන්නේ, තමන්ගේ පැවැත්ම රැක ගන්නටය. එහෙත් ජලය, තෙල් ගිනි නිවනවා වෙනුවට පතුරුවා හරින බව ආණ්ඩුව නොදන්නවා විය යුතුය. ඡායාරූපවලින් දැක්වෙන්නේ, පසුගිය 15වැනි දින කොළඹ මාලිගාවත්තේ සිට ආරම්භ කිරීමට සූදානම් වූ තෙල් මිලට එරෙහි ජ.වි.පෙ. උද්ඝෝෂණය හා සමගාමී අවස්ථා කිහිපයකි.

# පෙනෙනවාටත් වඩා ආර්ථික අර්බුදය බරපතළයි!

**බනිජ තෙල් මිල විශාල වශයෙන් ඉහළ දැමීමෙන් ප්‍රකාශයට පත්වූ ආණ්ඩුවේ ආර්ථික අර්බුදය, ප්‍රදර්ශනය වන ප්‍රමාණයට වඩා ගැඹුරට විහිදුණු, මිල ඉහළ දැමීම්වලින් පියවා ගත නොහැකි පරිමාණයේ බරපතළ අර්බුදයක් බව වාර්තා වේ.**

ආර්ථික අර්බුදයේ බරපතළ ක්ෂේත්‍රයක් වනුයේ ණය අර්බුදයයි. නිෂ්පාදන ක්ෂේත්‍රයේ අතිරික්ත වටිනාකම් ඉපයීමක් සිදුනොවන දෑයට කිරුළ වැනි සංදර්ශන ව්‍යාපෘති සහ මිහින් ලංකා, ක්‍රිකට් ක්‍රීඩාංගණ, අධිවේගී මාර්ග, හම්බන්තොට වරාය වැනි ආණ්ඩුවේ පුරාජේරු ව්‍යාපෘති වෙනුවෙන් දිය කර හරින ලද අති විශාල ධනස්කන්ධය හේතුවෙන් ණය වාරික පියවා ගැනීමට මුදල් සොයාගැනීම පවා අද ආණ්ඩුවට ගැටලුවක් වී තිබේ. මේ හේතුවෙන් මාර්තු හා ජූනි මාසවල කල්පිරෙන සංවර්ධන බැඳුම්කර හා ඒවායේ පොලී ගෙවීමටද විදේශ ණය ඒකකයේ ණය ගෙවීමටද ණය ගෙවීම ආශ්‍රිත වෙනත් වියදම් සඳහාද ආණ්ඩුවට මුදල් නොමැති වී ඇති අතර ඒ සඳහා මුදල් සොයාගැනීමට ඩොලර් මිලියන 600ක ණය ගෙවීමේ ණයක් ලබාගැනීමට ආණ්ඩුවට සිදුව තිබේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියමයන් පරිදි රුපියල පාවීමට ඉඩදීම හේතුවෙන් මේ සටහන තබන මොහොත වන විට ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය රුපියල් 123/- කට වැඩි වී තිබේ. එහි සෘජු බලපෑම හේතුවෙන් විදෙස් ණය මත ගෙවිය යුතු රුපියල් අගය විශාල ලෙස ඉහළ ගොස් භාණ්ඩාගාරයට අමතර බරක් පැටවී ඇත. සියලු ආනයන භාණ්ඩ හා සේවා සඳහා ගෙවිය යුතු මුදල ඉහළ ගොස් ඒවායේ දේශීය මිල ගණන් ජනතාවට දැරිය නොහැකි ලෙස ඉහළ යවා තිබේ.

ආණ්ඩුව විසින් ව්‍යාජ ලෙස පුම්බමින් පවත්වාගෙන ආ කොටස් වෙළඳපොළද සීඝ්‍රයෙන් කඩා වැටෙමින් ඇත. මේ අතර ශ්‍රී ලංකා මහා බැංකුව පසුගියදා පුවත්පත් දැන්වීමක් පළකරමින් කියා තිබුණේ, බැංකුවල තැන්පතු සම්බන්ධයෙන් තමන්ගේ වගකීමක් නොමැති බවත් මූල්‍ය ආයතන බංකොළොත් වුවහොත් ලක්ෂ දෙකක උපරිමයකට යටත්ව වන්දි ගෙවීමට රක්ෂණ භාරයක් ඇති කර ඇති බවත්ය. එය මූල්‍ය වෙළඳපොළේ ගොඩ නැගෙන අස්ථාවරභාවයේ ප්‍රකාශනයක් බව විශ්ලේෂකයින්ගේ අදහසයි.

මේ අතර ආණ්ඩුවේ සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් වියදම් කපාහැරීමේ චක්‍රලේඛ නිකුත් කර ඇති අතර ආරම්භ නොකළ ව්‍යාපෘති සඳහා අරමුදල් වෙන් නොකරන ලෙසට මුදල් අමාත්‍යාංශයෙන් නියම කෙරී ඇත. ජීවන වියදමට සරිලන ලෙස වැටුප් වැඩිවීම්, දීමනා ඉල්ලා සේවා ස්ථාන මට්ටමින් කම්කරු සටන් පැන නැගෙමින් තිබෙද්දී රට පුරා සියලු ජනතාව ඉන්ධන ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා සඳහා සහන ඉල්ලා වීදි බසිමින් සිටිති.

මෙසේ රට තුළ නැගෙන මහජන විරෝධයට මුහුණ දීගත නොහැකිව සිටින මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ජිනීවා විරෝධයක් මුල් කරගනිමින් උද්ඝෝෂණ ව්‍යාපාරයක් ආරම්භ කළේ ජනතාවගේ ජීවන වියදම හා බැඳුණ සටන්පාඨ යටපත් කිරීමේ අරමුණින්ය යන්න රහසක් නොවේ. කෙසේ වුවද ආර්ථික අර්බුදය තවදුරටත් යටපත් කොට තබාගැනීමට ආණ්ඩුවට නොහැකි වී ඇති අතර දිනෙන් දින උග්‍රවන ජීවන අර්බුදය හමුවේ නැගෙන ජනතා හඬ වළකාලීමට ආණ්ඩුව අපොහොසත් වනු ඇති බවත් එයම ආණ්ඩුවේ දේශපාලන ගමන කෙටි කරනු ඇති බවත් දේශපාලන විචාරකයින්ගේ මතය වී තිබේ.

# 2 වැඩ බිම



## තැපැලේ 12වැනි මහ සමුළුව සාර්ථකව මුළුදෙයි





ලංකා තැපැල් සේවා සංගමයේ 12වැනි මහ සමුළුව පසුගිය 02වැනි දින කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පවත්වන ලද අතර ඒ සඳහා තැපැල් සේවකයින් රැසක් එක්ව සිටි බව වාර්තා වේ.
මෙම අවස්ථාවේ ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගි වූයේ, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාය.

## දුම්රිය වර්ජන වගකීම අමාත්‍යවරයාත් ආණ්ඩුවත් භාරගත යුතුයි!

### දුම්රිය පොදු සේවක සංගමය

17000 ක් පමණ වන දුම්රිය සේවකයින්ගේ අධ්‍යාපන මට්ටම, සේවා මට්ටම, වෘත්තිය කුසලතාමය හැකියාව සැලකිල්ලට ගෙන බඳවා ගැනීම් පටිපාටි සකස් කොට විසඳුමක් ලබාදෙනවා වෙනුවට, මෙතෙක් ලබාදී ඇති විසඳුම් වන්නේ එකිනෙක සේවකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම සහ වැටුප් තල නිර්ණය කිරීම සඳහා සකස් කළ 6/2006 වැටුප් චක්‍රලේඛය නිකුත් කොට මේ වනවිට වසර හයක් ගත වී ඇතත් මෙතෙක් තම වැටුප් ප්‍රශ්නයට විසඳුම් ලබානොදීම විසින් මෙම වෘත්තිය ක්‍රියාමාර්ගය දක්වා ඔවුන් අවතීර්ණ වී ඇත.

සමස්ත ලංකා දුම්රිය සේවකයන්ගේ පොදු සේවක සංගමය
ALL CEYLON RAILWAY EMPLOYEES' GENERAL UNION

ලක්ෂ දහයක් පමණ වන රාජ්‍ය සේවකයින්ගේ වැටුප් ප්‍රශ්නය විසදනවා වෙනුවට සේවකයින් රැවටීමට ලක්කරමින් සිදුකරන සාවද්‍ය විසඳුම් නිසා දුම්රිය සේවකයින් තුළ විරසකභාවය අවුළුවා ඇති අතර එකිනෙක සේවාවන් අතරද බරපතළ අසමානතාවයන්ද වර්ධනය කොට ඇත. දුම්රිය සේවකයින්ගෙන් එල්ල වන විරෝධය හමුවේ එක් එක් සේවකයින් රැවටීම සඳහා විධිමත් අනුමත කරගැනීමකින් තොරව ප්‍රවාහන අමාත්‍යවරයා සහ ආණ්ඩුවේ බලධාරීන් අවිධිමත් වැටුප්තල ලබාදෙමින් ප්‍රශ්නය කල් දැමීමටද කටයුතු කරමින් සිටි. එබැවින් තව දුරටත් දුම්රිය සේවක වැටුප් ප්‍රශ්නයට වැඩිමලා බාලයා කරන, බාලයා වැඩිමලා කරන පැළැස්තර විසඳුම් ලබානොදී සියල්ලට එකගවිය හැකි සාධාරණ විසඳුමක් ලබාදෙන මෙන් අමාත්‍යවරයාට සහ වත්මන් ආණ්ඩුවට බලකර සිටින්නෙමු.'' එම නිවේදනයේ වැඩිදුරටත් සඳහන්ය.

ශ්‍රේණින් ඇණ කොට ගන්නා පැලැස්තර විසදුම් බවත් කිසිදු ප්‍රශ්නයකට ස්ථිරසාර විසඳුමක් ලබා දී නොමැති බව අවධාරණය කරන සමස්ත ලංකා දුම්රිය සේවකයින්ගේ පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් සුමතිපාල මානවඩු සහෝදරයා එවැනි ප්‍රශ්න මුල් කරගනිමින් පැනනගින වැඩවර්ජනවල වගකීම ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන්ම භාරගත යුතු බව කියා සිටී.
පසුගියදා සිදුවූ දුම්රිය වැඩවර්ජනය සම්බන්ධයෙන් අදහස් දක්වමින් එම සංගමය විසින් නිකුත් කොට ඇති මාධ්‍ය නිවේදනයක මේ බව සඳහන්ය.
''සිය වැටුප් ප්‍රශ්නයක් මුල්කරගෙන දුම්රිය නියාමකවරු, දුම්රිය ස්ථානාධිපතිවරු, දුම්රිය පාලකවරු සහ දුම්රිය අධික්ෂණ කළමනාකරුවෝ වෘත්තීය ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වූහ. රාජ්‍ය

## ගැටලු නොවිසඳීම හමුවේ රෝහල් සේවකයෝ වර්ජනයේ



දිගු කලක් තිස්සේ ඉල්ලීම් කළද විසඳුම් ලබානොදුන් ඉල්ලීම් 04 ක් මුල්කර ගනිමින් රෝහල් කණිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයින් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇතැයි සමස්ත ලංකා සුවසේවා සංගමයේ ප්‍රධාන ලේකම් ගාමිණී කුමාරසිංහ සහෝදරයා කියා සිටී.
ආදේශක සේවකයින් ස්ථිර කිරීම, සති විවේක දින කප්පාදුව නතර කිරීම, පොරොන්දු වූ නිල ඇඳුම් දීමනාව ලබාදීම සහ සෙනසුරාදා දින වැඩ කිරීම වෙනුවෙන් 1/30 දීමනාව ලබාදීම යන ඉල්ලීම් 04 මුල්කරගනිමින් රට පුරා රෝහල්වල සේවය කරන කණිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයින් පසුගිය 17වැනිදා දියත් කරන ලද වෘත්තීය ක්‍රියාමාර්ගය ඉතා සාර්ථක වූ බව පෙන්වා දෙන ගාමිණී කුමාරසිංහ සහෝදරයා, සෞඛ්‍ය අමාත්‍යවරයා ඇතුලු ආණ්ඩුව තවදුරටත් කල් නොයවා මෙම ඉල්ලීම් වහා ඉටු කළ යුතු බවත් එසේ නොවුණහොත් තම සංගමය දැඩි වෘත්තීය සමිති ක්‍රියාමාර්ග සඳහා එළඹෙන බවත් එහි වගකීම ආණ්ඩුව භාරගත යුතු බවත් සඳහන් කරයි.

## ජන පීඩක පාලනයට එරෙහි ඒකාබද්ධ මධ්‍යස්ථානයක්



තෙල්මිල, බඩු මිල, බස් ගාස්තු ඇතුළු අත්‍යවශ්‍ය සේවා මිල ඉහළ දැමීමත් ඉන් රටේ විවිධ ක්ෂේත්‍රවල ජනතාව වැටී ඇති අසීරු තත්වයන් සැලකිල්ලට ගෙන ඊට එරෙහිව රටේ වැඩකරන ජනයා ඇතුළු සෙසු පීඩිත ජනයා ඒකරාශී කරගත් දැවැන්ත ජනතා උද්ඝෝෂණ ව්‍යාපාරයක් ඇරඹීමට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය තීරණය කර ඇති බව වාර්තා වේ.
ජීවත්වීමට නොහැකිව වීදිබසින ජනයාට වෙඩි තබා දිගින් දිගටම මර්දනයේ යෙදෙන රාජපක්ෂ ආණ්ඩුවට එරෙහිව දැවැන්ත ජන බලයක් ගොඩ නැගීම තව තවත් කල් දැමිය නොහැකි කර්තව්‍යයක් බව අවධාරණය කරන වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයා රටේ කම්කරුවන්, ගොවියන්, ධීවරයන්, ශිෂ්‍යයන්, වෘත්තීයවේදීන් ඇතුළු පීඩාවට පත්වී ඇති සියලු ජනයා ඒකරාශී කිරීම සඳහා ඒකාබද්ධ මධ්‍යස්ථානයක් පිහිටුවීමට පසුගියදා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය කටයුතු කළ බවත් ඒ සඳහා ඉහත සෑම ක්ෂේත්‍රයකම නියෝජිතයින් සහභාගි වූ බවත් නියමුවා වෙත ප්‍රකාශ කළේය.

# පුවත්

10 පිටුවෙන් රාජ්‍යය...

පාලකයා පත්කර ගත් බව සහ පාලකයාට බලය පවරාදී ඇත්තේ, ජනතාව විසින්ම යන අදහස මගින් දෙවියන් විසින් පාලකයාට බලය පවරා දී ඇතැයි යන දේවවරම්වාදයේ දෙවන මූලධර්මයද බිඳ වැටුණි.

### සම්මුතිවාදයට විවේචන

සමාජ සම්මුතිවාදයටද විවේචන කිහිපයක් ඉදිරිපත්ව ඇත. එනම්
ඓතිහාසික සාධක මගින් ඔප්පු කිරීමට අපහසුවීම
තාර්කිකභාවයෙන් ඈත් න්‍යායක්වීම
ලොක් හා රූසෝ විසින් ප්‍රකෘති සමාජයේ බුක්ති විඳි අයිතිවාසිකම් රාජ්‍ය තුළින් නැවත ලබෙන බව පැවසීම
තමන්ගේ අරමුණුවලට ගැලපෙන ලෙස ප්‍රකෘති සමාජය නිර්මාණය කිරීම
රාජ්‍යයේ සම්භවය හා විකාශනය ඓතිහාසිකව හදාරා නොමැතිවීම

### රාජ්‍යය විඥානයේ නිර්මාණයක් බව

විඥානවාදයට අනුව රාජ්‍යයට ගුප්ත පැවැත්මක් සහ අසීමිත බලයක් පවතී. තවද රාජ්‍ය වූ කලී පියවි ඇසට නොපෙනෙන මිනිසාගේ සාමාන්‍ය බුද්ධියට ගෝචර නොවන මහා විඥානය මගින් නිර්මාණය කරන ලද්දක් බව ෆෙඩ්රික් විල්හෙල්ම් හේගල් (1770-1831) විසින් සඳහන් කර ඇත. එමානුවෙල් ඛාන්ට් (1724-1804) සහ ටී. එස්. ග්‍රීන් යන්නන්ද රාජ්‍ය පිළිබඳ එවන් අදහස් ඉදිරිපත් කළ තවත් ප්‍රධාන පෙළේ පුද්ගලයන් දෙදෙනෙකි.
ඔවුන්ගේ අදහස් සැලකීමෙන් රාජ්‍ය පිළිබඳ විඥානවාදයේ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් මෙසේ දැක්විය හැක.
මිනිසා තවත් ජීවියෙකු වන අතර සමාජයෙන් තොරව මිනිසාට තම ප්‍රගතිය උදාකරගත නොහැක.
රාජ්‍යය මිනිස් ශරීරය නම් පුද්ගලයා එහි අවයවයකි.
රාජ්‍යයෙන් තොරව පුද්ගලයෙකුට පැවැත්මක් නැත.
රාජ්‍යයේ අභිවෘද්ධිය මත පුද්ගල අභිවෘද්ධිය පවතී.
පුද්ගලයින්ගේ යුතුකම රාජ්‍යයේ අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීමය. එනිසා රාජ්‍යය අභිවෘද්ධියට යනවිට නිරායාසයෙන්ම පුද්ගල අභිවෘද්ධියද සැලසේ.
රාජ්‍යය සදාචාරාත්මක ආයතනයකි. මිනිසාට සදාචාරත්මක ජීවිතයක් ගතකළ හැක්කේ, රාජ්‍ය තුළ ජීවත් වීමෙන් සහ රාජ්‍ය ආධාර ලැබීමෙන් පමණි.
මිනිස් අයිතිවාසිකම්වල ආරම්භය රාජ්‍යය වේ.
රාජ්‍යයෙන් තොරව මිනිසාට අයිතිවාසිකම් ලබාගැනීමටවත් බුක්තිවිඳීමටවත් නොහැක.
රාජ්‍යය වූකලී එයටම වෙනස්වූ පැවැත්මක් සහිත දෙයකි. රාජ්‍යයට එයටම වෙන්වූ කැමැත්තක් මෙන්ම අරමුණු සමූහයක් ඇත. රාජ්‍යයේ කැමැත්ත හා අරමුණු පුද්ගල අරමුණුවලට වඩා උත්තරීතරය.
රාජ්‍යය සතු බලය අසාහාය එකකි. පුද්ගලයා රාජ්‍යයේ අධිකාරී බලයට යටත්විය යුතු අතර රාජ්‍යයට විරුද්ධව කැරලි ගැසීමට අයිතියක් නොමැත.

### රාජ්‍යය පිළිබඳ පැසිස්ට් මතය

පැසිස්ට්වාදය යන්නට විවිධ අර්ථකථන ඇත. ඉන් කිහිපයක්නම්
පැසිස්ට්වාදය යනු හුදු අත්දැකීමක් සහ ප්‍රායෝගිකත්වය මත පදනම්වූ නිශ්චිත දර්ශනයක් හෝ න්‍යායාත්මක පදනමක් නැති අදහස් මාලාවක් බව
පැසිස්ට්වාදයේ නිර්මාතෘවරයෙකු ලෙස සලකන බෙනටෝ මුසොලෝනි මෙසේ පවසයි. ''පැසිස්ට්වාදයේ පදනම යථාර්ථය වේ. බොල්ෂෙවික්වාදයේ පදනම න්‍යාය වේ. අපි නිශ්චිත වශයෙන් යථාර්ථවාදීන් වන්නෙමු. කෙළවරක් දැකිය නොහැකි න්‍යායාත්මක විවාද අපි ළඟ ඇත්තේ නැත. මගේ වැඩපිළිවෙළ ක්‍රියාව මිස කතාව නොවේ.''
රාජ්‍යයේ නග්න බලයට අනුකම්පා විරහිතව මිනිසා යටත්කොට පාලනය කිරීම පැසිස්ට්වාදයේ ප්‍රධාන ලක්ෂණයයි. එම නිසා පැසිස්ට්වාදය රාජ්‍යයේ අසාහායත්වය හුවා දැක්වීමට අතිශය වැදගත් විය. එයට පදනම් වී ඇත්තේ, හේගල් ඉදිරිපත් කළ අදහස් මාලාවකි.

### පැසිස්ට්වාදයේ මූලික හඳුනගත හැකි මූලික ලක්ෂණ

රාජ්‍යයේ නග්න බලයට මිනිසා අනුකම්පා විරහිතව යටත් කිරීම
රාජ්‍යයට අසාහාය බලයක් පැවරීම
රාජ්‍යය පුද්ගලයාට වඩා උත්තරීතර බව දැක්වීම
රාජ්‍යයෙන් තොරව පුද්ගලයාට පැවැත්මක් නොමැති බව හා පුද්ගල ප්‍රගතිය රාජ්‍ය මත රඳා පවතින බව දැක්වීම
දැඩි ජාතිවාදය

### රාජ්‍යය පිළිබඳ අරාජික මතය

පෞද්ගලික දේපළ හා ආගම අතර ඇතිවූ අපූර්ව විවාහයේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය බිහිවූ බව අරාජිකවාදීන්ගේ මතයයි. එසේම රජය කුමන ආකාරයෙන් පැවතුනද එය අනවශ්‍ය ආයතනයක් බව ඔවුන් පවසයි.
විලියම් ගොඩ්වින්, තෝමස් හොප්ස්කින්, හෙන්රි තෝරෝ, ජොසප් ප්‍රෑඩොන්, මයිකල් බකුනින් සහ පීටර් කොපට්කින් මෙවැනි අරාජිකවාදී මත ඉදිරිපත් කළ ප්‍රධාන පුද්ගලයෝ වෙති.
ඔවුන්ට අනුව සමාජය තුළ රාජ්‍යය හා රාජ්‍යයේ අධිකාරී බලය ක්‍රියාවට නංවන කිසිදු පාලන ආයතනයක් දැකිය නොහැක. ඒ වෙනුවට දැකිය හැක්කේ, මිනිසුන්ගේ ස්වේච්ඡාත්මක සහයෝගය මත ගොඩනගාගත් සමූපකාර සංවිධාන මගින් සමාජ කාර්යයන් කරගෙන යන්නාවූ තත්වයකි.
තවද මොවුන් පෙන්වා දෙන ආකාරයට මිනිස් ජීවිතය පරිපූර්ණත්වයට පත්වන්නේ මිනිසා හැම ආකාරයටම පාලනයකින් නිදහස් වූ විටය. මිනිස් සමාජය තුළ මිනිසාගේ නිදහස සීමා කරන ප්‍රධාන සංස්ථා තුන ඔවුන් හඳුන්වාදේ. ඒවානම් රාජ්‍යය, පෞද්ගලික දේපළ සහ ආගම වේ.
මාක්ස්වාදීන් මෙන්ම මොවුහුද රාජ්‍යය මර්දනයේ උපකරණයක් බවත් එය ධනපති පංතියේ වුවමනාවට අනුව කටයුතු කරන බවත් පිළිගනිති. එසේම පෞද්ගලික දේපළ යනු ටික දෙනෙකු විසින් සමාජ ධනය සොරකම් කිරීමෙන් ගොඩනගාගත් දෙයක් බවද ආගම ධනපති පංතියට සේවය කරන තවත් උපකරණයක් බවද පවසා සිටිති. එහෙත් මෙහි විශේෂත්වය වන්නේ, මොවුන් නිර්ධන පංති රාජ්‍යයේ පැවැත්මද ප්‍රතික්ෂේප කිරීමයි.
එනිසා පෞද්ගලික දේපළ ක්‍රමය රාජ්‍යය මෙන්ම ආගමද මුළුමනින්ම විනාශ කර නව සමාජයක් ගොඩනැගිය යුතු බවද මොවුන්ගේ අදහසයි.

### ආණ්ඩුව අනුගමනය... අවසන් පිටුවෙන්

සම්මන්ත්‍රණයේ ආරාධිත දේශනය පවත්වමිනි. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක නලින්ද ජයතිස්ස සහෝදරයා මෙම සම්මන්ත්‍රණයේ මුලසුන දැරීය.
විශ්වවිද්‍යාල ආචාර්යවරුන් වැටුප් ප්‍රශ්නය නිසාත් අනධ්‍යන කාර්ය මණ්ඩලය වැටුප් ඇතුළු වෙනත් අයිතිවාසිකම් නිසාත් විදුහල්පතිවරුන්, ගුරුවරුන් විවිධ හේතු නිසාත් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් නිදහස් අධ්‍යාපනය කප්පාදුව නිසාත් පාසල් ශිෂ්‍යයන් සහ දෙමාපියන් පාසල් අධ්‍යාපනයට දේශපාලන අතපෙවීම්වලින් ඇතිවූ අර්බුද නිසාත් පාරට බැස උද්ඝෝෂණය කරන තත්වයක් ඇති වී තිබෙන නමුත් පාරට බැස්සවිය යුතු එස්බී දිසානායක සහ බන්දුල ගුණවර්ධන යන ඇමතිවරු දෙදෙනා අමාත්‍යාංශ ශීත කාමරවල රැඳී සිටින බව අනුර දිසානායක සහෝදරයා පැවසීය.
මේ ආණ්ඩුව අනුගමනය කරමින් සිටින්නේ ජේ.ආර්. ජයවර්ධන මහතා, රණසිංහ ප්‍රේමදාස මහතා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය, රනිල් වික්‍රමසිංහ මහතා යන කිසිම නායකයෙකුට විනාශ කරන්න බැරි වූ නිදහස් අධ්‍යාපනය දේශප්‍රේමී සළුපිළි පෙරවාගෙන විනාශ කිරීමේ වැඩපිළිවෙළයි. එයට එරෙහිව විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ගෙන යන අරගලයට අපේ ආචාරය හිමිවෙනවා. නමුත් අධ්‍යාපනයේ මේ ගැඹුරු අර්බුදය පරාජය කිරීමේ වගකීම අනාගත පරම්පරාවේ අභිවෘද්ධිය අපේක්ෂා කරන සියලු දෙනාගේම වගකීමක්. ඒ නිසා අධ්‍යාපනය අර්බුදයට හෙළා පෞද්ගලිකකරණය කිරීමට දරන සියලු ප්‍රයත්නයන් පරාජය කිරීම සඳහා අප සියලු දෙනා පෙළ ගැසිය යුතු බව, අරගල කළ යුතු බව අවධාරණය කරනවා.'' ඔහු වැඩිදුරටත් පැවසීය.

### තෙල් මිල ඉහළ... අවසන් පිටුවෙන්

විශාල මුදලක් වැය කළා. බාල පෙට්‍රල් ආනයනයෙන් සංස්ථාව තවදුරටත් අර්බුදයකට ගොදුරු වුණා.
මිහින් ලංකා වැනි ආණ්ඩුවේ හිතුවක්කාරී ව්‍යාපෘති වගේම එයාර්ලංකා වැනි සමාගම්වලට දේශපාලන මැදිහත්වීමෙන් ලබාදුන් ඉහළ තනතුරු නිසා පාඩු ලබන තත්වයකට පත්වුණා. මිහින් ලංකා, එයාර් ලංකා ඇතුළු රාජ්‍ය ආයතන 08ක් ඛනිජ තෙල් සංස්ථාවට ණයයි.
දැයට කිරුළ ප්‍රදර්ශනයට රුපියල් කෝටි 2100ක් වැය කර තිබෙනවා. ඒ වගේම පසුගිය වසරේ මුල් මාස 06 සඳහා රජයට වාහන ගැනීම සඳහා රුපියල් කෝටි 1454ක් වියදම් කර තිබෙනවා. ජනාධිපති ආරක්ෂක අංශයට කෝටි 27ක වාහන අරන්. මේ සියල්ලම ජනතාව මත බර පටවා දරන නාස්තිකාර වියදම්. මේ තත්වයට රුපියලේ අගය 3%කින් අවප්‍රමාණ කිරීම නිසා ඇතිවෙන ආර්ථික ප්‍රතිවිපාක එකතු වී ජනතාව මතම තවදුරටත් බර පැටවෙනවා.
තවත් පැත්තකින් සලකා බලනවිට තෙල් මිල වැඩිකිරීමෙන් මුළු රටේම නිෂ්පාදන ක්‍රියාවලියට බල ශක්තිය සපයන තෙල් සහ විදුලිය විශාල වශයෙන් ඉහළ පිරිවැයක් දරන්න සිදුවෙනවා. කෘෂිකර්මාන්තයටත් වතුර පොම්පයේ සිට අත් ට්‍රැක්ටරය, ඇතුලු කෘෂිකාර්මික උපකරණවලට ඉන්ධන සඳහා දැරිය යුතු වියදම විශාල වශයෙන් ඉහළ යනවා. මෙක සමස්ත ආර්ථිකයටම දරාගන්න අමාරු තත්වයක්. දැඩි අර්බුදයකට මුහුණ දීමට හේතු වන තත්වයක්. මේ නිසා අපි ආණ්ඩුවට බලකරනවා ආණ්ඩුවේ නාස්තිකාර වියදම් ආවරණය කර ගැනීමට තෙල් මිල ඉහළ දැමීම වහාම නතර කරන ලෙස. ඒ සඳහා බල කිරීමට රට පුරා විවිධ ප්‍රදේශවල අපි උද්ඝෝෂණ පවත්වනවා.''

# පුපුරා යෑමේ ලකුණු පෙන්වන අර්බුදයේ ගිනි කන්ද



පසුගිය දිනවල ඇතිවූ ආණ්ඩු විරෝධී උද්ඝෝෂණත් එම සාමකාමී උද්ඝෝෂණවලට ආණ්ඩුව වෙඩි තැබීම හා කඳුළු ගෑස් ප්‍රහාර එල්ලකිරීමත් නිසා ලංකාවේ දේශපාලන කරළිය උණුසුම් වී තිබේ. ආණ්ඩුව හිටිහැටියේම, කිසිදු සාධාරණ හේතුවකින් තොරව තෙල් මිල මහා පරිමාණයෙන් වැඩි කිරීමත් එය හේතුකොටගෙන සහන දෙන ලෙස විවිධ ජනකොටස් ඉල්ලා සිටිද්දී ඒ මතට බස්ගාස්තු 20%ක් වැඩිකිරීමත් ඒ සමග විදුලි ගාස්තු 35% සිට 40%ක ප්‍රමාණයෙන් වැඩි කිරීමත් ජනතා උද්ඝෝෂණවලට හේතු විය. තෙල් මිල වැඩි කිරීමට එරෙහිව මතුවූ ජනතා හඬට කන් දෙනවා වෙනුවට ආණ්ඩුවේ කළේ, ජනතා උද්ඝෝෂණවලට පහර දීමය. හලාවතදී සාමකාමී ධීවර උද්ඝෝෂණයකට වෙඩි තැබීමෙන් ධීවරයෙක්ද මේ වනවිට මිය ගොස් තිබේ.

ආණ්ඩුවේ හැසිරීම දෙස බලන විට පැහැදිලිවම පෙනී යන්නේ, ආණ්ඩුව සූදානම ජනතාවට සහන දීමට නොව 'ජනතාවට මුහුණ දීමට බවය. ආණ්ඩුවේ ක්‍රියාමාර්ග බවට පත්වෙමින් තිබෙන්නේ, සහන ඉල්ලන ජනතාවට සහන දෙනවා වෙනුවට පහරදීමය. පසුගිය 20 වෙනිදා ජාතික පුවත්පත් වාර්තා කර තිබූ 'කඳුළු ගෑස් උණ්ඩ උපකරණ 15,000ක් ගන්න ටෙන්ඩර් කැඳවයි' යන ශීර්ෂ පාඨය ඊට හොඳම නිදසුනකි. එම වාර්තාවට අනුව කඳුළු ගෑස් බෝම්බ හා උණ්ඩ 4700ක්ද මුහුණු ආවරණ 1000ක්ද හෙල්මට් හා අත් ආවරණ තහඩු 3500ක්ද රබර් බැටන් පොලු 2500ක්ද ගෙන්වීමට පොලිස් මූලස්ථානය ටෙන්ඩර් කැඳවා තිබේ. ඒ සියලු උපකරණ අවශ්‍ය වන්නේ, පීඩාවට පත් ජනතාවට සහන දීමට නොව සහන ඉල්ලා හඬ නගන ජනතාවට පහරදීමටය. ආණ්ඩුව මුහුණ දී ඇති ආර්ථික අර්බුදයේ බරපතළකමත් ඒ තුළ ආණ්ඩුවේ ජනතා විරෝධී හැසිරීමත් තේරුම්ගැනීමට එය හොඳටම ප්‍රමාණවත්ය.



''ධනපති ක්‍රමය ලෝකය මුළුල්ලේම ජයග්‍රහණ ලබා ඇත. එහෙත් මෙම ජයග්‍රහණයන්, ප්‍රාග්ධනය පරදවා ශ්‍රමය ලබන විජයග්‍රහණයට ප්‍රස්ථාවනාව පමණි.''

**ලෙනින් (තෝරාගත් කෘති - 1 වෙළුම, 51 පිටුව)**

ඉහළ දැමූ තෙල් මිල අඩුකරන ලෙස ඉල්ලා ජනතාව ආරම්භ කළ ප්‍රථම උද්ඝෝෂණ කිහිපයෙන්ම ආණ්ඩුවත් ජනාධිපති රාජපක්ෂ මහතාත් තැති ගෙන තිබෙන බව පෙනේ. පෙබරවාරි 18දා කඩවත පැවැති ජනහමුවකදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පළකොට තිබූ සමහර අදහස් දෙස බලනවිට ඔහුගේ තැති ගැනීම පැහැදිලිය. එම ජනහමුවේ ජනාධිපතිවරයා කියූ කතාව පෙබරවාරි 20 දා පුවත් පත් වාර්තා කර තිබුණේ, 'පාරට බැහැලා ගිණි තියලා ආණ්ඩු පෙරළන්න කාටවත් ඉඩ දෙන්නේ නැහැ' යනුවෙනි. කඳුළු ගෑස් උණ්ඩ උපකරණ ගෙන්වන ප්‍රවෘත්තිය තිබුණේ, ඉහත ප්‍රවෘත්තියට පහළිනි. ඒ ප්‍රවෘත්ති දෙක එකතු වූ විට තත්වය පැහැදිලිය. ඒ ජනාධිපතිවරයා තැති ගැනීමට ලක්වී තිබෙන බවය. ඔහු ජනතාවට සහන දීම වෙනුවට ජනතාවට මුහුණ දීමට සූදානම් වන බවය. ඒ, මර්දනයේ අවි ශක්තිමත් කරමිනි. තෙල් මිල අඩුකරන ලෙස ඉල්ලා කළ සරල උද්ඝෝෂණ කිහිපය ''ආණ්ඩුව පෙරළීමේ'' උද්ඝෝෂණ ලෙස දක තැති ගැන්මට ලක්ව තිබීමෙන් කියා පාන කරුණු කීපයක් තිබේ. එකක් නම් ලංකාව මුහුණ දෙමින් තිබෙන ආර්ථික අර්බුදය ඉතාම බරපතළ බවය. අනෙක එකී අර්බුදයට රාජපක්ෂ ආණ්ඩුව සතුව විසඳුම් නොමැති බවය. ඊළඟ කරුණ එහි බර ජනතාව මත පටවනවා හැර අන් විකල්පයක් ආණ්ඩුව සතුව නැති බවය. එසේම ඒ හේතුවෙන් නිර්මාණය වන ජනතා උද්ඝෝෂණයන් ආණ්ඩුවට හානිකර බවත් ඒවා ආරම්භක මොහොතේදීම පාගා දමනවා හැර වෙනත් විකල්පයක් ධනපති ආණ්ඩුවට නැති බවත්ය. එහෙත් ජනතා අරගල මර්දනයෙන් යටපත් කළ නොහැකි බවද පාලකයෝ දනිති. සාධාරණ හේතු මත සංවිධානාත්මක මගපෙන්වීමක් සහිතව සිදුවන ජනතා උද්ඝෝෂණ වෙත මර්දනය මුදා හැරීමෙන් ඒවා නොනවතී. ඒවා තව තවත් වර්ධනය වන බවත් අවසානයේ පාලකයින් පලවා හරින මහා කුණාටු බවට ඒවා පත්වන බව ඈත ඉතිහාසය ද මෙන්ම ඉතා මෑත ඉතිහාසය උගන්වා තිබේ. රාජපක්ෂ පාලනය තැති ගන්නේ ඒ නිසාය.

2008 සැප්තැම්බරයේදී එක්සත් ජනපදයෙන් ආරම්භ වූ ලෝක ආර්ථික අවපාතය යුරෝපය හරහා හමා යද්දී ලංකාවේ රාජපක්ෂ ආණ්ඩුවත් එහි දාසයන් වන මූල්‍ය ක්ෂේත්‍රයේ ලොක්කෝත් පුරසාරම් දෙඩවූයේ එම අර්බුදය ලංකාවට අදාල නොවන බව පවසමිනි. අර්බුදයට පත් එක්සත් ජනපදයට ඉන් මිදීම සඳහා 'ටියුෂන්' දීමට වුව රාජපක්ෂ පාලනයට හැකි බව එකල පවසන ලදී. ඒ මොහොතේ රාජපක්ෂ පාලනයේ සියලු දෙනා හැසිරුණේ, 'දියරත්වන තුරු සැළියේ කෙළින කකුළුවන්' සේය. දැන් රාජපක්ෂ පාලනයේ සැළියද රත්වන්නට පටන්ගෙන තිබේ. කකුළු රංගනය නවතා 'බයිනෙත්තු අතට ගැනීමට, වහසි බස් දෙඩීමට හා දේශප්‍රේමය පසුපස සැඟවීමට' රාජපක්ෂ පාලනයට සිදුව තිබෙන්නේ ඒ නිසාය. 'බයිනෙත්තු බොහෝ දේවල් සඳහා යොදා ගත හැකි වුවත් ඒ මත වාඩිවීම සඳහා නොවේ' යැයි වරක් මාක්ස් පවසා තිබූ වදන් රාජපක්ෂ පාලනය වටහා ගන්නේනම් හොඳ වුවත් පත්ව තිබෙන අර්බුදයේ ප්‍රමාණයට අනුව එවැන්නක් වටහා ගැනීමට තරම් සිහි බුද්ධියක් පාලක පංතිය සතු වන්නේ නැත.

හිටි හැටියේ මෙතරම් ප්‍රමාණයකින් තෙල් මිලත් ඒ මත බස් ගාස්තු හා විදුලිය ගාස්තුවත් නංවීමට ආණ්ඩුවට සිදුවූයේ ඇයි? ඒ, ලෝක වෙළඳපොළේ එතරම් ප්‍රමාණයකින් බොරතෙල් මිල ඉහළ ගොස් ඇති නිසා නොවේ. නව ලිබරල් ධනවාදය තුළ අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතනවල කොන්දේසි පිළිගැනීමට ආණ්ඩුව තීරණය කර තිබීමත් ලංකාවේ සැබෑ ආර්ථික සංවර්ධනයක් නොමැති වීමත් ඒ මැදට කෙරෙන මහා පරිමාණ වංචාව හා නාස්තියත් මේ අර්බුදයේ මූලයෝ වෙති.

වර්තමාන ලෝක ධනවාදය මුහුණදී ඇති අර්ථික අවපාතයේ ප්‍රධාන හේතුව වී ඇත්තේ, ධනේශ්වර ප්‍රාග්ධනයේ විශාල ප්‍රමාණයක් නව වත්කම් බිහි නොකිරීම හෙවත් අතිරික්ත වටිනාකම් නිර්මාණය නොකිරීමය. ලංකාවද මුහුණ පා ඇත්තේ, එම අර්බුදයටමය. විවෘත ආර්ථිකය තුළ ලංකාවේ සියලු කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදන බිඳ වැටී තිබේ. සැබෑ ලෙසින්ම ගත්විට අධිරාජ්‍යවාදයේ උපදෙස් මත ඒවා බිඳ දමා තිබේ. ලංකාවේ ආර්ථිකය දැන් පවතින්නේ ණය මත, බදු මත හා දඩ මතය. රජයේ ආදායමේ ලොකුම පංගුව නිර්මාණය වන්නේ, බදු ආදායම් මගිනි. ඒ අනුව රාජ්‍ය ආදායමේ බදු නොවන ආදායම් පංගුව 10% වන අතර බදු ආදායම 90%කි. එම බදු ආදායමෙන් වැඩි ප්‍රමාණයද ආදායම් බදු නොව ජනතාවගේ භාණ්ඩ හා සේවා මත පනවා ඇති බදුය. එහි ප්‍රතිඵලය වන්නේ, සැබෑ ආදායම් උපදවන්නේ නැතිව 'ණයට කමින්' විදේශීය හා දේශීය ණය 'ආදායම' ලෙස පෙන්වමින් ණයට ගත් මුදලින් නව වත්කම් බිහි නොකරන මහා පරිමාණ ව්‍යාපෘති ගොඩනග මින් පවත්වාගෙන යන ආර්ථික සංවර්ධනයේ 'මායාව' එක් විටෙක බිඳ වැටීමය. දැන් සිදුව ඇත්තේ එයයි. එවිට ලොව පුරා ධනවාදී රටවල් තුළ මෙන්ම ලංකාවේ පාලකයන් හමුවේ ද පවතින්නේ, අර්බුදයේ බර අනුකම්පා විරහිතව ජනතාව මත පැටවීමේ ක්‍රියාමාර්ගය මිස අන් යමක් නොවේ. දැන් ලාංකේය ජනතාව මුහුණ දෙමින් සිටින්නේ, එම කටුක සත්‍යයටය.

රාජපක්ෂ ආණ්ඩුවේ ඉන්ද්‍රජාලිකයින් විසින් මවා තිබූ සංදර්ශන ආර්ථිකයේ අවසානය දැන් ආරම්භ වී තිබේ. අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතනවල කොන්දේසිවලට අනුව අධිරාජ්‍යවාදී වුවමනාවන් ඉටුකරමින් එහෙත් බොරු දේශප්‍රේමී කඩතුරාවකට මුවා වී රාජපක්ෂ ආණ්ඩුව අනුගමනය කරමින් තිබූ ආර්ථික ප්‍රතිපත්තිවල ඵලවිපාක දැන් මතුව තිබේ. ඒ ආණ්ඩුවේ දේශප්‍රේමී වෙස් මුහුණ යටින් තිබෙන සැබෑ මුහුණ අනාවරණය කරමිනි.

තෙල් මිල මහා පරිමාණයෙන් වැඩි කොට එහි බර ජනතාව මත පැටවීමට ආණ්ඩුවට බලපෑ එක් හේතුවක් වූයේ, ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණ කිරීමය.

පසුගිය වසර අග රුපියල් 113ක් වූ ඩොලරය මේ වනවිට රුපියල් 120ද ඉක්මවා ගොස් තිබේ. මෙලෙස රුපියල අවප්‍රමාණ වීම භාණ්ඩ මිල වැඩිවීමට හේතු වී තිබේ. රුපියල මෙලෙස මහා පරිමාණයෙන් බාල්දු වූයේ ඇයි? ඒ අන් කිසිවක් නිසා නොව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝගවලට අනුව ලංකාවේ ආණ්ඩුව රුපියල පාලනයෙන් ඉවත් වී එය පාවෙන්නට හැරීම නිසාය. ආණ්ඩුව රුපියල පාවෙන්නට හැරිය විට රුපියල අවප්‍රමාණ වන්නේ ඇයි? ඒ, අන් කිසිවක් නිසා නොව ලංකාවේ සැබෑ වත්කම් වර්ධනය නොවී තිබීම නිසාය. ලංකාව ආර්ථික සංවර්ධනයක් පවතින්නේනම්, ලංකාවේ වත්කම්, විශේෂයෙන් විදේශ වත්කම් වර්ධනය වන්නේනම් රුපියල බාල්දු වන්නේ නැත. එවිට සිදුවිය යුත්තේ, රුපියල ශක්තිමත්වීමය. එහෙත් ආණ්ඩුව රුපියලේ අගය කෘත්‍රිම ලෙස ස්ථාවරව තබා ගැනීමෙන් ඉවත්වී එය පාවෙන්නට හරින විට එය කඩාවැටෙන්නේ, ලංකාවේ ආර්ථිකය වත්කම් උපයා නැති නිසාය. රාජපක්ෂලාගේ සංවර්ධන මිත්‍යාව තේරුම් ගැනීමට මේ උදාහරණය හොඳටම ප්‍රමාණවත්ය. මෙලෙස රුපියල බාල්දු වූ විට ලංකාව විදේශ මුදල්වලින් ගෙන තිබූ ණය ප්‍රමාණය රුපියල්වලින් ඉහළ යන අතර පිටරටින් ගෙන්වන භාණ්ඩවල මිලද රුපියල්වලින් වැඩිවේ. දැන් සිදුවන්නේ එයයි. පසුගිය 2009 වසර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලංකාවට ඩොලර් බිලියන 2.6ක ණය අනුමත කළේය. දැන් එහි අවසන් වාරිකය ලංකාවට ලබාදිය යුතුව තිබිණි. එහිදී මූල්‍ය අරමුදල කොන්දේසි කිහිපයක් ඉදිරිපත් කළේය. එහි එකක් වූයේ, අවසන් වාරිකය ලබාගන්නේනම් ණය මුදලේ

15වැනි පිටුවට









# හෙට ලොව අපටයි!

ඒ, 138 බස් මාර්ගයයි. මමත් තවත් සහෝදරයෙකුත් එක්තරා දිනයක මේ මාර්ගයේ බස්රථවල Book Mark අලෙවි කරමින් සිටියෙමු. එක්තරා බසයක රියදුරු මහතාගෙන් අවසරගෙන, අනතුරුව අප කව්ද යන්නත් අපගේ අරමුණත් මා සමග ගිය සගයා බස් රථයේ සිටි පිරිසට පැහැදිලි කිරීමට පටන් ගත්තේය.
''ආදරණීය අම්මේ , තාත්තේ, දයාබර සහෝදරයා, සහෝදරිය, අපි සමාජවාදී තරුණ සංගමයෙන්....'' කතාව හමාර කිරීමට ඉඩ නොලැබුණි. කොන්දොස්තර මහතා අප අසලට පැමිණියේය.
''මේක කඩයක් කියල හිතුවද තමන්ට ඕන හැටියට නැගල කෑ ගහන්න'' ඔහු අපට දොස් පවරන්නට විය.

''අයියා, අපි ඩ්‍රයිවර් මහත්තයට කියලයි නැග්ගෙ...'' අප එසේ කීවද ඔහු පිළි නොගත් නමුදු ඉන් පසුබට නොවූ අපි දිගටම අපගේ කාර්යය කරගෙන යන්නට වීමු. නැවතත් මාගේ සහෝදරයාගේ හැඳින්වීම තුළ ඔහු ''සමාජවාදය'' පිළිබඳව සඳහන් කළේය. කොන්දොස්තර මහතා ඉන් කුපිත විය.

''බහිනවා, බහිනවා, ඕක නවත්තලා ඊළඟ හෝල්ට් එකෙන් බහිනවා....'' ඔහු තරහින් කෑගැසුවේය.

සමාජවාදය යන වචනය පමණක්ම ඔහු කුපිත කරවීමට සමත් විය. ඔහු ඒ තරමටම සමාජවාදයට වෛර කරන්නෙක් විය. දයාබර කොන්දොස්තර සොයුර, අප ඔබට දොස් නගනවා නොවේ. ඉහත සිදුවීම ඔබේ වරදින් සිදු වූවක් නොවන බව අපි දනිමු. ඔබ පමණක් නොව තවත් බොහෝ දෙනා සමාජවාදය සම්බන්ධයෙන් ඔබ පරිදිම ක්‍රියා කරනු අපි අත්දැක ඇත්තෙමු. වරද ඇත්තේ, ඔබ අත නොව, සමාජවාදය පිළිබඳ විකෘති හා භීතිය දනවන ආකල්පය ඇති කරන වත්මන් අධ්‍යාපන ක්‍රමය තුළයි; සමාජවාදය වෙනුවෙන් කැප වන සහෝදර සහෝදරියන් එලක් නැති වැඩ කරන්නවුන් ලෙසත් කඩාකප්පල්කාරීන් ලෙසත් පරිභවයට ලක් වන්නේ ඒ නිසාවෙනි.

සමාජවාදය යනු අගනාම මානව ජයග්‍රහණය බව දන්නේ, කීයෙන් කී දෙනාද? කියුබාවේ ෆිදෙල් සහෝදරයා සමාජවාදය පිළිබඳ ජනතාවට ඒත්තු ගැන්වූ අපූරු ආකාරය මට සිහිපත් වේ. 1961 අප්‍රේල් 16 දින ප්‍රසිද්ධ රැලියකදී ෆිදෙල් කියුබාව සමාජවාදී රාජ්‍යයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබුවේය. ඒ ජනතාවට පහසුවෙන් වටහාගත හැකි අයුරිනි. අනතුරුව ෆිදෙල් ජනතාවගෙන් මේ ආකාරයට ඇසුවේය.
''පසුගිය කාලයේ අපි කරපු නාගරික සංවර්ධනය ඔබ අනුමත කරනවාද?'' ජනතාව එක හෙළාම ''ඔව්, ඔව්'' යැයි කීහ. ඔහු නැවතත් මෙසේ ඇසුවේය. ''අධ්‍යාපනයේ, කෘෂිකර්මාන්තයේ අපි කළ වෙනස්කම් ඔබ අනුමත කරනවාද?'' ජනතාව නැවතත් ''ඔව්, ඔව්'' යැයි කියමින් එය අනුමත කළහ. අනතුරුව ෆිදෙල් නැවතත් ජනතාව අමතා මෙසේ කීය. ''එහෙමනම් ඒ තමයි සමාජවාදය'' ෆිදෙල් සමාජවාදය ගැන ජනතාවට වටහා දුන්නේ එලෙසය.

එසේ නම් මම ඔබෙන් මෙසේ අසමි. ''ලෝකයේ ඇතැම් රටවල මිලියන ගණන් ජනයා කුසගින්නේ මිය යද්දී, තවත් රටවල් තම භාණ්ඩවල මිල පවත්වා ගැනීම වෙනුවෙන් ආහාර තොග පිටින් විනාශ කිරීම ඔබ අනුමත කරනවාද? ලෝකයේ සෑම තත්පර 4කටම වරක් කුසගින්න නිසා කුඩා දරුවෙකු මිය යාම ඔබ අනුමත කරනවාද? ලොව පුරා මිලියන 121ක් පමණ කුඩා ළමුන් හට පාසල් අධ්‍යාපනය ලැබීමට අවස්ථාවක් නොමැති වීම ඔබ අනුමත කරනවාද? තම හැකියාවන්ට සරිලන රැකියාවක් නොලැබ තරුණ තරුණියන් අපේක්ෂාභංගත්වයෙන් සිය දිවි නසාගැනීම් ඔබ අනුමත කරනවාද? ලොව පුරා කාන්තාවන් හා කුඩා දරුවන් අමානුෂික වද හිංසාවන්ට හා අපහරණයට ලක් වීම ඔබ අනුමත කරනවාද? එසේ නම් මේ සියලු දුර්ගුණ සිය ජාති ලක්ෂ කොටගෙන ඇති ධනවාදය ඔබ අනුමත කරන්නේ ඇයි?

ආදරණීය සොයුර, සොයුරිය, මේ සියලු විෂම ලක්ෂණ අහෝසි කර දමා සාධාරණ, යුක්තිගරුක සමාජයක් බිහිකිරීම සමාජවාදයේ අරමුණයි. ඒ බිහිකරන නව ලෝකය ඔබ අප සියලු දෙනා වෙනුවෙන්මයි. ඒ නිසා අපට බැන වැදුණු කොන්දොස්තර සොයුරාද මේ කෲර ක්‍රමය තුළ අසාධාරණයන්ට හා පීඩාවන්ට ලක් වූවකුමය. ඉදින් අපේ වෑයම ඔහුටත් ඔහුගේ දරු දැරියන්ටත් අසාධාරණයෙන් හා පීඩාවෙන් තොර ලොවක් උරුම කර දීමයි. අද එය තේරුම් නොගත්තද, ඔහු එය තේරුම් ගන්නා දිනය වැඩි ඈතක නොවන බව අපට සහතිකය.

දිනය: 1930 ජන 21
ස්ථානය: ලාහෝර් අධිකරණය, ඉන්දියාව
සිදුවීම: සිරකරුවන්ගේ ගෙලේ රතු පැහැති සළුවකි. ''සමාජවාදී විප්ලවය දිගුකල් දිනේවා'', ''කොමියුනිස්ට් ජාත්‍යන්තරය දිගුකල් දිනේවා'', ''ලෙනින් අමරණීයයි'', ''අධිරාජ්‍යවාදය භංගවේවා'' යන සටන්පාඨවලින් උසාවි ශාලාව ගිගුම් දෙයි. භගත් සිං, ප්‍රධාන චූදිතයෝ විත්ති කූඩුවට නගිති. ඔහු 3 වන කොමියුනිස්ට් ජාත්‍යන්තරයට යැවිය යුතු ඔහු ටෙලිග්‍රෑම් පණිවිඩයක් කියවයි.

''මෙම ලෙනින් දිනයේදී, ශ්‍රේෂ්ඨ ලෙනින්ගේ අදහස් ඉදිරියට ගෙනයාමට උත්සාහ කරණු සියලු දෙනාටම අපි අපේ හෘදයාංගම සුභපැතුම් යවමු. රුසියාවේ සිදු කෙරෙමින් පවතින ශ්‍රේෂ්ඨ අත්හදා බැලීමට අපි සුභ පතමු. අපි අපගේ හඬද ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ හඬ සමඟ ඒකාබද්ධ කර ගනිමු. නිර්ධනීන් ජය ලබනු ඇත.! ධනවාදය පරාජය වනු ඇත.! අධිරාජ්‍යවාදයට විනාශය!!''
(2012 මාර්තු 23 දාට යෙදෙන තාරුණ්‍යයේ වීරත්වයේ අසිපත වූ භගත් සිං සහෝදරයාගේ 81 වන අනුස්මරණය වෙනුවෙනි)

# භගත් සිං හරහා
## රොෂෙන් සහ ඇන්තනී කියවමු...



දිනය 1929 අප්‍රෙල් 08 වෙනිදාය. ස්ථානය ඉන්දියානු රාජ්‍ය සභා ගොඩනැගිල්ලයි. මහජන ආරක්ෂක පනත සහ වෘත්තීය ආරවුල් පනත් කෙටුම්පත නමින් කරුණු දෙකක් එදින සාකච්ඡා වූ අතර දෙවන කෙටුම්පතට ඡන්දය විමසා සභාපතිවරයා එය ප්‍රකාශ කිරීමට නැගී සිටිනවටම තරුණයින් දෙදෙනකු විසින් සභාවට බෝම්බ දෙකක් දමා ගසන ලදී. එසේම ඔවුහු සටන්පාඨ හඬ නැගූ අතර පත්‍රිකාවක්ද බෙදා හැරියහ. ඉන් පසුව ඔවුන් දෙදෙනා ආරක්ෂක අංශ වෙත බාර වූහ. ඔවුන් දෙදෙනා නම් බගත් සිං හා බුටකේෂ්වර් දත්ය. ඔවුන් බෙදාහැරි පත්‍රිකාවේ තේමාව වූයේ, ''බිහිරන්ට ඇසීමට විශාල හඬක් අවශ්‍යය'' යන්නය.

සැබවින්ම එදා බගත් සිං මේ ක්‍රියාමාර්ග යට ගියේ, මිනිසුන් මරාදැමීමේ හිංසාකාරී චේතනාවකින් හෝ පළිගැනීමේ අරමුණකින් හෝ නැතිනම් මානසික ආබාධයක් වැනි ප්‍රශ්නයක් නිසා නොවේ. අධිරාජ්‍යවාදයේත් ඔවුන්ගේ ඒජන්තයින්ගේත් කෲර පාලනයට විරෝධය පළකිරීමටත් එසේම එම තත්වය හමුවේ ඇස්කන් පියාගෙන සිටි සියලු දෙනාගේ ඇස් කන් විවර කිරීමත් අරමුණු කරගෙනය. 1931 මාර්තු 23 වන දා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීහු විසින් නඩු අසා ඔවුන් දෙදෙනා ඇතුළු තවත් සගයින් දෙදෙනෙකු එල්ලා මරාදැමූහ. බිහිරන්ට ඇසීමට සැලැස්වීම සඳහා ඔවුහු තම වටිනා ජීවිත පරිත්‍යාග කළෝය.

හලාවත ධීවර සොයුරෙකු වූ ඇන්තනිගේ හිසට වෙඩි තබා කුරිරු ලෙස ඝාතනය කොට ඇත. ඒ, ජීවත්වීමේ අයිතිය ඉල්ලා හඬ නැගීමේ වරදටය. ඊට පෙර කටුනායකදී කම්කරු සොහොයුරෙකු වූ රොෂෙන් චානකද වෙඩි තබා ඝාතනය කළේ තම අනාගතය උදුරාගැනීමට එරෙහිව සටන් කිරීමේ වරදටය.

ලෝක වෙළඳපොළේ හදිසි තෙල් මිල ඉහළ යෑමක් සිදුනොවී තිබියදී අති දැවැන්ත ආර්ථික වර්ධනයක් ශ්‍රී ලංකාව අත්පත් කරගෙන ඇතැයි ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුවේ බත්බැලයන් පම්පොරි ගසද්දී එක්වරම පෙට්‍රල් ලීටරය රුපියල් 137 සිට 149 දක්වාද ඩීසල් ලීටරය 84 සිට 115 දක්වාද භූමිතෙල් ලීටරය රුපියල් 75 සිට 110 ද දක්වාද යනාදී වශයෙන් මිල ඉහළ දමන ලදී. ඒ සමගම බස් ගාස්තු 20%කින්ද විදුලි ගාස්තු විශාල ප්‍රතිශතවලින්ද ඉහළ දැමුණි. ඒ වනවිටත් හතේ හත වැදී සිටි පොදු ජනතාවට මෙය කිසිසේත් දරාගත හැක්කක් වූයේ නැත.

ඇන්තනී ඇතුළු ධීවර ජනතාවත් වැඩකරන ජනතාවත් ඇතුළු ජනතාව වීදි බැස්සේ මේ ජනතා විරෝධී ක්‍රියාවලට එරෙහිවය. යළිත් භූමිය රත්වීමට පටන් ගෙන තිබේ.
එහි දී පෙරමුණේ සටන්වැද සිටියේ ජ.වි.පෙ ය. ඒ අතර ඒකාබද්ධ විපක්ෂය යැයි කියමින් එක්සත් ජාතික පක්ෂය ඇතුළු කණ්ඩායම් කිහිපයක්ද පාරට බැස තිබේ. තමන්ට ඉක්මන් සහනයක් අපේක්ෂා කරන පීඩිත ජනතාව ඒවාට මුලාවීමටද ඉඩ තිබේ. එසේ වීමට ඉඩ දිය යුතු නැත.

ජනතාව පීඩාවෙන් මුදාගැනීමට යයි කියමින් දැන් විවිධාකාරයේ පුද්ගලයින් සංවිධාන වෙස් මුහුණුකාරයින් ඉදිරිපත් වී සිටිනු දක්නට හැකිය. ඒ නිසා ජනතා සතුරන් හා කුමන්ත්‍රණකරුවන් පරදවා මේ අභියෝගය ජයගත හැක්කේ, කෙසේද යන්න උභතෝකෝටිකය ලාංකේය පීඩිත පංතිය මේ මොහොතේ විසඳාගත යුතු ගැටලුවයි. මෙවැනි මොහොතක දී ලාංකේය තරුණ පරපුර සතු වගකීම සුළුපටු නොවේ.

මෙවැනි අවස්ථාවල 'භගත්සිං' වැනි විරුවන්ගේ පරමාදර්ශයන් අපට ඉතාම වැදගත්ය. භගත්සිං සටන් වැදුණේ හුදෙක් අධිරාජ්‍යවාදී ක්‍රියාමාර්ගවලට එරෙහිව පමණක් නොවේ. ඔවුන්ගේ ඒජන්තයින්ගේ රැවටිලිකාරී බොරුවද හෙළිදරව් කිරීම අරමුණු කරගෙනය. එසේම සමාජ පීඩනයට අසාධාරණයට, අයුක්තියට ඇති ස්ථිරසාර පියවර වන්නේ, සමාජවාදය කියා දීමටය.

භගත්සිං විසින්ම ලියනු ලැබූ එදා බෝම්බ ප්‍රහාරයෙන් අනතුරුව බෙදාහරිනු ලැබූ පත්‍රිකාව ඔහු අවසන් කර තිබුණේ මෙසේය.

**''ශ්‍රේෂ්ඨ විප්ලවයේ පූජාසනය මත කරනු ලබන පුද්ගල පරිත්‍යාගය අප සැමටම නිදහස ගෙන එනු ඇත. මිනිසා විසින් තවත් මිනිසෙකු සූරාකෑම අහෝසි කරනු ඇත. විප්ලවය දිගුකල් දිනේවා''**

ඒ නිසා බගත් සිංගෙන් උගත යුතු වැදගත්ම පාඩම වනුයේ, සටන් කරන්නන් වාලේ සටන් කිරීම නොව නිශ්චිත අරමුණක්, දැක්මක්, වැඩපිළිවෙළක් සහිතව සටන් කිරීමය. තාරුණ්‍යය ශක්තිමත්ය, අව්‍යාජය, ධෛර්ය සම්පන්නය. එහෙත් එම ගුණාංග පමණක් ප්‍රමාණවත් නොවේ. වත්මන් ලාංකේය තරුණ පරපුර මේ කරුණු බැරෑරුම්ව තේරුම්ගත යුතුව තිබේ.

වත්මන් ධනවාදය මුහුණ දී සිටින අර්බුදය යනු හුදු පුටු මාරුවකින් පක්ෂ හෝ පාට මාරුවකින්, පුද්ගල මාරුවකින් විසඳුම් දිය හැක්කක් නොවේ. අඳුරේ අතපත ගාන, මංමුලා කරන ලද පීඩිත අසරණ පොදු ජනතාවට නිසි මග පෙන්වීමක් අවශ්‍යය. එය කළ හැක්කේ, අධිෂ්ඨාන සහගත සංවේදී හදවත් ඇති එසේම නිරවුල් දැක්මක් හා වැඩපිළිවෙළක් ඇති අව්‍යාජ විප්ලවවාදීන්ගෙන් සමන්විත පීඩිත පංතියේ පෙරටුගාමී බලඇණිය වන නිර්ධන පංති පක්ෂයට පමණි.

එසේ නැතිව ධනපති දේශපාලන පක්ෂ හෝ සංවිධානවලටවත් රාජ්‍ය නොවන සංවිධානවලටවත්, වමේ හැඩයෙන් පෙනී සිටින අවස්ථාවාදී කල්ලි කණ්ඩායම්වලටවත්, අධිරාජ්‍යවාදී ඩොලර්වලින් යැපෙන රාජ්‍ය නොවන ඒජන්තයින්ටවත් මේ අර්බුදයට පිළිතුරු නැත.

ඔව්, මව්බිමේ අසරණ දයාබර දෙනෙත් කෝටි දෙකක් ඔබ දෙස බලා සිටී. ඔබ මංමුලා විය යුතු නැත. ආදරණීය ෆිදෙල් සහෝදරයාගේ මේ වදන් කියවන්න.

**''මාක්ස්වාදය මට සමාජය කුමක්දැයි ඉගැන්වූවා. මම ඊට පෙර සිටියේ දෑස් බැඳ උතුර දකුණ සොයාගැනීමට නොහැකි මහ වනයක අතරමං වූ අයෙක් ලෙසයි. ඔබ සැබෑ ලෙසම පංති අරගලයේ ඉතිහාසය තේරුම් ගන්නේ නැතිනම් අඩු ගණනේ සමාජය පොහොසත් හා දුප්පත් ලෙස බෙදී ඇති බව හා එක් පිරිසක් අනෙක් පිරිස සූරාකන බව පැහැදිලිව තේරුම්ගන්නේ නැතිනම් ඔබ කැලෑවක අතරමං වූ කිසිවක් නොදන්නා අය බවට පත්වෙනවා.''**

# පක්ෂ කේඩරය හා බහුජන ව්‍යාපාරය ශක්තිමත් කරගනිමින්

# ජ.වි.පෙ. ඉදිරියට යනවා

**ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා**

*නියමුවා:- තෙල් මිල, විදුලි බිල, බස් ගාස්තු ඉහළ දමා තිබෙනවා. ඒ මගින් ජනතාව දැඩි පීඩනයකට හසුවී තිබෙනවා. ආණ්ඩුව දිගටම අති විශාල ලෙස ණය ගනිමින් තිබෙනවා. නමුත් ජනතාවට කිසිදු සහනයක් එමගින් ලැබෙන්නේ නැහැ. මේ තත්වය ආණ්ඩුවේ ආර්ථික සැලසුමේ වරදක්ද? නැතිනම් අනුගමනය කරන ආර්ථික ක්‍රමයේ වැරැද්දක්ද? එහෙම නැත්නම් මේ දෙකමද?*

*විජිත හේරත් සහෝදරයා:-* පැහැදිලිවම මෙය සමාජ ක්‍රමයේ වැරැද්දක්. වැරදි ක්‍රමයක් තුළ මොන සැලසුම් හැදුවත් වැඩක් නැහැ. ඉන් සාර්ථක ප්‍රතිඵල ගන්න බැහැ. ඉන් සාර්ථක ප්‍රතිඵල ගන්න බැහැ. ඇත්තටම අපේ රටේ ධනපති ක්‍රමය ක්‍රියාත්මක වුණේ, බලහත්කාරී ලෙස. ඒ නිසාම ආරම්භයේ ඉඳලම අපේම වූ ස්වාධීන අත්දැකීමක්, වැඩපිළිවෙලක් තුළ ආර්ථිකය මෙහෙය වුණේ නැහැ. පසුගාමී ධනපති සමාජය තුළ බිහිවුණෙත් දීන බෙලහීන නායකයින්ම පමණයි. ඒ නිසා තමයි හැමදාම අනුන් මත යැපෙන්නේ. අදත් තත්වය එලෙසමයි. මේ ආණ්ඩුව කියලා තියෙන්නේ, IMF-රාජපක්ෂ හවුලක්. 2009 ජූලි 16දා IMF එකත් එක්ක අත්සන් කරපු ගිවිසුම අනුව තමයි ආර්ථිකය හසුරුවන්නේ. ඔවුන් කිව්වා බදු ක්‍රමය වෙනස් කරන්න කියල. වෙනස් කළා. අධ්‍යාපන සෞඛ්‍ය ආදී ජනතා සුභසාධන කපලා රජයේ වියදම් අඩුකරන්න කියලා. අද ඒක කිව්වටත් වැඩිය හොඳට කරනවා. ආනයන පාලන සීමා ඉවත් කරන්න කිව්වා. ඉවත් කළා. රුපියල බාල්දු කරන්න කිව්වා. බාල්දු කළා. ගහන ගහන පදේට නටනවා. හැබැයි රටේ කෘෂිකර්මය, කාර්මික, ධීවර නිෂ්පාදනයේ වැඩිකිරීමක් කළේ නැහැ. එහෙම කරන්න දැක්මක් නැහැ. සේවා ආර්ථිකය ගැන විශ්වාසය තියලා යනවා. අද බටහිර ලෝකයේ රටවල් වැටෙන්න පටන් අරගෙන තියෙන්නේ, මේ නව ලිබරල්වාදී ආර්ථිකය කරපින්නාගෙන යාම නිසා. අද වෙනකොට ඒ ක්‍රමය කුණු වෙලා, ජරා වෙලා. ඕජස් ගලනවා. තව දුරටත් ඒ ක්‍රමය තුළ ඉදිරියට යන්න බැහැ. අද තෙල් මිල, බස් ගාස්තු විදුලිය බිල වැඩිකිරීම මගින් ඔප්පු වෙන්නේ ඒක තමයි.

*නියමුවා:- ජනතා පීඩනයේ මූලය ආර්ථික ක්‍රමයේ වරදක් නම් එයට එරෙහි ප්‍රබල පෙළ ගැස්මක් අවශ්‍යයි. ඒ සඳහා තිබෙන ජ.වි.පෙ. දැක්ම කෙබඳුද?*

*විජිත හේරත් සහෝදරයා:-* සැබවින්ම අද මේ රටේ ජනතාවට මේ ක්‍රමය තුළ ජීවත්වෙලා හොඳටම ඇති වෙලයි තියෙන්නේ. ජනතාව ක්‍රමයේ වෙනසක් ඉල්ලා සිටිනවා. ඒ සඳහා ජනතාව දැනුවත් කරන්න, පෙළ ගස්වන්න සංවිධානය කරන්නයි ඕනෑ. මේ ක්‍රමය වෙනුවට රටේ නිෂ්පාදනය වැඩි කරන්න, ඒ නිෂ්පාදනය සඳහා රටේ සමස්ත ජනතාව සහභාගි කරවාගන්න, ඒ වගේ -ම එහි ප්‍රතිලාභ ජනතාව අතට සාධාරණව බෙදිල යන අලුත් ආර්ථික ක්‍රමයක් රටට අවශ්‍යයි. ඒ සඳහා නිවැරදි සැලැස්මක් තුළ කටයුතු කරන දේශපාලන නායකත්වයක මඟ පෙන්වීම රටට අවශ්‍යම මොහොත මේක. අද ජ.වි.පෙ. එවන් වූ විකල්ප ආර්ථික දේශපාලන ක්‍රමයක් වෙනුවෙන් ජනතාවට මඟ පෙන්වන්න නායකත්වය දෙන්න සූදානම්. ඒ සඳහා උතුරේත් දකුණේත් නැගෙනහිරත් බටහිරත් ජනතාව ශ්‍රී ලාංකිකයන් ලෙස පෙළගස්වන්න අපි සූදානම්. පැහැදිලිවම ඒ සඳහා ජ.වි.පෙ. නායකත්වයෙන් ගොඩනැගෙන පුළුල් ජනතා මධ්‍යස්ථානයක් අද ජනතාව ඉල්ලා සිටිනවා. අපි ඒ පුළුල් ජනතා මධ්‍යස්ථානය ගොඩනැගීමට වහ වහා මැදිහත් වෙනවා.

*නියමුවා:- විප්ලවවාදී ව්‍යාපාරයකට වැදගත් වන්නේ ශක්තිමත් කේඩරයක්ද? නැතිනම් පුළුල් බහුජන ව්‍යාපාරයක්ද? නැතිනම් මේ දෙකමද?*

*විජිත හේරත් සහෝදරයා:-* විප්ලවවාදී ව්‍යාපාරයක ප්‍රධානතම අවිය සංවිධානයයි. ධනපති සතුරාට පහරදීම සඳහා වූ ප්‍රබලතම අවිය එම සංවිධානයයි. එබැවින් පක්ෂ සංවිධානය විවිධ මට්ටම් තුළින් ශක්තිමත් වීම ඉතාම වැදගත්. සියලු හැකියාවන් තීරණය කරනු ලබන්නේ, එකී සංවිධාන ශක්තිය මතයි. එබැවින් කේඩරීය පක්ෂයේ ක්‍රියාකාරිත්වය ඉතාම වැදගත්. ඒ වගේම ඒ කේඩරීය පක්ෂය ඒකමතික මතවාදයක සිටීමත් අනිවාර්යය සාධකයක් වෙනවා. එනම් මතවාදී හා සංවිධානය ඒකමතිකභාවය තුළ තමයි කේඩරීය ශක්තිමත්භාවය තහවුරුව පවතින්නේ. ඒ කේඩරීය පක්ෂය තමයි සමාජයේ විවිධ ජන කොටස් අතරට පක්ෂයේ මතවාදය පක්ෂයේ සංවිධානය පුළුල් කිරීම රැගෙන යන ප්‍රධන සාධකය. එය පක්ෂ ක්‍රියාකාරිත්වයක පදනම වෙනවා. ඒ වගේම නිර්ධන පන්තියට අයත් විවිධ ජන කොටස් සමාජයේ විවිධ තැන්වල විසිරී සිටිනවා. ඔවුන් මේ සමාජ ක්‍රමයෙන් බැටකන අපේම පන්තියේ කොටස්. ඒ ජන බලවේග පක්ෂයේ නායකත්වයෙන් සංවිධානය කරන්න ඕනෑ. අන්න ඒ කටයුත්ත සඳහා පුළුල් බහුජන ව්‍යාපාරයක් අවශ්‍ය වෙනවා. විවිධ ජන බලවේග විවිධ බහුජන සංවිධාන මගින් සංවිධානය කළ යුතු වෙනවා. එතකොට තමයි පන්තියේ අසීමිත විශ්වාසය දිනාගත් පක්ෂය බවට අප පත්වන්නේ. මේ දෙක එකක් අනෙක මත පෝෂණය වෙමින් ඉදිරියට යනවා. එතකොට පක්ෂය තවත් ශක්තිමත් වෙනවා. ඒ වගේම පන්තියේ උපරිම සහභාගිත්වය ලැබෙනවා. එබැවින් විප්ලවවාදී ව්‍යාපාරයකට කේඩරීය පක්ෂය වගේම බහුජන ව්‍යාපාරය යන දෙකම එකසේ වැදගත් වෙනවා. අවශ්‍ය වෙනවා.

*නියමුවා:- ශක්තිමත් කේඩරයක් සහ පුළුල් බහුජන ව්‍යාපාරයක් එකසේ වැදගත් වන්නේ නම් එය යථාර්ථයක් කිරීම සඳහා පක්ෂයේ සූදානම මොනවගේ මට්ටමකද පවතින්නේ?*

*විජිත හේරත් සහෝදරයා:-* දැනටමත් අපි ඉලක්ක සහිත වැඩපිළිවෙළක් ආරම්භ කොට තිබෙනවා. එක පැත්තකින් පක්ෂ කේඩරය ශක්තිමත් කිරීම අරමුණු කොටගත් සංවිධාන අධ්‍යාපන මෙහෙයුමක් ආරම්භ කරලා තියෙනවා. ඒ සඳහා කෙටි කාලීන දිගු කාලීන ඉලක්ක තියෙනවා. අලුත් සංවිධායකයින් ගොඩනංවමින් තියෙනවා. ඒ වගේ පුළුල් ජනතා මධ්‍යස්ථානයක් ගොඩනැගීම ඉලක්ක කරගෙන විවිධ ක්ෂේත්‍රවල මැදිහත්වීම් ආරම්භ කර තියෙනවා. කම්කරු ජනතාව සංවිධානය කිරීම සඳහා වෘත්තීය සමිති ගොඩනැගීම ශක්තිමත් කිරීම හා ඒ සියල්ල ඒකාබද්ධ වූ මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම ඉදිරියට යමින් තියෙනවා. ගොවි ජනතාව රටේ උද්ඝෝෂණික පෙරමුණක් දක්වා ගොඩනැ-ගීමට ක්‍රියාකරමින් සිටිනවා. ශිෂ්‍ය ප්‍රජාව සංවිධානය කිරීමට අවශ්‍ය මැදිහත්වීම සමාජවාදී ශිෂ්‍ය සංගමය මගින් වේගයෙන් සිදුකරමින් සිටිනවා. ඒ වගේම තරුණ තරුණියන් පක්ෂයක ඉදිරිය සඳහා ඉතාමත් වැදගගත් බලවේගයක්. ඔවුන්ව තරුණ සංගමයේ නායකත්වයෙන් සංවිධානය කරනවා. කාන්තා, ධීවර, කුඩා තේ වතු, විදේශගත ශ්‍රී ලාංකිකයින් සංවිධානය කිරීම ආදී වූ විවිධ ජන බලවේග සංවිධානය කිරීමට බහුජන සංවිධාන ගොඩනැංවීම ශක්තිමත් කිරීම වේගවත් කර තියෙනවා. උතුර හා නැගෙනහිර පළාත්වල ජනතාව සංවිධානය කිරීම සඳහා 'සහෝදරත්වයේ ජනතා පවුර' මගින් මැදිහත් වෙමින් සිටිනවා. ඒ වගේම මැතිවරණ පෙරමුණ ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියමාර්ගත් එලෙසම ගනිමින් සිටිනවා. පැහැදිලි ඉලක්කයක් සහිතව අපි පක්ෂ කේඩරය හා බහුජන ව්‍යාපාරය වේගයෙන් ශක්තිමත් කරමින් ඉදිරියට යනවා.

*නියමුවා:- පක්ෂය කඩා ගෙන ගිය අන්තගාමී කණ්ඩායම ජාතික ගැටලුව සම්බන්ධයෙන් ඉදිරිපත් කරන චෝදනාවක්*

**15වැනි පිටුවට**





“කේඩරීය පක්ෂය තමයි සමාජයේ විවිධ ජන කොටස් අතරට පක්ෂයේ මතවාදය පක්ෂයේ සංවිධානය පුළුල් කිරීම රැගෙන යන ප්‍රධන සාධකය. එය පක්ෂ ක්‍රියාකාරිත්වයක පදනම වෙනවා. ඒ වගේම නිර්ධන පන්තියට අයත් විවිධ ජනතා කොටස් සමාජයේ විවිධ තැන්වල විසිරී සිටිනවා. ඔවුන් මේ සමාජ ක්‍රමයෙන් බැටකන අපේම පන්තියේ කොටස්. ඒ ජන බලවේග පක්ෂයේ නායකත්වයෙන් සංවිධානය කරන්න ඕනෑ. අන්න ඒ කටයුත්ත සඳහා පුළුල් බහුජන ව්‍යාපාරයක් අවශ්‍ය වෙනවා. විවිධ ජන බලවේග විවිධ බහුජන සංවිධාන මගින් සංවිධානය කළ යුතු වෙනවා. එතකොට තමයි පන්තියේ අසීමිත විශ්වාසය දිනාගත් පක්ෂය බවට අප පත්වන්නේ. මේ දෙක එකක් අනෙක මත පෝෂණය වෙමින් ඉදිරියට යනවා.”



මාවත දිගුය. එහි බාධා ගහනය. විටක අප වල්මත් වේ. විටෙක අපි පමණට වැඩි වේගයෙන් ගොස් බහු ජනයාගෙන් ඈත් වන්නෙමු. විටෙක පමණට වඩා හෙමින් ගොස් අපේ දෙපාවල ගැටෙන්නවුන් හුස්ම පිට කරනු අපට උණුසුම්ව දැනේ. විප්ලවවාදීන් ලෙස අප තුළ ඇති උද්යෝගය හේතුවෙන් මග හෙළිකරගනිමින් හැකි තාක් ඉක්මනින් යාමට අපි වැර දරන්නෙමු. එහෙත් බහුජනයාගෙන් අප පෝෂණය ලබා ගත යුතු බව අපි දන්නෙමු. ඔවුන්ට ඉදිරියට යා හැකි වන්නේ, අපි අපේ වැඩවලින් ඔවුන්ට ආදර්ශයක් සපයන්නේ නම් පමණි.

**චේ ගෙවාරා**

# ප්‍රකෝප නොවන ජ.වි.පෙ.



පසුගිය පෙබරවාරි 11දා මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදි පෙට්‍රල් ලීටරයක මිල රු.12කින්ද ඩීසල් ලීටරයක මිල රු. 31කින්ද භූමිතෙල් ලීටරයක මිල රු. 35ක්ද වශයෙන් 'ආඩම්බරකාර තාත්තා' ලෙස පෙනී සිටින මහින්ද රාජපක්ෂ පාලනය විසින් වැඩි කළේය. එම මිල වැඩි කිරීම ඩීසල් 33%ක් ද භූමිතෙල් 50%ක්ද විය. පසුදිනම එනම් පෙබරවාරි 12 දිනම ජනමාධ්‍ය සාකච්ඡාවක් පවත්වා ජ.වි.ප.යේ විරෝධය මෙම මිල වැඩිකිරීම්වලට එරෙහිව පළකරනු ලැබීය. ආණ්ඩුවේ බොරු සංදර්ශන සඳහා අතිවිශාල මහජන ධනස්කන්ධයක් නාස්ති කර දමමින්, වංචා, දූෂණවල බර මහජනතාව පිට පැටවීම පිළිබඳව එම මාධ්‍ය සාකච්ඡාවේදී විරෝධය පළ කළේය.



එයින් නොනැවතී, මහජනතාව සමඟ මහපොළොවේ දේශපාලනය කරන ජනතා විමුක්ති පෙරමුණ 13වැනි සඳුදාම පිටකොටුව දුම්රියපොළ ඉදිරිපිටදී සහ මාතර නගරයේ, අනුරාධපුර නගරයේ යන නගරවල දැවැන්ත උද්ඝෝෂණයක් පවත්වා ආණ්ඩුවට විරෝධය පළ කළේය. පෞද්ගලික බස් වර්ජනයක් පැවති එදින මඟී ප්‍රවාහනය මුළුමනින්ම බිඳ වැටී තිබූ අවස්ථාවක විරෝධතාවයට විශාල පිරිසක් සහභාගී වීම විශේෂත්වයකි.

අසීමිත ලෙස ඉන්ධන මිල ඉහළ දැමීම නිසා මුළු රටම නොසන්සුන් තත්වයකට පත්ව තිබිණි. හලාවත පැවති ධීවර උද්ඝෝෂණයට පොලීසිය වෙඩි තැබීමෙන් ඇන්ටනී ප්‍රනාන්දු ධීවර කාර්මිකයා මිය ගියේය. ජනතා විමුක්ති පෙරමුණ සංවිධානය කළ විරෝධතා පා ගමන 15 වෙනි බදාදා සවස මාලිගාවත්ත සිට කොටුව දක්වා ගමන් කිරීමට පෙරටු කොටගත්තේ ඇන්ටනී ප්‍රනාන්දු සහෝදරයා ඝාතනය කිරීම හෙළා දකීමේ බැනරයයි. පක්ෂයේ නායකයින්, ශිෂ්‍ය, කාන්තා, තරුණ, වෘත්තීය සමිති යන අංශවල නායකයින් පෙරටුකොටගෙන විරෝධතා පා ගමන ආරම්භ කෙරිණි. මුල සිටම එය වැළැක්වීමට විශාල කැරලි මර්දන පොලිස් ඒකකයක් යොදවා තිබිණි. විවිධ බාධා කිරීම් මධ්‍යයේ විරෝධතා පා ගමන ආරම්භ කෙරුණු අතර වහා ක්‍රියාත්මක වූ පොලීසිය මාර්ග බාධක යොදා එය වැළැක්වීමට පියවර ගත්තේය. මාර්ග බාධක දමා ජනතා විරෝධය නැවතිය හැකිද? ජ.වි.පෙ. ඒ බාධක නොතකා ඉදිරියට යාමට උත්සාහ කළ අවස්ථාවේ රසායනික ද්‍රව්‍ය මිශ්‍ර ජල ප්‍රහාරයක් එල්ල කළ පොලීසිය කඳුළු ගෑස් විද පෙළපාලිය විසුරුවා හැරීමට ක්‍රියා කළේය. පොලිස් කැරලි මර්දන ප්‍රහාරයන් නුහුරු නුපුරුදු ළදරුවන් නොවන පක්ෂ සාමාජිකයන්ගේ සටන්කාමිත්වය තියුණු වුයේය. මර්දනකාරී පරිසරය මැද්දේම පක්ෂ නායකයෝ කඳුළු ගෑස් ජලප්‍රහාරවලට බියවැද්දිය නොහැකි වූ ජනතාව ඇමතූහ. මහින්ද රාජපක්ෂ පාලනය ජනතා බලය ඉදිරියේ කකුල් වෙව්ලන තරමට බය වී ඇති බවත් සාමාකාමී ජනතා උද්ඝෝෂණ මර්දනය කිරීමෙන් පෙන්නුම් කරන්නේ එම කරුණම මිස අනෙකක් නොවන බව එහිදී අවධාරණය කෙරිණ. පොලීසිය යොදවා ප්‍රකෝපකාරී ලෙස පහර දීමෙන් ජනතා විමුක්ති පෙරමුණ ප්‍රකෝප කරවා මර්දනය දියත් කිරීමට ආණ්ඩුව ගන්නා උත්සාහයට හසු නොවීමට තරම් අත්දැකීම් තිබෙන පක්ෂය එවැනි උගුල්වලට හසු නොවන බව ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා එහිදී අවධාරණය කළේය.

එදින රාත්‍රී ප්‍රවෘත්ති විකාශනය කළ රූපවාහිනී නාලිකාවලින් අපූරුවට හෙළි කළේ, පොලීසිය ගල් අතැතිව එම මර්දනය දියත් කළ ආකාරයයි. පක්ෂ සාමාජිකයන් කඳුළු ගෑස් සිලින්ඩර් පෙරළා පොලීසිය දෙසට දමා ගසා තිබිණි. මේ ලෙස ඇතිවූ 'ඉන්ධන මිල පහත හෙළනු!' උද්ඝෝෂණය රට පුරා දිස්ත්‍රික් මට්ටමින් දියත් විය. දැන් එය වැඩබිම් දක්වා ව්‍යාප්ත කර අවසන්ය. එමෙන්ම අත් පත්‍රිකා බෙදා හරිමින් ජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාරය කොළඹ කොටුවෙන් 17 වැනිදා ඇරඹිණි. 18 වනදා වව්නියාව නගරයේද මෙම පත්‍රිකාව බෙදාහැරීම සිදු කෙරිණ. ඉන් අනතුරුව තෙල් මිල අඩුකරන ලෙසට පෙත්සම් අත්සන් ගැනීමේ ව්‍යාපාරයක්ද ආරම්භ වූ අතර කොළඹ කොටුවෙන් එහි පළමු පියවර තැබිණි. ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් විරෝධතා පෙත්සමට අත්සන් ගැනීම ආරම්භ වූයේ, විශාල ජන සහභාගිත්වයක් ඇතිවය. ජනතා විමුක්ති පෙරමුණේ ශක්තිය හා බලය කොතෙක් දැයි නැවත වරක් ජනතාව ඉදිරියේ ඔප්පු වෙමින් තිබේ. මේ සටන් වදින්නේ, ජනතා ජයග්‍රහණ වෙනුවෙනි. නියත වශයෙන්ම එම සටන් ජයග්‍රාහීව අවසන් වනු ඇත.

# සීනිපුර ගොවීන්ගේ තිත්ත අරගලයට ජ.වි.පෙ. සහය



කන්තලේ සීනිපුර ප්‍රදේශයේ ගොවි ජනතාව මුහුණ දී සිටින උග්‍ර ඉඩම් හිඟය ඇතුළු ප්‍රශ්න ගණනාවකට විසඳුම් ලබාගැනීමේ විවිධ ක්‍රියාමාර්ගවල ගොවීහු නිරත වී සිටියහ. එහෙත් මේ දක්වා ඔවුන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දුන් ආණ්ඩුවක් නොවීය. පසුගිය 14වැනිදා සීනිපුර ඒකාබද්ධ ගොවි සංවිධානය විසින් රැස්වීමක් කැඳවා තිබූ අතර ප්‍රධාන ආරාධිතයා ලෙස එයට සහභාගී වීමට විජිත හේරත් සහෝදරයාට ඇරයුම් කර තිබිණි. එම අවස්ථාවට සහභාගි වූ විජිත හේරත් සහෝදරයා ගොවීන් හමුවේ ප්‍රකාශ කළේ, පාර්ලිමේන්තුව තුළදීද ඉන් පිටතදීද ගොවීන්ගේ මෙම ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා සියලුම ආකාරයේ අරගලවලට නායකත්වය ලබාදෙන බවය.

# ගොවි විශ්‍රාම වැටුප වහා ලබාදෙනු



මේ වන විට නවතා දමා තිබෙන ගොවි විශ්‍රාම වැටුප යළි ලබාදෙන ලෙස සහ වී අස්වනුවලට ගෙවන අවම පාලන මිල රු. 40 දක්වා වැඩිකර වී මිල දී ගැනීමේ ක්‍රමවත් සැලැස්මක් වහාම සලසන ලෙස ආණ්ඩුවට බලකිරීමේ උද්ඝෝෂණ මාලාවක් සමස්ත ලංකා ගොවිජන සම්මේලනය ආරම්භ කළේය. එහි මුල් පියවර කේ.ඩී. ලාල් කාන්ත සහෝදරයාගේ මූලිකත්වයෙන් 11 වැනිදා අනුරාධපුරයේදී ආරම්භ කෙරිණ. නාමල් කරුණාරත්න සහෝදරයාගේ මූලිකත්වයෙන් 12 වැනිදා දඹුල්ලේදීද මාතලේ විල්ගමුව ප්‍රදේශයේදී 22 දාද මෙම උදසෝෂණ සාර්ථකව පවත්වන ලදී. මෙයින් මාතලේ විල්ගමුවේ පවත්වන ලද උද්ඝෝෂණයට ප්‍රාදේශීය දේශපාලන බලවතෙකු වන ලක්ෂ්මන් වසන්ත මන්ත්‍රීවරයාගේ මෙහෙයවීම යටතේ විල්ගමුව ප්‍රාදේශීය සභා සභාපති ඇතුළු මැරයේ බාධාකර පහර දීමට උත්සාහ කළහ. එහෙත් උද්ඝෝෂකයන් එයට සාර්ථකව මුහුණ දී උද්ඝෝෂණ ව්‍යාපාරය අවසන් කළේ, විශාල මහජන ප්‍රතිචාරයක්ද ලබාගනිමිනි.

# අධ්‍යාපනයේ පෙනෙන නොපෙනන අර්බුද




සමාජවාදී ශිෂ්‍ය සංගමය සංවිධානය කළ ''අධ්‍යාපනයේ පෙනෙන නොපෙනෙන අර්බුද' යන ප්‍රසිද්ධ දේශනය පෙබ. 09 වන දින කොළඹ මහජන පුස්තකාලයේදී පැවැත්විණි. මෙම දේශනය පවත්වනු ලැබුවේ, පක්ෂයේ දේශපාලන මණ්ඩල සභික අනුර දිසානායක සහෝදරයාය. විවිධ වෘත්තිකයන්, බුද්ධිමතුන්, දෙමාපියන් සහ ශිෂ්‍යයන් ඇතුළු විශාල පිරිසක් ඊට සහභාගි වී සිටියහ.

මෙම දේශනයේදී අනුර දිසානායක සහෝදරයා අවධාරණය කර සිටියේ, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගෙන් මෙරට ප්‍රභූ පංතියට පාලන බලය මාරුකරගැනීමේදී ස්වභාෂාවෙන් කටයුතු කළ හැකි නිලධාරීන් පිරිසක් නිර්මාණය කර ගැනීමේ අවශ්‍යතාව මත නිදහස් අධ්‍යාපනය හඳුන්වා දුන් බවයි. නමුත් 1970 දශකය වන විට මෙසේ අධ්‍යාපනය ලැබූ තරුණ තරුණියන් විශාල පිරිසක් විරැකියා පෝලිමට එක්වෙමින් සිටි බවත් එතැන් සිට ජන වාර්ගික ප්‍රමිතිකරණය, දිස්ත්‍රික් කෝටා ක්‍රමය ආදී වශයෙන් නිදහස් අධ්‍යාපන කප්පාදුව ඇරඹුනු බව ඔහු හෙළි කළේය. ඉන් පසුව 1978දී ආරම්භ කරන ලද නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිසංස්කරණවලට අනුව අධ්‍යාපනය වෙළඳ භාණ්ඩයක් කර විකිණීම ආරම්භ කළ බව පැහැදිලි කළේය. මේ වන විට අධ්‍යාපනයේ ප්‍රධාන ප්‍රශ්නය වී තිබෙන්නේ, ඒ වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොකිරීම සහ වෙන් කරන ප්‍රතිපාදන ජනප්‍රිය සහ එසේ නොවන පාසැල් අතර දැඩි විෂමතාවයකින් යුතුව බෙදා හැරීම බව ඔහු හෙළි කළේය.

# ගෙන් ගෙට ගොස් ජනතාව දැනුවත් කෙරේ

ඉන්ධන මිල ඉහළ දැමීමෙන් අලුත් අර්බුදයක් සමාජය මත පැටවෙද්දී ගෙයින් ගෙට ගොස් ජනතාව හමුවී අත් පත්‍රිකාවක් බෙදා රටේ පවතින ප්‍රශ්න පිළිබඳව සහ මහජනතාවට බලපා තිබෙන එම ප්‍රශ්නවල මුල් පිළිබඳව දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ජ.වි.පෙ. තීරණය කළේය. මහජන මුදල් නාස්තිය, දූෂණය, වංචාව හා ආණ්ඩුව-කම්කරු, ගොවි, ශිෂ්‍ය, තරුණ ප්‍රශ්න සහ ආණ්ඩුව-ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික ප්‍රශ්නය හා ආණ්ඩුව-අර්බුදය හමුවේ අපි යන තේමා ඔස්සේ ජනතාව දැනුවත් කිරීමේ පත්‍රිකාවක් බෙදා හැරිණි. 26 වන දින එහි ආරම්භක අවස්ථාව ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා සහ දේශපාලන මණ්ඩල සභික පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාගේ සහභාගිත්වයෙන් මහරගමදී ආරම්භ කෙරුණු අතර එයට සමගාමීව රටේ සියලු දිස්ත්‍රික්ක සහ නගර ආවරණය වන පරිදි පත්‍රිකා බෙදාහැරීම් සිදුකෙරිණි. මෙයට මහජනයාගෙන් ලැබුණේ, ඉතා උණුසුම් ප්‍රතිචාරයකි. පත්‍රිකා බෙදීමේ සහ ගෙයින් ගෙට යාමේ මෙම ව්‍යාපාරය මාර්තු මසය පුරා සිදු කරනු ඇත.



# හිතනවාද? හිතවනවාද?

තමන්ට වැළඳී ඇත්තේ, ඩෙංගු රෝගය යැයි දැන ගන්නා රෝගියාද ඥාතීහුද ඉමහත් භීතියට පත්වෙති. ඉන් පසුව අවශ්‍ය තරම් රසායනාගාර පරීක්ෂණද වෙනත් ඕනෑම දෙයක්ද කිරීමට ඔවුන් සූදානම්ය. රෝගියා මරණයට පත්නොවුණහොත් එය ඔහුගේ වාසනාවයි. මරණයට පත්වුව හොත් එය ඩෙංගු රෝගයේ ස්වභාවයයි. මක්නිසාද යත් ඩෙංගු රෝගය මාරාන්තික බැවිනි.

ඩෙංගු මාරාන්තික රෝගයක්ය යන්න පොදු සමාජ මතයයි. ආණ්ඩුවේ බලධරයින්ද සෞඛ්‍ය ක්ෂෙත්‍රයේ බලධරයින්ද ජනතාවගේ සෞඛ්‍ය ගැන අපමණ වෙහෙසෙන ජනමාධ්‍යයද විසින් ඩෙංගු මාරාන්තික රෝගයක් බවට තහවුරු කර ඇත.

එහෙත් එය එසේද?

ඩෙංගු රෝගය මාරාන්තික නම් ඩෙංගු වැළඳෙන සෑම රෝගියාම මිය නොයන්නේ ඇයි.

උණ සන්නිපාතයෙන්ද මිනිසුන් මිය යති. එහෙත් එය මාරාන්තික රෝගයක් නොවන්නේ ඇයි.

එසේ නම් මාරාන්තික රෝගයක් යනු කුමක්ද?

මාරාන්තික රෝගයක්නම් එම රෝගය වැළඳෙන සෑම රෝගියෙක්ම ඉන් අනිවාර්යයයෙන්ම මරණයට පත්විය යුතුය. එවැනි රෝග බොහෝ ගණනක් ලෝකයේ නැත. එසේම විද්‍යාවේ සහ තාක්ෂණයේ දියුණුව විසින් කලෙක මාරාන්තික රෝගයක් යැයි සැලකූ රෝගයත් පසු කලෙක එලෙස නොවන්නට පුළුවන.

උදාහරණයක් ලෙස ඒඩ්ස් හා ජලභීතිකාව යන රෝග මාරාන්තික වේ. එකී රෝග සඳහා තවමත් ප්‍රත්‍යක්ෂ ප්‍රතිකාරයන් සොයාගෙන නැත. එම රෝගයට ගොදුරු වන අය අනිවාර්යයෙන්ම එම රෝගය නිසාම මරණයට පත්වේ.

කලකට ඉහත ක්ෂය රෝගයද මාරාන්තික රෝගයක් ලෙස සැලකුවද එයට ප්‍රත්‍යක්ෂ ඖෂධ සොයාගැනීමෙන් පසු එය තවදුරටත් මාරාන්තික රෝගයක් ලෙස නොසැලකේ.

කරුණු මෙසේ තිබියදී ඩෙංගු මාරාන්තික යැයි අපි කවුරුත් විවාදයකින් තොරව පිළිග නිමු. ඩෙංගු මාරාන්තිකය යන වැරදි මතය සමාජ මතයක් ලෙස තහවුරු කර තිබේ. එය ප්‍රශ්න කිරීමට කිසිවෙකු ඉදිරිපත් නොවේ. අඩුතරමින් ඒ පිළිබඳ අවබෝධයක් සහිත අය වුවද ඒ සඳහා ඉදිරිපත් නොවෙති.

එහෙත් මෙම ක්‍රියාවලිය අහිංසක එකක් නොවේ.

එය මාරාන්තිකය. එම මතය තහවුරුවීම තුළ සිදුවන්නේ, අදාල රෝගය පැතිරීමට වගකිව යුතු මාරාන්තික නොවන රෝගයකින් අනවශ්‍ය ලෙස රෝගීන් මිය යෑමට වගකිව යුතු බලධරයින් එම වගකීමෙන් ගැලවීමයි.

මාරාන්තික නොවන රෝගයකින් අනවශ්‍ය ලෙස රෝගීන් මිය යද්දී ඊට වගකිව යුතු ආණ්ඩුවත් සෞඛ්‍ය බලධාරීනුත් නිදහස් වෙද්දී රෝගීන් මිය යන්නේ, ඩෙංගු මාරාන්තික නිසා යැයි ජනතාව හිත හදාගනිති.

එක් එක් පුද්ගලයා එකී වැරදි මතය විශ්වාස කරන්නේ මන්ද? දෛනික ජීවිතයේ සරල අත්දැකීම් මගින් එකී මතය පිළිබඳව තේරුම්ගත හැකිව තිබුණද ඔවුන් එය තේරුම් නොගන්නේ ඇයි?

එසේ වන්නේ, ජනතාව තමන්ම නොසිතන බැවිනි. ඔවුන් සිතන්නේ, ඔවුන්ට සිතීමට බලකරන ආකාරයටය.

''**මිනිසා මාලිගාවකදී සහ පැල්පතකදී වෙනස් ආකාරයෙන් කල්පනා කරයි.**'' යනුවෙන් වරෙක පෙයාර්බාර්ග් පැවසුවේ ඒ නිසාය.

පන්ති සහිත සමාජයක සමාජ විඥානයද පංතිමය වේ. එවන් සමාජයක සූරාකන පන්තියේ දෘෂ්ටිය මෙන්ම සූරාකෑමට භාජනය වන පන්තියේ දෘෂ්ටියද තිබීම අනිවාර්ය වන නමුත් හැම විටම දේශපාලන බලය හිමි පන්තියේ දෘෂ්ටිය අධිපති මතවාදය බවට පත්වේ.

'මාක්ස්වාදයේ මූලාශ්‍රයන් තුන සහ එකී සංයුක්ත කොටස් තුන' නමැති ලිපියේ දී ලෙනින් මෙසේ කියයි. ''දේශපාලනයේදී ජනතාව සැමදාමත් රැවටිල්ලට සහ ආත්ම රැවටිල්ලට අඥාන ලෙස ගොදුරුවී ඇත. එමෙන්ම, සියලුම සදාචාර, ආගමික දේශපාලන හා සමාජ වදන්, ප්‍රකාශයන් හා පොරොන්දු පිටුපස තිබෙන කිසියම් එක් හෝ අනෙක් පන්තියක වුවමනාවන් සොයා තෝරාගැනීමට ඔවුන් උගෙන ගන්නා තෙක්ම ඔවුන් එසේ තවදුරටත් රැවටෙනු ඇත.''

මැතිවරණයෙන් පසුව ඡන්දදායකයාට තමන් රැවටුන බව වැටහෙන්නට පටන් ගනී. ගමට පාර සාදා දෙන බවට දුන් පොරොන්දු හෝ තමන්ට රැකියාවක්, දරුවන්ට පාසලක්, රැකියාවට මාරුවීමක් හෝ වෙනත් ඕනෑම කරුණක් වෙනුවෙන් දුන් පොරොන්දු ඉටු නොවන වග ඔවුනට පෙනෙන්නට පටන් ගනී. බොරු පොරොන්දුවලට රැවටී තමන්ගේ 'අගනා' ඡන්දය පාවිච්චි කිරීම පිළිබඳ ඔවුන් පශ්චාත්තාප වීමට පටන් ගනී.

මැතිවරණයක් නොමැති කාල වකවානුවේදී ඡන්දදායකයින්ගේ පොදු මතය වන්නේ, දේශපාලනය යනු කිසිදු කමකට නැති, ජනතාව රවටනු ලබන රස්සාවක් ලෙසය. මෙතෙක් කල් තමන් දිගටම රැවටුන බවත් යළි කිසි දිනෙක එසේ රැවටීමට ලක්වීමට ඉඩ නොදෙනු ලබන බවටත් එවිට ඔවුහු ශපථ කරති. ගියවරද රැවටනු ලැබීම නිසා මීළඟ ගමන නම් ආණ්ඩු පක්ෂයේ කිසිවෙකුට තම ගමේ කිසිදු ඡන්දයක් ලබානොදෙන බවටත් අඩු කරමේ ගමට පැමිණීමට හෝ ඉඩ නොතබන බවටත් සහතික වෙති. පහත කවිය ඒ අදහස මැනවින් කැටිකර දක්වයි.

***තොප උපා***
***නම් එපා***
***විඳි අපා***
***දුක සැපා***

***පිටු නොපා***
***බැති පපා***
***කතිර පා***
***අප දපා***

***තොප එපා***
***තව එපා***
***අම්ම පා***
***බුදුන් පා***

***පපර පා***
***පපර පා***
***පපර පා***
***තව එපා***

(ඡන්දදායකයාගේ කවිය - කුමාර හෙට්ටිආරච්චි)

එහෙත් මැතිවරණය ප්‍රකාශයට පත්වීමත් සමගම තත්වය වෙනස් වේ. සමාජ විඥානය හසුරුවනු ලබන, සමාජ මනෝභාවයන් හසුරුවනු ලබන සියලු මෙවලම් එක විට ක්‍රියාත්මක වීමට පටන් ගනී. සමාජ විඥානය, සමාජ මනෝභාවය එකී මෙවලම්වල හිමිකාරිත්වය අත වන පදම් කරන ලද මැටි පිඩක් බවට පත්වේ. එවිට ඔවුන් රිසි සේ ඡන්ද දායකයාගේ මනෝභාවයන් හැසිරවීමට පටන් ගනී.

ඡන්ද කාලය තුළදී ඡන්දදායකයා මැතිවරණයට පෙර තිබූ මනෝභාවයන් ඉවතට තල්ලු කර දමනු ලබයි. ඔවුන් දේශපාලන පක්ෂයන්ගේ මනෝභාවය තුළ කොටු කර, ඒ සීමාව තුළ සිතීමට පොළඹවනු ලබන අතර දෛනික ජීවිතයේ අත්දැකීම් පදනම් කරගනිමින් කරගත යුතු සරල තර්කානුකූල සිතීම පවා ඔවුන්ගෙන් උදුරාගනී. ඉන් පසු කිසිදු හිරිකිතයකින් තොරව යළිත් වතාවක් ඔවුන් රැවටීමට භාජනය කරනු ලැබේ.

පහත කවිය විස්තර කරන්නේ ඉහත අත්දැකීමය.

***වැඩකාර මැස්සෝ***
***හාමතේ වැඩ කරත්***
***දහදියට මිශ්‍ර වූ රොන් සලත්***
***සුසුම් ලා - තටු සලා***
***මී වදය වායුසමනය කරත්***

***සුළු සේවක පිරිමි***
***කේලම් කියමිනා***
***රැජිණගේ කුටිය ළඟ ගැවසෙනා***
***වැඩකාර මැස්සන්ට අණ දෙනා***

(මීය සහ පැණි - රත්න ශ්‍රී විජේසිංහ)

ධනේශ්වර සූරාකෑම සජීවීව අත්දකින කම්කරු පන්තියට, ධනපති පන්තියට වෛර කිරීමේත් කෙලින්ම තමාට බලපාන ආර්ථික වුවමනාවන් සඳහා සටන් කිරීමේත් විඥානය ඇතිවේ. ඔවුහු වැඩිවන ජීවන වියදමට සාපේක්ෂව දිනෙන් දින අගයෙන් අඩුවන වැටුප් වැඩිකර ගැනීමේ සටනට නිරායාසයෙන් එළඹෙති. ඒ වෙනුවෙන් වෘත්තීය සමිති තුළ සංවිධානය වන ඔවුහු සාකච්ඡා, පෙත්සම්, විරෝධතා දැක්වීම, වැඩවර්ජන ආදී වූ විවිධාකාරයේ වෘත්තීය ක්‍රියාමාර්ගවලට එළඹෙති.

එහෙත් ඒ අතරම තම ශ්‍රේණියේ නොවන වෙනත් ශ්‍රේණියක කම්කරුවන්ට වැටුප් වැඩිවීමක් ලබාදීමට එරෙහි වන ආකාරයේ ශ්‍රේණි බේදයක් ඔවුන් තුළ ගැඹුරට කාවද්දා තිබේ.

තමන් මුහුණ පාන්නා වූ සූරාකෑමට, ජීවන වියදම ඉහළ යෑමට, වැටුපේ අගය අඩුවීමට තමා සේම එකම වෘත්තීයේ අනෙකුත් ශ්‍රේණීන්ද අනෙක් වෘත්තීන්වලද නියුතු සහෝදර කම්කරුවන්ද මුහුණ දෙන බව ඔවුහු හොඳාකාරවම දනිති. සිදුවිය යුත්තේ, සියලු ශ්‍රේණීන් සියලු වෘත්තීන් පොදු වැටුප් අරගලයක් කරා යාම වුවද එක් එක් ශ්‍රේණීන්ට සාපේක්ෂව, එක් එක් වෘත්තීන්ට සාපේක්ෂව වැටුප් අරගලය පිළිබඳ තීරණ ගැනීමේ මනෝභාවයන් තුළ කම්කරුවාව ගිල්වා තිබේ. එවිට තම ශ්‍රේණියේ නොවන වෙනත් ශ්‍රේණියක කම්කරුවන්ට වැටුප් වැඩිවීමක් ලබාදීමට එරෙහිව කටයුතු කිරීමටද කම්කරුවන් පොළඹවා ගැනීමට පුළුවන.

බොහෝ විට එය එසේම සිදුවේ. අවසානයේදී වැටුප් වැඩිකිරීමට එරෙහි මතයක් කම්කරුවන් මගින්ම සමාජගත වේ.

එය එතනින් නොනවතී. වැටුප අරගලයේ දිශානතියටද එය බලපායි. අරගලයේ ඉලක්කය වැටුප් වැඩිවීමක් දිනාගැනීමේ සිට තම ශ්‍රේණියේ නාමකරණයේ වෙනසක් (උදාහරණයක් ලෙස Technical Assistant - කාර්මික සහායක - Technical Officer - කාර්මික නිලධාරී - ලෙස නම් වෙනස් කරගැනීමක්) නැතහොත් නිල ඇඳුමේ පෙනුමේ හෝ හැඩයේ වෙනසක් කර ගැනීම දක්වා වෙනස් වේ. තම නිල ඇඳුමේ හැඩය වෙනස් කරගැනීමෙන් තම රැකියාවේ නාමකරණයේ වෙනසක් කර ගැනීමෙන් පමණක් කම්කරුවා සෑහීමකට පත්වේ.

කම්කරු පන්තියට වැටුප් දිනාගැනීමේ, අයිතීන් දිනාගැනීමේ සිය අරගලයේදී විවිධ ක්‍රියාමාර්ගවලට එළඹීමට සිදුවේ. ක්‍රියාමාර්ගය කුමක්ද යන්න තීරණය කරනුයේ, හුදෙක් කම්කරු පන්තිය විසින් නොව ඔවුන්ගේ සාධාරණ ඉල්ලීම් ලබාදීමට පාලකයන් දක්වන ප්‍රතිචාරයේ ස්වභාවයද විසිනි. සාකච්ඡා හෝ පෙත්සම් මගින් තම ඉල්ලීම් දිනාගැනීමට හැකිනම් ඊට අකමැත්තක් කම්කරුවා තුළ නොවේ. එහෙත් ධනපති පන්තිය බොහෝ විට එවැනි සරල ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර නොදක්වයි. එවිට අයිතීන් දිනාගැනීමේ සිය අරගලයේදී කම්කරු පන්තියට වැඩවර්ජන දක්වා යෑමට සිදුවේ. එය නොවැළැක්විය හැකි වේ.

දුම්රිය සේවකයාගේ වැඩවර්ජනයේදී දුම්රිය ගමනාගමනය නතර වේ. ඉන් පොදුවේ මගීන් අපහසුතාවයට පත්වේ. ඒ තුළ වරාය, තෙල්, ජල සම්පාදන, සෞඛ්‍ය හෝ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක සේවකයන්ද සිටිය හැක. එපමණක් නොව දුම්රිය සේවකයාත් ඔහුගේ පවුලේ අයත් ඉන් දුෂ්කරතාවයට පත්වේ. සෞඛ්‍ය සේවක වැඩවර්ජනයකදීද එසේම සිදුවේ. එවිට රෝහල්වල ක්‍රියාකාරිත්වය අඩපණ වේ. සෞඛ්‍ය සේවකයන් ඇතුළු සියලු වෘත්තීන්හි කම්කරුවන්ට එය බලපායි.

එහෙත් එය තේරුම් නොගන්නා සෞඛ්‍ය සේවයේ යෙදී සිටින සේවකයා දුම්රිය ගමනාගමනය ඇණ හිටීමෙන් තමන්ට සිදුවන අපහසුතාවයට දුම්රිය සේවකයාට බැනවදී. ජනතාව අපහසුතාවයට පත්කරමින් දුම්රිය වැඩවර්ජනයකට යෑමට ඔවුන්ට ඇත්තේ කුමන අයිතියක්ද යන්න ප්‍රශ්න කරයි. එහි අනෙකද සිදුවේ. සෞඛ්‍ය වැඩවර්ජනයකදී තමන් පත්වන අපහසුතාවය ගැන සිතන දුම්රිය සේවකයා රෝගීන් අනතුරට ලක්කරමින් සෞඛ්‍ය සේවකයාට වැඩවර්ජනය කිරීමට ඇත්තේ කුමන අයිතියක්දැයි ප්‍රශ්න කරයි. මේ අවස්ථා දෙකෙහිදීම ඔවුන් කටයුතු කර ඇත්තේ, තමන්ගේම වුවමනාවට අනුව නොවේ. සෞඛ්‍ය සේවකයාත් දුම්රිය සේවකයාත් තමන්ටම එරෙහිව කටයුතු කරමින් සිටිති. ඔවුහු වෙනත් වුවමනාවක එකී වුවමනාව විසින් හසුරුවනු ලබන මතයක අහිංසක ගොදුරක් බවට පත්ව සිටිති. එහෙත් එකී මතය අහිංසක නොවේ; එය සාහසිකය.

එම මතයෙන් තහවුරු වන්නේ කුමක්ද? කම්කරුවාට තම සාධාරණ ඉල්ලීම් දිනාගැනීම සඳහා වෘත්තීය ක්‍රියාමාර්ගයක් ගැනීමට අයිති නැති බවය. එලෙස ගනු ලබන වෘත්තීය ක්‍රියාමාර්ග ජනතාවගේ නාමයෙන් මර්දනය කිරීමට පාලකයන්ට අයිතියක් ඇති

15වැනි පිටුවට





''ආත්ම තෘප්තිය අධ්‍යයනයේ හතුරාය. අප ආත්ම තෘප්තියෙන් මිදෙන තුරු කිසිවක් ඇත්ත වශයෙන් ඉගෙන ගන්නට අපට බැරිය. අපේ ආකල්පය අප කෙරෙහි 'ඉගෙනීමෙහිලා අතෘප්තිකර වීමත්' අන්‍යයන් කෙරෙහි 'ඉගැන්වීමෙහිලා වෙහෙසට පත් නොවීමත්' විය යුතුය.

**මාවෝ සේතුං(තෝරාගත් ලිපි 130 පිටුව)**

# කලාව බිහිවූ අයුරු...

කලාව හෙවත් සෞන්දර්ය බිහිවූයේ මිනිසා බිහිවීමටත් පෙරද? නැතිනම් මිනිසා බිහිවූවාට බොහෝ කලකට පසුවද? එසේත් නැතිනම් කලාව මිනිසාට දෙවියන් දුන් දායාදයක්ද? කලාව පිළිබඳ කරන අධ්‍යයනයකදී මේ කරුණු නිරවුල් කර ගැනීම ඉතාම ප්‍රමුඛ හා වැදගත් වේ.

කලාව පිළිබඳ, කලා කෘති පිළිබඳ මේ වනවිට ලැබී ඇති සියලුම ඓතිහාසික සාක්ෂිවලට අනුව ඉපැරණිම හා ප්‍රාථමික කලා නිර්මාණවලින් හෙළිවන සත්‍යයට අනුව කලාව බිහිව ඇත්තේ, මිනිසා බිහිවීමට මොහොතකටවත් පෙර නොව මිනිසා බිහිවූවාට පසුවය. නැත. මිනිසා බිහිවී බොහෝ කාලයකට පසුවද නොව මිනිසා බිහිවීමත් සමගය. ලොව මෙතෙක් සොයාගෙන ඇති කලා කෘති ඒවා කොතරම් පැරණි වුවත් කොතරම් ප්‍රාථමික වුවත් ඒවා මිනිස් නිර්මාණයන්ය. සත්‍යය එයයි.

## මැවුම්වාදය බොරු කළ පරිණාමවාදය

මිනිසා ඇතුළු ලොව සියලු දේ දෙවියන්ගේ නිර්මාණයන් ලෙස පවසා විඥානවාදයේ කරවටක් ගිල්වා සිටි ජනතාව ඉන් මුදා ගැනීම සඳහා විශාල මෙහෙයක් කරන ලද්දේ, පරිණාමවාදය විසිනි. චාල්ස් ඩාවින් ඇතුළු පරිණාමවාදය විද්‍යාත්මකවත් ඓතිහාසික සාධක අනුවත් තාර්කිකවත් සනාථ කළ සියලු විද්වතුන් විසිනි. මිනිසා බිහිවූයේ, ජීව පරිණාමයේ එක් සංධිස්ථානයකදී වානර ප්‍රභේදයකින් බව තහවුරු කිරීමත් සමග මැවුම්වාදය හෙවත් විඥානවාදය විද්‍යාවේ ආලෝකය තවමත් ප්‍රබලව නොවැටුණු අඳුරු අහුමුළුවලට පසුබැස්සේ වේදනාවෙන් කෙඳිරි ගාමිනි. මිනිසා බිහිවූයේ, පරිණාමීය ක්‍රියාවලියක් ලෙස නම් කලාවද එම පරිණාමීය ක්‍රියාවලියේම ප්‍රතිඵලයක් බව පැහැදිලිය.

මිනිසා ලොව සියලු සතුන්ගෙන් වෙන්වන සාධක කිහිපයක් තිබේ. ඒවානම් ශ්‍රම හැකියාව, චින්තනය හා අදහස් හුවමාරු කරගැනීමේ භාෂාමය හැකියාවය. මෙම හැකියාවන්ද මිනිසා තුළ වර්ධනය වූයේ, ක්‍රමිකවය; ඒවා එකිනෙකාට සේවය කරමිනි. ශ්‍රම හැකියාව චින්තනයටද චින්තනය යළි ශ්‍රමයටද සන්නිවේදන (භාෂාවක් කථා කිරීමේ) හැකියාවට මේ දෙකම හා මේ දෙකටම සන්නිවේදනය ද සේවය කරමින් වර්ධනය විය. සෞන්දර්ය බිහිවූයේ, මෙකී මානව චින්තනය තුළ මිනිස් මොළයේ විශේෂ ගුණයක් ලෙසය. හැකියාවක් ලෙසය.

## මානව ශ්‍රමය හා කලාව

මානව ශ්‍රමය හා කලාව බැලූ බැල්මට එකිනෙකට සම්බන්ධ නැති ක්ෂේත්‍ර දෙකක් ලෙස පෙනී යා හැකිය. එහෙත් එය සත්‍යය නොවේ. මිනිස් ශ්‍රමය හා කලාව අතර ඇත්තේ, වෙන් කළ නොහැකි තරම් සමීප සම්බන්ධයකි. නිෂ්පාදන ක්‍රියාවලියක් මගින් යැපීමේ මාධ්‍යයන් නිපදවන ලොව එකම සත්වයා මිනිසාය. සොබාදහම (ප්‍රකෘතිය) විසින් නිර්මාණය කළ දේට වෙනස් කිසිවක් හෝ නිර්මාණය කර තිබේනම් ඒවා මිනිසාගේ නිර්මාණයන්ය, මිනිස් ශ්‍රමයේ නිර්මාණයන්ය. මානව කල්ප වානරයා මිනිසා බවට පත්වූයේ, රුක්මත සිට බිමට බැසීම නිසා දෑත් 'නිදහස්' වීමත් එම දෑත් ශ්‍රමයේ උපකරණ බවට පත්ව ඒවා නිෂ්පාදන උපකරණ බවට පත්වීමත් සමගය. අත ශ්‍රමයේ උපකරණය බවත් මිනිසා විසින් ශ්‍රමය බිහි කළා නොව ශ්‍රමය විසින් මිනිසා බිහි කළා යැයි පැවසීමට අපට හැකි බවත් එංගල්ස් පවසන්නේ, ඒ නිසාය. කලාව බිහිවීමේදී කටහඬට අමතරව කලාවේ උපකරණ වූයේද මිනිස් අතමය. මුගුරක් අතින් ගත් ආදි කල්පිත මානවයාගේ අනම්‍යශීලී, රළු අත හා ඇඟිලි තෙළිතුඩ හසුරුවන, පන්හිඳ හසුරුවන වීණාවක තත් පිරිමදින, රංගනයකදී චලනය වන නම්‍යශීලි ජංගමශීලී ලාලිත්‍යයෙන් හෙබි දෑත් හා ඇඟිලි බවට පරිවර්තනය වන්නේ, මෙකී පරිණාමීය ක්‍රියාවලිය තුළය. එබැවින් කලාව උපතේ සිටම මානව ශ්‍රමය හා නිෂ්පාදනය සමග බැඳී පවතී.

## කලාවේ ඓතිහාසික සාක්ෂිකරුවෝ

ශ්‍රම හැකියාවත් ඒ සමගම බිහිවූ චින්තනයත් විසින් මිනිසා සත්ව ලෝකයෙන් වෙන්ව 'මිනිසා' බවට පත්වන විට ඔහුගේ චින්තනය තුළ සෞන්දර්යාත්මක හැකියාවද බිහි විය. තමා අවට ලෝකය හෙවත් ප්‍රකෘතිය තම මනස තුළ සෞන්දර්යාත්මක ප්‍රතිරූප ලෙස පරාවර්තනය කර ගැනීමේ හැකියාව මෙන්ම එම සෞන්දර්යාත්මක ප්‍රතිරූප කුමන හෝ මාධ්‍යයක් මගින් අන් අයට සන්නිවේදනය කිරීමේ, ප්‍රකාශ කිරීමේ හැකියාවද මිනිසාගේ උපතේ සිටම ඔහු සතුවිය. අනෙක් අතට එලෙස තම අදහස් හා සංකල්ප ප්‍රකාශ කිරීමේ වුවමනාවක්ද ඇතිවය. ඒ, නිෂ්පාදන කාර්යය සඳහාය; නිෂ්පාදනයේ අත්දැකීම් එකිනෙකා හා බෙදාගැනීමේ, අන්‍යයන් වෙත සම්ප්‍රේෂණය කිරීමේ වුවමනාව නිසාය. ලොව ප්‍රථම කලා නිර්මාණ සියල්ලම සෘජු ලෙසම නිෂ්පාදන ක්‍රියාවලිය හා බැඳී පවතින්නේ ඒ අනුවය.

ප්‍රාථමික මිනිසාගේ මුල්ම නිෂ්පාදන ක්‍රියාවලිය වූයේ, දඩයමයි. එය එදා ඉතාම අත්‍යාවශ්‍ය මෙන්ම අසීරුම කාර්යයද විය. අනතුරුදායක කාර්යයක්ද විය. ප්‍රාථමික අවි (පොල්ල හා හෙල්ල) ඇතිව දඩයමේ ගිය මිනිසා දඩයමේදී තමා ලද අත්දැකීමත් එහිදී තමන්ට මුණගැසුණ සතුන් පිළිබඳවත් අන් අයට සන්නිවේදනය කිරීමට, එසේම දඩයමට පෙර ඒ සඳහා තම පිරිස දැනුවත් කිරීමට හා සංවිධානය කර ගැනීමට භාවිතා කළ සන්නිවේදන ක්‍රම මගින් කලාවේ ප්‍රාථමික ආරම්භක කෘති බිහිවී තිබෙන බව පෙනේ. ඉපැරණි ගුහා චිත්‍ර, කැටයම්, ගායන හා නැටුම් පිළිබඳ අධ්‍යනය කරද්දී මේ බව පැහැදිලි වේ.



ගිණිකොණ දිග ප්‍රංශයේ Lascauxහි පිහිටි වසර 17300 ක් පැරණි ගුහා සිතුවමක්

ස්පාඤ්ඤයේ අල්ටමීරා ප්‍රදේශයෙන් සොයාගත් වසර 12000ත් 25000ත් තරම් පැරණි යැයි තහවුරු කොට ඇති ගුහා චිත්‍රවල ඇති සත්ව රූප මීට ප්‍රබල නිදසුනකි. එසේම තවමත් ගෝත්‍රික සමාජ තුළ පවතින සතුන්ගේ ඉරියව් අනුගමනය කරන නැටුම් හා සතුන්ගේ හඬ අනුකරණය කරන ගායනා විසින්ද මෙය තහවුරු වේ.

## ද්‍රව්‍යමය නිෂ්පාදනයෙන් වෙන්කළ නොහැකි කලාව

වර්තමානයේ කලාව පෙනුමේදී ද්‍රව්‍යමය නිෂ්පාදනයට බාහිරින් තිබෙන බව පෙනුණද එසේ තබාගැනීමට ධනපති පන්තිය හා එයට ආවඩන 'කලාකරුවන්' උත්සාහ කළද ආරම්භයේ සිටම කලාව හා ද්‍රව්‍යමය නිෂ්පාදන අතර පැවතියේ එකිනෙකින් වෙන්කළ නොහැකි සම්බන්ධයකි. කලාව බිහිවූයේ මිනිසා තුළය. ප්‍රාථමික යුගයේ කලාකරුවන්' ලෙස විශේෂ පිරිසක් නොසිටි අතර සියලු දෙනා කලාකරුවෝ වූහ. එහිදී කලාවේ වස්තු විෂයන් වූයේ, නිෂ්පාදනය හා ඊට අදාල දේවල්ය. එසේම පසුකලෙක වුව කලාව සඳහා යොදා ගන්නා සියලු උපකරණද මිනිසාගේ නිෂ්පාදනයන්ම විය. උදාහරණ ලෙස ගත්විට පින්සල, තීන්ත හා කැන්වසයද, සියලු සංගීත භාණ්ඩද, පෑන්, පැන්සල් හා කඩදාසිද, සිනමාවට අයත් සියලු යන්ත්‍ර හා උපකරණද මිනිස් නිර්මාණයන්ය. ශ්‍රමයේ නිෂ්පාදනයන්ය. ඒවා නොමැතිව කිසිදු කලාකරුවෙකුට තම කලාව එළිදැක්වීමට නොහැක. එසේම කලා කෘති සඳහා වස්තු බීජ සපයන ලද්දේද මිනිසාය. වැඩ කරන ක්‍රියාකාරී වන මිනිසුන්ය. එපමණක් නොව 'කලා කෘති' වෙළඳ භාණ්ඩ බවට පත්ව තිබෙන විට ඒවා මිලදී ගන්නේ ජනතාවය. පොදුවේ ගත් විට කලා කරුවා ජීවත් කරවන්නේ වැඩ කරන ජනතාවය. කලාකරුවා යැපෙන්නේ, වැඩ කරන ජනතාවගේ ශ්‍රමයේ අතිරික්ත වටිනාකම්වලින් ලබා ගත් දෙයිනි. එබැවින් කලාව නිෂ්පාදන ක්‍රියාවලිය සමග ඇති සම්බන්ධයත්, කලාවේ සැබෑ හිමිකරුවා අන් කවරෙක්වත් නොව නිෂ්පාදනයේ යෙදෙන මිනිසා බවත් පැහැදිලිවම වටහා ගත යුතුය. පංති සමාජය තුළදී මිනිසා නිපදවූ සියල්ල පාලක පංතිය විසින් කොල්ලකෑවා සේ කලාවද එහි සැබෑ හිමිකරුවා වන වැඩකරන ජනතාවගෙන් කොල්ලකා තිබේ. කලාව එහි සැබෑ හිමිකරුවන් වෙනුවෙන් යෙදවීම අද දවසේ පැහැර හැරිය නොහැකි වගකීමක් වී ඇත්තේ, මේ නිසාය.

ආදි මානවයා දඩයමේදී තමාට මුණ ගැසුණු තමා දුටු සතුන් ගල් ගුහා බිත්ති මත 'සිතුවම් කිරීමෙන්' චිත්‍ර බිහි කළා සේම දඩයමට යාමට පෙර සාමූහික සූදානම පිණිස හෝ නැතිනම් දඩයමක් කරගෙන පැමිණ එහි සතුට භුක්ති විඳීම සඳහා හෝ ගිනිමැලයක් වටා රිද්මයට පා තබමින්, සතුන්ගේ ගමන් විලාස අනුකරණය කරමින් විවිධ ශබ්ද අනුකරණය කළ ක්‍රියාවලිය තුළ ප්‍රාථමික නැටුම් හා ගායනා බිහිවිය. මෑතකාලයේදී පවා අපට හමුවන නිෂ්පාදන ක්‍රියාවලිය හා බැඳුණු කවි, ගායනා, නැටුම් ආදිය විසින්ද නිෂ්පාදනය හා කලාව අතර අති සම්බන්ධය තහවුරු වේ.

## ජන කවියේ උදාහරණ

මේ සඳහා හොඳම උදාහරණ ලංකාවේ පුරාණ ජනකවියෙන් ගත හැකිය. එහිදී අපට හමුවන නෙළුම් කවි, පාරු කවි, කරත්ත කවි, පැල්කවි, ආදී සියල්ල නිෂ්පාදන ක්‍රියාවලිය තුළ මිනිසාගේ අත්දැකීම්, වේදනා හා ඔහු තුළ ජනිත වූ හැඟීම් ප්‍රකාශයට පත් කරමින් නිර්මාණය වූ ඒවාය. ලාංකේය ජනකවි තුළ ඉතාම ප්‍රකට මේ කවිවලින්ද එය සනාථ වේ.

**ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ**
**දුක්දෙන අලි ඇතුන් පන්නා හරින්නේ**
**රැක්මෙන දෙවියනේ වෙලබත් බුදින්නේ**
**දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ**

එම පැල් කවිය සේම මෙම කරත්ත කවියද ඊට නිදසුන්ය.

**කලු ගල් තලාලයි පාරට දමන්නේ**
**එම ගල් පෑගිලයි ගොන් කුර ගෙවෙන්නේ**
**ගොනා නොවෙයි හරකයි බර අදින්නේ**
**කිරිගල් පොත්ත කන්දයි අපි නගින්නේ**

ප්‍රාථමික සමාජයේ ප්‍රාථමික මිනිසාගේ ශ්‍රම ක්‍රියාකාරිත්වය සමග බිහිවී පැවැතීමට ආ ප්‍රාථමික කලාව පසු කලෙක විෂයක් බවට පත්විය. කලාව පොදු මිනිසාගෙන් ඉවත් කර 'කලාකරුවා' ගේ කාර්යයක් බවට පත්කරන ලදී. ඒ සඳහා 'කලාකරුවන්' ලෙස විශේෂ පිරිසක්ද බිහිවිය. එය සිදුවූයේ, මානව සමාජය පංති සමාජයට පා තැබීමත් සමගය. ඒ පිළිබඳව ඊළඟට කතා කරමු.

# සංදර්ශන ආර්ථිකයේ ගමනක අවසානය

පසුගිය ඉරිදා එක් පුවත්පතක මහ බැංකුව පලකළ දැන්වීමක සටහන් වූයේ මෙසේය,

**''මහජනයා වෙත කෙරෙන නිවේදනයයි! මතකයේ තබා ගත යුතු කරුණු!, බැංකු ව්‍යාපාරික කටයුතුවල මනා පැවැත්ම වර්ධනය කිරීමත් එමගින් තැන්පතුවල සුරක්ෂිතතාවය තහවුරු කිරීමත් උදෙසා ඉහත නම් සඳහන් ආයතන අධීක්ෂණය කිරීමේ බලතල මහා බැංකුව වෙත පැවරී ඇත. එහෙත් එම ආයතනවල ඇති තැන්පතු සඳහා වගකීමට හෝ එම ආයතන කිසිදු දිනෙක බිඳ නොවැටෙන බවට සහතික කිරීමට හෝ නීතිමය බලයක් මහ බැංකුවට නොමැත. කෙසේ වෙතත්, අධීක්ෂණයට යටත් බැංකුවක් හෝ මුදල් සමාගමක් බිඳවැටුණහොත් එක් තැන්පත්කරුවෙකුට රු. දෙලක්ෂයක උපරිමයකට යටත්ව තැන්පතු ආපසු ගෙවීම සඳහා මහ බැංකුව විසින් 2012 ජනවාරි 01 සිට තැන්පතු රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇත.''**

මෙම දස්කමේ වැදගත්ම කොටස වන්නේ, මහ බැංකුවේ ලියාපදිංචි වුවද මූල්‍ය සමාගම් කිසිදු දිනෙක බිඳ නොවැටෙන බවට සහතික තමන්ට දිය නොහැකි යැයි මහ බැංකුව කරන අවධාරණයයි. එය අමුතුවෙන් අවධාරණය කළයුතු නැති සත්‍යයකි. ප්‍රශ්නය වන්නේ, එසේ බිඳ නොවැටෙන්නේය යැයි සහතික කරන ලෙස කිසිවෙකුත් මහ බැංකුවෙන් ඉල්ලීමක් නොකරද්දී එවැනි දැන්වීමක් පළ කිරීමේ අවශ්‍යතාවයයි. එය හොරාට කලින් කෙසෙල් කැන වැට පැනීමේ වර්ගයේ දැන්වීමකි. එම දැන්වීම මගින් මහ බැංකුව එක් සහතිකයක් දී ඇත. ඒ, මූල්‍ය සමාගම් බිඳවැටෙන විට තැන්පත්කරුවන්ට වන්දියක් ගෙවන බවයි. වෙනත් විදියකින් ළඟදීම ලංකාවේ මූල්‍ය සමාගම් බිඳවැටීමේ අර්බුදයකට ලක්වනු ඇති බවට 'බැංකුවල බැංකුව' වන මහ බැංකුව විසින් කරන පිළිගැනීමයි.



අලුත බිහි වූ ප්‍රාග්ධනය හිස සිට දෙපතුල දක්වාත් සෑම රෝම කූපයක්ම දක්වාත් ලෙයින් හා කුණු කසලින් පිරී පවතී.

**කාල් මාක්ස්**

මෙම දැන්වීම දැනටමත් විදුලි බිලේ වේගයෙන් හා තෙල් මිලේ වේගයෙන් ලංකාවද බිඳවැටෙන ආර්ථිකයක් සහිත රටක් බවට කියාපාන හොඳම නිදර්ශනයකි. ආණ්ඩුව දැයට කිරුළ සමරන්නේ, මෙවැනි කඩාවැටෙන අර්බුදයක් ආර්ථිකය තුළ පවතිද්දීය. අධිවේගය විවෘත කළේ, බෙරකරුවන් දහසක් නටා ගයාය. කරදියවර මංගල්‍යය පැවැත්වූයේ හම්බන්තොට සැණකෙළි සිරි ගන්වාය. තවත් එවැනි සංදර්ශන රැසක් මෙම සංදර්ශන ආණ්ඩුව සිදුකර ඇත. දැනටත් සිදුකරමින් පවතී. ඒ රෝමය ගිණි ගනිද්දී නීරෝ වීනා වැයීම සිහිගන්වමිනි.

## රුපියලෙන් ආර්ථිකය බාල්දු කිරීම

සංදර්ශන ආර්ථිකයෙන් සිදුකළ පිම්බීම පුපුරා ජනතාවගේ දෑස් ඉදිරිපිටම රාජපක්ෂ පාලනයේ බහින කලාව දැන් ඇරඹී ඇත. එකවරම ඉන්ධන මිල ඉහළ දැමීමත් සමඟ අර්බුදයේ සැරව ගලමින් සමාජය පුරා ගලා ගියද කුණු වූ ආර්ථිකයේ තුවාලය ගඳ ගසන්නට පටන් ගත්තේ බොහෝ කලකට පෙරදීය. 2012 අයවැය මගින්ද ඩොලරයට සාපේක්ෂව රුපියල 3%කින් අවප්‍රමාණය කිරීමට තමන්ට සිදුවන බව රාජපක්ෂ ජනාධිපතිවරයා පැවසූයේ, අර්බුදයේ අනාවැකි ලෙසටය. ඒ එදා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට තම විශ්වාසවන්තභාවය තහවුරු කිරීම සඳහාය. ජනාධිපතිවරයා ඇතුළු ඇමතිවරු සංදර්ශන මගින් ජනතාව මෝහනයට පත් කළද ආර්ථිකය මෙහෙයවීමට අසාර්ථක උත්සාහයක් දරන ආර්ථික උපදේශකයින් වර්තමානයේ මුහුණ දෙන ආර්ථික අර්බුදය කල් තියා දැනසිටි බව පැහැදිලිය. ඒ නිසාම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිහිට නොලබා තවත් ඉදිරියට යා නොහැකි බවට ඔවුන්ට තක්සේරුවක් පැවතිණි. ඒ නිසාම මූල්‍ය අරමුදල ලංකාවට ලබාදීමට එකඟ වූ ඩොලර් බිලියන 2.6න් (ඩොලර් කෝටි 260)අවසාන ණය වාරිකය වූ ඩොලර් මිලියන 800(කෝටි 80) කෙසේ හෝ ලබාගතයුතු බව ඔවුහු දැන සිටියහ.

එසේ අවසාන ණය වාරිකය අත්‍යවශ්‍ය බව දැන දැනම මහ බැංකුවේ අධිපති අජිත් නිවාඞ් කබ්රාල් ප්‍රකාශ කළේ, ආර්ථිකය හොඳ මට්ටමේ පවතින බැවින් අවසාන ණය වාරිකය ලබාගැනීම අනවශ්‍ය බවයි. නමුත් එසේ කියා දින කිහිපයක් යාමට පෙර මූල්‍ය අරමුදලේ කොන්දේසි පිළිගෙන ණය වාරිකය ලබාගැනීමට ආණ්ඩුවට සිදුවිය. ලංකාවට අවසාන ණය වාරිකය ලබාගැනීම ගැටලුවක් වූයේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉදිරිපත් කළ කොන්දේසි එලෙසින්ම ක්‍රියාත්මක කිරීම කල් දැමීම නිසාය. මූල්‍ය අරමුදල තරයේම සිටි ස්ථාවරය වූයේ, ණය වාරිකය නිදහස් කිරීමට නම් රුපියල පා වීමට ඉඩ හැරිය යුතු බවයි. එම කොන්දේසියේ මූල්‍ය අරමුදල තදින්ම සිටීමේ ප්‍රතිඵලය වූයේ, 2012.02.08 දින සිට රුපියල පා වීමට ඉඩහැර රාජපක්ෂ පාලනය මූල්‍ය අරමුදල හමුවේ යටත් වීමයි. එසේ යටත් වී රුපියල බාල්දු කිරීමෙන් සතියක් තුළ රුපියල ඩොලරයට රුපියල් 123ක් දක්වා කඩා වැටුණි. ආර්ථික විශ්ලේෂකයින්ගේ මතය වන්නේ රුපියල ඩොලරයට රුපියල් 130ක් දක්වාම බාල්දු වීමට ඉඩ ඇති බවයි. ඉන් ඉදිරියටත් රුපියල බාල්දු වුවහොත් ලංකාවේ ආර්ථිකයේ පැවැත්ම ඉතාම අනතුරුදායක වීම වැළැක්විය නොහැකිය.

### බාල්දුවේ ප්‍රතිඵල

රුපියල අවප්‍රමාණයත් සමඟම ඒ හා බැඳුණු ආර්ථික අර්බුද රැසකට දැන් ලංකාවට මුහුණ දීමට සිදුවේ. පළමු ප්‍රතිඵලය වූයේ, ලංකාව විසින් ලබාගෙන ඇති ඩොලර් ණය ප්‍රමාණයට අදාලව ගෙවිය යුතු රුපියල් වටිනාකම ප්‍රමාණයෙන් සීඝ්‍රයෙන් ඉහළ යාමයි. එය බාල්දුවේ ප්‍රතිඵල නිසා සිදුවන බිලියන ගණනක පාඩුවකි. එසේම රුපියල බාල්දු කිරීමත් සමඟම ආනයන වියදම්ද අසීමිත ලෙස ඉහළ යාම වැළැක්විය නොහැකිය. ලංකාව ඇඟළුම්වලින් අපනයන ආදායමක් ඉපයුවද එම ඇඟළුම් නිෂ්පාදනවලින් 80%ක්ම පිටරටින් ගෙන්වන අමුද්‍රව්‍යවලින් නිපදවන නිසා එම අමුද්‍රව්‍ය සඳහා වන ආනයන වියදම් ඉහළ යාමෙන් අපනයන ලෙස ලබන ආදායම මෙන් දෙගුණයක් ආනයන වියදම් දැරීමට සිදුවේ. මෙය තවත් වටයක වෙළඳ ශේෂ අර්බුදයකටත් ගෙවුම් ශේෂ අර්බුදයකටත් මුල පුරන්නේය. එක් අර්බුදයකට සොයන විසඳුම් තවත් අර්බුද රැසකට හේතුව වන්නේ එලෙසය.



ආනයන සීමා කරන ලෙසත් පාඩු ලබන රාජ්‍ය ආයතන කුමන ක්‍රමයකට හෝ ලාභ තත්වයකට පත්කරන ලෙසත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ආණ්ඩුවට කොන්දේසි පනවා යටත් කර ඇති බව පැහැදිලි වන්නේ අත්‍යාවශ්‍ය භාණ්ඩවල හා සේවාවල මිල ඉහළ දැමීමේ වේගයෙන්ය. මූල්‍ය අරමුදලේ අවසාන ණය වාරිකය ලද විගසින්ම ඉන්ධන මිල මෙතරම් ශීඝ්‍ර ලෙස ඉහළ දැමීමට එම කොන්දේසිද බලපා ඇත.

### විදේශ සංචිත පහළට

2011 ජූලි මාසය වන විට ඩොලර් කෝටි 809.8ක් වූ විදේශ වත්කම් සංචිතය 2011 නොවැම්බරයේදී ඩොලර් කෝටි 620.1 ක් දක්වා පහත වැටී ඇත. නමුත් මෙම විදේශ වත්කම් තුළ ඇති විදේශ ණය ප්‍රමාණයන් ඉවත් කළහොත් සත්‍ය ලෙස ඇති විදේශ වත්කම් ප්‍රමාණය මීටත් වඩා විශාල ලෙස අඩුවන බව පැහැදිලිය. එසේම 2011 නොවැම්බර් වන විට වෙළඳ ශේෂයේ හිඟය දෙගුණ වී එය ප්‍රතිශතයක් ලෙස 133.3% ක පරතරයක් ගෙන ඇත. එය 2010දී ඩොලර් කෝටි 411ක් වූ අතර 2011 වන විට ඩොලර් කෝටි 880ක් දක්වා වැඩිවිය.

මෙසේ අර්බුදයට පත් ආර්ථිකය යළි යථා තත්වයට පත්වීමට නම් පැලැස්තර විසඳුම් නොව ස්ථිරසාර නිෂ්පාදනය සහ ආර්ථිකය ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ගයන් අවශ්‍යය. නමුත් ආණ්ඩුවේ නාස්තිකාර වියදම් මෙන්ම ජනතාවටද හුරුකර ඇති ධනේශ්වර පාරිභෝගික රටාව විසින් සිදු කරන්නේ, තව දුරටත් ආර්ථිකයේ මූල්‍ය ශක්තිය පහත වැටීමයි.

### ණය උගුලේ හිරවීම

තාවකාලික පැලැස්තර විසඳුම සඳහා හෝ ආණ්ඩුවට සිදුව ඇත්තේ, අහිතකරම කොන්දේසි යටතේ වුවද යළිත් ණය ලබාගැනීමට පමණි. මෙම වසර අවසාන වන විට රාජපක්ෂ පාලනය මේ අර්බුදය මෙසේ පවතිද්දීම අඩු තරමේ ඩොලර් මිලියන 600ක වත් අමතර මුදල් සපයා ගත යුතුය. මාර්තු සහ ජූනි මාසයේ කල් පිරෙන සංවර්ධන බැඳුම්කර යළි පියවීම සඳහා ඩොලර් මිලියන 317ක් සපයා ගැනීමත් අගෝස්තු හා නොවැම්බර් කල් පිරෙන විදේශ බැංකු ඒකකයේ (OBU) ණය පියවීමත් සඳහා තවත් ඩොලර් මිලියන 150ක් ආණ්ඩුවට අවශ්‍යය. එසේම නොපියවා ඇති සංවර්ධන බැඳුම්කර හා වෙනත් මූල්‍ය හිඟයන් පියවීමට තවත් ඩොලර් කෝටි 13.3ක් අවශ්‍යය. HSBC බැංකුවෙන් ඉහළ පොලියට ලබාගෙන ඇති ඩොලර් මිලියන 500 ණය පියවීමට සිදුව ඇත්තේද මේ වසරේදීය. මේ සියල්ල සඳහා ආණ්ඩුවට නැවත ණය ගැනීමට සිදුවීම වැළැක්විය නොහැකි අතර පසුගිය දා ණය හා පොළිය ගෙවීම සඳහා ඩො.මි. 600ක ණය ගැනීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය දී තිබේ. මේ සියල්ල ආණ්ඩුවේ දෛනික කටයුතු සහ සංදර්ශන වියදම්වලට අමතරව දැරීමට සිදුවන අනිවාර්යය අභියෝගයන්ය.

මීට අමතරව රාජ්‍ය ආයතන බොහෝමයක් මේ වන විට පවත්වාගෙන යන්නේ, ණය මතය. රාජ්‍ය ආයතන සඳහා ණය දීමටම රාජ්‍ය බැංකුවල ණය සීමාව රුපියල් බිලියන 64 සිට බිලියන 180ක් දක්වා ඉහළ දමා ඇත. එසේම පෞද්ගලික අංශයේ බැංකු විසින් ණය දීම මේ වන විට සීමා කර ඇත. තෙල් සංස්ථාව තෙල් ලබාගැනීමට නම් තවත් ඩොලර් මිලියන 800ක් වැයකළ යුතු අතර ඒ සඳහාම පමණක් තෙල් සංස්ථාව පමණක් රාජ්‍ය බැංකු මගින් ඩොලර් බිලියනයක ණය ගැනීමට අපේක්ෂිතය. අවසානයේදී එම ණය බරද ගෙවිය යුතු වන්නේ, දැනටමත් ඉන්ධන මිලෙන් පීඩාවට පත්වන මහජනතාව විසින්මය. තෙල් මිල ඉහළ යාම නිසා පමණක් ධීවර කාර්මිකයාගේ වියදම 50%කින් ඉහළ ගොස් ඇත. ධීවර ජනතාව ජීවත් වීම වෙනුවට මරණයට මුහුණ දීමට හෝ සටන් වැදීම තෝරාගෙන ඇත්තේ ඒ නිසාවෙන්ය.

### අවසානයේ ආරම්භය

ලෝක ආර්ථිකයේද පවතින පුම්බන ලද මූල්‍ය වෙළඳපොළ කඩා වැටීමේ අර්බුදය අද වන විට ආර්ථික, දේශපාලන මෙන්ම සමාජ අර්බුදයක් දක්වා වර්ධනය වී ඇත. ග්‍රීසිය, යුරෝපය, අරාබිකරය හා අප්‍රිකාව හරහා අලුත් සටන් බිම් බිහිකරමින් සුළඟේ වේගයටත් වඩා වේගයෙන් පැතිරෙන්නේ ධනවාදයේ ඒ අර්බුදයයි. 2009න් පසුව අධිරාජ්‍යවාදී රටවල් තම රජයේ මුදල් යෙදවීමෙන්වත් ගොඩගත නොහැකි මට්ටමට ධනේශ්වර ආර්ථිකයේ අර්බුදය, ක්‍රමයේ අර්බුදයක් බවට පත්වී ඇති බව දැන් තහවුරු වී හමාරය. ලංකාවේ දුර්වල ධනපති ආණ්ඩුවද තාවකාලික හෝ ගැලවීමක් නොමැතිව දැන් මුහුණ දී ඇත්තේ එවැනිම බරපතළ මූල්‍ය අර්බුදයකටය. ජනතා උදසෝෂණ වර්ධනය වන අතරේම ජීවන බර අත්‍යාවශ්‍ය බඩු මිල, සේවා මිල ඉහළ යන්නේද ඒ අර්බුදයේම ප්‍රකාශනය ලෙසටය. ඒ නිසා තවදුරටත් සංදර්ශනවලින් ජනතාව රවටා පාලනය පවත්වා ගෙන යා නොහැකි අර්බුදයකට ධනපති ආණ්ඩුව පත්ව ඇත. ඒ අතරේම අර්බුදයෙන් ගැලවීමට නිෂ්පාදනය වැඩි කළ යුතු යැයි ආණ්ඩුව ඇතුළෙන්ම නැගෙන කෙඳිරිලිද දැන් දැන් ඇසෙමින් තිබේ. ඒවා අශ්වයා පැන ගිය පසු ඉස්තාලය වසන පන්නයේ යෝජනාය. දැන් රටේ ජනතාවට ඉතිරිව ඇත්තේ, තව දුරටත් රැවටීමට, මුලාවට ලක් නොවී මේ නාස්තිකාර පාලනයත් එම පාලනය ආරක්ෂා කරන වැරදි සමාජ ක්‍රමයත් පළවා හැර නිෂ්පාදනයේ ප්‍රතිලාභ සාධාරණ ලෙස ජනතාව අතර බෙදාහරින නව සමාජ ක්‍රමයකට පිවිසීමයි. වර්තමාන අභියෝගය විසින්ම නව මගකට පිවිසීමේ අවශ්‍යතාවයද ජනතාවට පෙන්වා දී තිබේ.

# රාජ්‍යය ගුප්ත වස්තුවක්ද?

පසුගිය කලාපයෙන් රාජ්‍ය සම්භවය පිළිබඳව දේවවරම්වාදය, බලවාදය ආදී මත මෙන්ම සමාජ සම්මුතිවාදය ඉදිරිපත් කළ ප්‍රධාන තිදෙනාගෙන් එක් අයෙකු පිළිබඳවද සාකච්ඡා කරන ලදී. ඉතිරි දෙදෙනා ගැන මෙන්ම රාජ්‍යයේ උපත පිළිබඳව තවත් මත කිහිපයක් සම්බන්ධයෙන් මෙවර අප අවධානය යොමු කරමු.

**ජෝන් ලොක් (1632-1704)**

නීතිඥයෙකුගේ පුතෙකු වූ ලොක් එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා පසු කලෙක වෛද්‍ය වෘත්තියේ නිරත විය. 1672 දී එංගලන්තයේ ෂාන්ටබරි සාමිවරයාගේ ලේකම් වශයෙන් කටයුතු කිරීම නිසා දේශපාලන අත්දැකීම් රාශියක් ඔහුට ලබාගැනීමට හැකිවිය. ලොක්ට තම මතවාදය ඉදිරිපත් කිරීමට හේතුවූ ඓතිහාසික වටපිටාව පිළිබඳව මදක් අවධානය යොමු කරමු. 1649 දී I වන චාල්ස් රජු ඝාතනය කිරීමෙන් බලයට පත්වූ පාර්ලිමේන්තුවාදියෙකු වූ ඔලිවර් ක්‍රොම්වෙල් 1658 දී ඔහු මිය යන තෙක්ම පොදු රාජ්‍ය මණ්ඩලය නමින් අලුත් ආණ්ඩු ක්‍රමයක් යටතේ ඒකාධිපති පාලනයක් ගෙන ගියේය. ඔහු මිය යැමත් සමග නැවතත් රාජාණ්ඩු ක්‍රමය ප්‍රතිස්ථාපිත කෙරුණු අතර පාර්ලිමේන්තුවාදීන්ගේ ආරාධනයෙන් I චාල්ස් රජුගේ පුත් II චාල්ස් රජකමට පත්විය. මෙහුගේ අත්තනෝමතික ක්‍රියාකලාපය හේතුවෙන් නිතර නිතර පාර්ලිමේන්තුව හා ජනතාව සමග ද ගැටුම් ඇති විය. උග්‍ර කතෝලික භක්තිකයෙකු වූ චාල්ස්, පියුටරින්වාදීන් ඔවුන් දුරු තනතුරුවලින් පහකොට කතෝලිකයන් එම තනතුර සඳහා පත් කරන ලදී. එසේම තම විරුද්ධවාදීන්ට නොයෙකුත් චෝදනා එල්ල කරමින් නඩු විභාගයකින් තොරව සිරබාරයට ගැනීමටද ඔහු කටයුතු කළේය. රජුගේ මෙම අත්තනෝමතික ක්‍රියාවලියට බලපෑම් කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් නඩු විභාගයකින් තොරව තමන්ව සිරබාරයට ගැනීම පිළිබඳව කිසියම්ම පුද්ගලයෙකුට උසාවියක් ඉදිරියේ කරුණු විමසා සිටීමට අවසර ලබාදෙන ''හබයාස් කෝපුස්'' පනත සම්මත කර ගන්නා ලදී. II චාල්ස් රජුගෙන් පසු ඔහුගේ සොයුරු II ජේම්ස් සිංහාසනාරූඪ විය. මොහුගේ කෙටි කාලීන පාලන කාලය තුළදීද නිතර නිතර පාර්ලිමේන්තුව හා ගැටුම් පැවතිණි. මෙම ගැටුම් උච්ඡ අවස්ථාවට පැමිණියේ, 1688 වසරේදීය. එනම් ඔහුගේ පුත්‍රයා කතෝලිකයෙකු වශයෙන් බෞතීස්ම කිරීමත් සමගය. මේ සිදුවීමත් සමග ඕලන්දයේ විලියම් කුමාරයා හා විවාහ වී සිටි දෙවන චාල්ස් රජුගේ දියණිය වූ ප්‍රොතෙස්තන්ත්‍ර භක්තික මේරි කුමරියට සිහසුන බාරගන්නා ලෙස පාර්ලිමේන්තුව විසින් ආරාධනා කරන ලදී. විලියම් හා මේරි කුමරිය පාර්ලිමේන්තුවේ ආරාධනාව පිළිගෙන පැමිණීමත් සමග දෙවන ජේම්ස් රජු සිහසුන අතහැර පලාගියේය.



1688 දී විලියම් කුමරු එංගලන්තයට ගොඩ බසින ආකාරය

බැලූ බැල්මට මෙම සිදුවීම කතෝලික භක්තිකයන්ට එරෙහි ප්‍රොතෙස්තන්ත්‍ර භක්තිකයන්ගේ ගැටුමක් ලෙස පෙනී ගියද ඇත්තෙන්ම මෙය අභ්‍යන්තරයේ පැවතුණේ, බිඳ වැටෙමින් පවතින වැඩවසම් ක්‍රමයේ සහ නැගී එන ධනපති ක්‍රමය අතර ගැටුමයි. නැගී එන ධනවාදී අර්ථ ක්‍රමයට අවශ්‍ය මතවාදී පසුබිම ප්‍රොතෙස්තන්ත්‍ර ආගමික අදහස් මගින් තෘප්ත විය. 1688 දී වූ මේ සිද්ධිය එංගලන්ත විප්ලවය නොහොත් එංගලන්තයේ ධනේශ්වර විප්ලවය ලෙස සැලකේ. ඉන්පසු 1889 දී අයිතිවාසිකම් පනත සම්මත කර ගනිමින් රජු හා රැජිණගේ බලය පාර්ලිමේන්තුවේ පාලනයට යටත් කරනු ලැබීය. එංගලන්තය තුළ සිදුවූ මෙම සිදුවීම්වලට අදාල මතවාදී දායකත්වය ලොක් මගින් සිදුවිය.

මේ සඳහා ඔහු තම මතවාදය ගොඩනැගූ ආකාරය පිළිබඳව මදක් විමසා බලමු. සමාජ සම්මුතිවාදය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ අයෙකු වූ තෝමස් හෝබ්ස්ට අනුව ප්‍රකෘති සමාජය යනු කෲර, අධම, කාලකණ්ණි සහ අවුල් වියවුල්වලින් පිරි එකක් වුවත් ලොක්ට අනුව නම් ඉතාම සාමකාමී එකකි. එනිසා සෑම මිනිසෙකුටම ජීවත් වීමේ අයිතිය දේපළ අයිතිය හා පෞද්ගලික නිදහස ස්වභාවික නීතිය යටතේ තහවුරු කොට තිබී ඇත. නමුත් ස්වභාවික නීතිය ක්‍රියාවට නංවන පාලන ක්‍රමයක් මෙන්ම නීතියේ විනිශ්චය කිරීමට විනිසුරුවන්ද නොසිටි හෙයින් සෑම මිනිසෙකුම විටෙක විනිසුරුවරයෙකු මෙන්ම විටෙක විධායකයෙකු විය. මෙය සමාජයේ අනාරක්ෂිත තත්වයට හේතු වුණි. මෙම අනාරක්ෂිත තත්වයෙන් මිදීමට ජනතාවට සම්මුතියක් අවශ්‍යව තිබී ඇත. රාජ්‍ය සංවිධානය කරගැනීම හා සිවිල් ආණ්ඩු පිහිටුවා ගැනීම සම්මුතීන් දෙකක් අනුව සිදුව තිබේ. පළමුව ජනතාව අතර ඇතිවන සම්මුතියක් මගින් සිවිල් සමාජය පිහිටුවාගෙන පාලකයෙකු තෝරා ගනී. දෙවන සම්මුතියෙන් පාලකයාට බලය පවරා දේ. එසේම පාලකයාද සම්මුතියෙහි කොටස්කරුවෙකු බැවින් ඔහු පාලනය පිළිබඳව ජනතාවට වගකිව යුතුය. වැඩිදුරටත් ලොක් සඳහන් කරන අන්දමට ජනතාව බුක්ති විඳිමින් සිටි සියලු අයිතිවාසිකම් පාලකයාට පවරා නොදෙන අතර පුරවැසියන්ගේ ජීවිත, දේපළ හා නිදහස යන කරුණු තුන සඳහා නීති පැනවීමට පමණක් පාලකයාට බලය පවරා දී ඇත. තවද පාලකයා පනවන නීති මගින් ජනතා අභිමතය පිළිඹිබු විය යුතු අතරම එසේ නොවන අවස්ථාවලදී පාලකයාට එරෙහි වීමට ජනතාවට අයිතියක් ඇත. එහෙත් හොබ්ස්ට අනුව නම් පාලකයා සම්මුතියෙහි කොටස්කරුවෙකු නොවන නිසා පාලකයා කෙතරම් අත්තනෝමතික වුවත් පාලකයාට එරෙහි වීමට ජනතාවට අයිතියක් නොමැත.

ලොක් හඳුන්වාදෙන සිවිල් ආණ්ඩු ව්‍යුහය ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය යන අංග තුනෙන් සමන්විත වේ. අධිකරණය ව්‍යවස්ථාවෙන් හා විධායකයෙන් ස්වාධීනව පැවතිය යුතු අතරම ව්‍යවස්ථාදායකයට යටත්ව විධායකය ක්‍රියාත්මක විය යුතුය. එසේම ව්‍යවස්ථාදායකය ජනතාවට වගකිව යුතුය. එනම් ව්‍යවස්ථානුකූල සීමිත බලයක් සහිත රාජාණ්ඩුවක් වෙනුවෙන් ලොක් සමාජ සම්මුතිවාදය යොදා ගත් බව පැහැදිලි වේ.

සිවිල් ආණ්ඩුව (Civil Government) කෘතිය මගින් ලොක් මෙම අදහස් ගෙනහැර දක්වා ඇත. පාර්ලිමේන්තුවාදියෙකු වූ ලොක් 1688 විප්ලවයෙන් එංගලන්ත ධනපති පංතිය අත්පත්කරගත් ජයග්‍රහණ ආරක්ෂා කර දීමට උත්සාහ කළ අතරම එයට අනුරූපව රජුගේ බලයද සීමා කිරීමද උත්සාහ කළේය. තවද ඔහුගේ මෙම කෘතිය දේපළ හිමියන්ගේ බයිබලය ලෙසද හැඳින්වේ. එසේම ලොක් නූතන ව්‍යවස්ථානුකූලභාවයේ පියා ලෙසද හඳුන්වනු ලබයි.

රාජ්‍ය බිහිවූයේ, මිනිසුන් අතර ඇති වූ සම්මුතියක ප්‍රතිඵලයක් බවට යන මතය ඉදිරිපත් කළ තවත් පුද්ගලයෙකි, ජැක්විස් රූසෝ. මොහු මෙම මතය ඉදිරිපත් කළ අනෙක් පුද්ගලයන් වන තෝමස් හොබ්ස්, ජෝන් ලොක් යන අයගේ සමකාලිනයෙකු නොවුණා සේම එංගලන්ත ජාතිකයෙකුද නොවීය.


Hegel


Mussolini

**ජීන් ජැක්විස් රූසෝ (1712-1778)**

මෙකල ප්‍රංශයේ බිහිවූ දාර්ශනිකයින් අතුරින් ශ්‍රේෂ්ඨතමයා ලෙස සැලකෙන්නේ ජීන් ජැක්විස් රූසෝය. රූසෝට තම න්‍යාය ඉදිරිපත් කිරීමට හේතුවූ ඓතිහාසික කාරණා පිළිබඳව මඳක් අවධානය යොමු කරමු.

වර්ෂ 1715 දී දාහතර වන ලුවී රජුගේ මරණින් පසු ඔහුගේ අසාහය බල ඇති රාජාණ්ඩුව බිඳ වැටුණු අතර ඉන්පසුව රජකමට පත්වූ පස් හැවිරිදි පහළොස්වන ලුවීට රාජ්‍යය කාර්යක්ෂම ලෙස පාලනය කිරීමට හැකියාවක් නොවීය.

විදෙස් යුද්ධ ගණනාවකට රට ඇද දැමීම හේතුවෙන් රටේ ආර්ථිකය දිනෙන් දින පරිහානියට පත්විය. රජයට බදු ගෙවාගත නොහැකි වූ ගොවීන් බන්ධනාගාරගත කෙරුණි. රජුගේ ඒකාධිපතිවාදයට එරෙහිව කතා කළ ජනතාවද හිරබාරයට ගැනුණි. කථා කිරීමේ නිදහස හා ප්‍රකාශන නිදහස අහුරන ලදී. ඔහුගේ පාලනයෙන් පසු බලයට පත්වූ දහසය වන ලුවීටද (රජකමට පත්වන විට විසි හැවිරිදි වියේ විය.) මෙම අර්බුදකාරී තත්වය වෙනස් කිරීමට නොහැකි විය. එනිසා දිනෙන් දිනම රජුට එරෙහි මහජන විරෝධය උත්සන්න විය. එසේම විදෙස් රටවල හමුදා සේවයට ගොස් පැමිණි එනම් ඇමරිකන් නිදහස් අරගලයට දායකවී පැමිණි, සොල්දාදුවන්ගේ නිදහස් අදහස් මෙන්ම වොල්ටයාර්, ඩිඩෙරොට් හා එන්සයික්ලොපීඩියන්වරු ඉදිරිපත් කළ අදහස්ද රජුට එරෙහි ජනතා විරෝධය තීව්‍ර කරන්නට සමත්විය. මේ තත්වය තුළ ජනතාවගේ මෙම විරෝධතාවට දාර්ශනික පදනමක් අවශ්‍ය විය. රූසෝ මගින් ඉටුවූයේ එම අවශ්‍යතාවයයි.

රූසෝ තම මතය ඉදිරිපත් කිරීම සඳහා ප්‍රකෘති සමාජය පිළිබඳව කළ විග්‍රහය බොහෝදුරට ලොක්ට සමාන විය. ඒ අනුව ප්‍රකෘති සමාජය ඉතා සාමකාමී එකක් විය. නමුත් කිසිවෙකු අපේක්ෂා නොකළ මොහොතක පැමිණි, අනාරාධිත අමුත්තෙකු නිසා එම සමාජයේ සාමාකාමී හා තෘප්තිමත් ජීවිත අවුල්වී තිබේ. එම අමුත්තා වෙන කිසිවෙකු නොව පෞද්ගලික දේපළ ක්‍රමයයි. පෞද්ගලික දේපළ ක්‍රමය සෑම අවුලකටම හේතු වුවද මිනිසා තුළ උපතින්ම පවතින තෘෂ්ණාව හේතුවෙන් එය අතහැර දැමීමටද එකඟ වී නැත. එනිසා පෞද්ගලික දේපළ ක්‍රමය හා ඒ හා බැඳී පවත්නා තමන්ගේ ජීවිත පිළිබඳ නිදහස ආරක්ෂා කරගනිමින් සාමකාමී ජීවිතයක් කිරීමට අවශ්‍ය පරිසරයක් ගොඩනගා ගැනීමට මිනිසුන්ට අවශ්‍යව තිබී ඇත. ඒ සඳහා ප්‍රකෘති සමාජයෙන් මිදී සිවිල් සමාජයට අවතීර්ණ වීමට මිනිසා තීන්දු කළ බව රූසෝ පවසයි.

හෝබ්ස්ට සමානව ප්‍රකෘති සමාජය සිවිල් සමාජයට පරිවර්තනය වීමේදී එය එක් සම්මුතියකින් පමණක් සිදුවන බව පෙන්වා දෙන රූසෝ හොබ්ස් සහ ලොක් යන දෙදෙනාටම වෙනස්ව. එම පරිවර්තනයේදී මිනිසුන් තමන් බුක්ති විඳි සමස්ත බලතලම සමාජයට පවරාදුන් බවද පවසයි. ඒ අනුව සමස්ත සමාජයම ස්වාධීන වන අතර සමාජයේ පොදු අභිමතය නිර්මාණය වන පොදු කැමැත්ත මගින් ස්වාධීන බලය ක්‍රියාවට නංවනු ලැබේ. මේ අනුව සෑම මිනිසෙකුම පාලන බලයට සම්බන්ධ වන සැබෑ ජන සම්මතවාදී පාලන ක්‍රමයක් නිර්මාණය විය යුතු යැයි පවසන රූසෝ සම්මුතියට එරෙහි වන පාලනය බිඳ දැමීමටත් කැරලි ගැසීමටත් ජනතාවට අයිතියක් ඇති බව ද අවධාරණය කරයි. එබැවින් ඔහුගේ මෙම න්‍යාය පීඩාකාරී රාජාණ්ඩුවට එරෙහි වූවන්ට මහත් අස්වැසිල්ලක් විය. විශේෂයෙන් රාජ්‍යයට එරෙහිව කැරලි ගැසීමට ජනතාවට ඇති අයිතිය පිළිගැනීම වැනි කාරණා තුළින් 1789 සිදු වූ ප්‍රංශ විප්ලවයට රූසෝ මගින් න්‍යායාත්මක දායකත්වය සිදුවූ බව පැහැදිලිය.

**සම්මුතියෙන් දෙවියන්ට ගැසීම**

තෝමස් හොබ්ස්, ජෝන් ලොක් සහ රූසෝ ඉදිරිපත් කළ සමාජ සම්මුතිවාදය හේතුවෙන් දේවවරම්වාදයට දැඩි ප්‍රහාරයක් එල්ල විය.

රාජ්‍ය වූ කලී මිනිසුන්ගේ සාමූහික කැමැත්ත මත ගොඩනගාගත් සංවිධානයක් යන අදහස මගින් රාජ්‍ය වූ කලී දෙවියන්ගේ නිර්මාණයක් වනවායැයි යන දේවවරම්වාදයේ පළමු මූලධර්මය බිඳ වැටුණි. එසේම මහජනතාව විසින් පාලකයා පත්කර ගත් බව සහ පාලකයාට බලය පවරාදී

2 වැනි පිටුවට

# බීජ පනත ක්‍රියාත්මකයි!

# ගොවියනි පරිස්සමෙන්...

ආණ්ඩුව මීට කලින් පුවත්පත් දැන්වීම් පළ කළේ, ''2003 බීජ රෝපණ ද්‍රව්‍ය පනත ක්‍රියාත්මකයි. ඔබ ඒ අනුව ක්‍රියා කළ යුතුයි.'' යනුවෙනි. නමුත් දැන් රාජපක්ෂ පාලනය 2003 පනතට අනුව කිසිවක් නොකරම 2011 අංක දරන බීජ හා රෝපණ ද්‍රව්‍ය පනත යනුවෙන් නව පනතක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කරමින් තිබේ.

එක්කෝ වක්කඩෙන් අතසෝදා නාම යෝජනා පත්‍රය අත්සන් කළ ගිරුවාපත්තුවේ ඩී.ඒ. රාජපක්ෂගේ පුත්‍රයා අප්පොච්චිටත් වඩා ගොවි ජනතාව ගැන කැක්කුමෙන් මේ පියවර ගෙන ඇත. නැත්නම් ගොවි ජනතාවට හෙණ ගැහුවත් කමක් නැතැයි සිතා බහුජාතික බීජ මංකොල්ලකරුවන්ගේ අත්අඩංගුවට පත්ව ඇත. ඒ අනුව ක්‍රියාත්මක වෙමින් සිටී. මේ ආකාර දෙකෙන් මොන තත්වයක ප්‍රතිඵලයක් නිසා හෝ නව බීජ පනතක් පාර්ලිමේන්තුවේ කෝකටත් අත උස්සන 2/3 මගින් සම්මත කරගැනීමට ආණ්ඩුව සූදානම්ය.

ලංකාවේ ආර්ථිකයේ පදනම කෘෂිකර්මාන්තය බව විවාදයක් ඇත්තේ නැත. එසේම, පැවැති කෘෂිකාර්මික ආර්ථිකය බිඳදමා ඒ මත පැරණි යටත්විජිතවාදීන් වැවිලි ආර්ථිකය පැළ කළාක් මෙන්ම, නව යටත්විජිත අධිරාජ්‍යවාදීන් විසින් වැවිලි ආර්ථිකයද යටපත් කරමින් සේවා ආර්ථිකයේ කම්කරුවන් බවට රටේ ජනතාව පත් කරනු ලැබීය. කෘෂි ආර්ථිකය ආර්ථිකයේ කොඳු නාරටිය කරනු වෙනුවට නඟුට තරමටවත් වැදගත්කමක් දැන් ඉතිරි කර නැත. ඒ කුඩම්මාගේ සැලකිල්ල කෘෂි ආර්ථිකයටත් එහි ජීවනාලිය වන ගොවි ජනතාවටත් වැඩි වශයෙන් ලක්වූයේ, 1977න් පසු ආර්ථිකයේ මොඩලය වූ විවෘත ආර්ථිකය තුළදීය. දළ දේශීය නිෂ්පාදනයෙන් 50%ක් ඉක්මවූ කෘෂිකාර්මික දායකත්වය 11% - 15% තරමට පහළට ඇද වැටුණේ ඉන් පසුවය. වී ගොවිතැන ආශ්‍රිත පෙරදිග ධාන්‍යාගාරය යැයි විරුදාවලි ලත් ලංකාව පිටරටින් සහල් ගෙන්වන රටක මට්ටමට පහළට ඇදවට්ටා තිබේ.

ලෝකය පුරා මෙවැනි ස්වාධීන කෘෂිකාර්මික ආර්ථිකයක් බිඳ වැට්ටවීමේදී බහුජාතික සමාගම් විසින් ඉටු කර ඇත්තේ, සුළුපටු කාර්ය කොටසක් නොවන බව ඉන්දුනීසියා, පිලිපීන, තායිලන්ත මෙන්ම අප්‍රිකානු රටවල අත්දැකීම් බොහොමයකින් තේරුම් ගත හැකිය. එම සමාගම්, ලංකාවද ඇතුළු ඒ සෑම රටකම පැවැති ඒ ඒ රටවලටම ආවේණික වගාවන්වල පැවැත්ම විනාශ කර ඇත්තේ, ඒ රටවල ජනතාවටද නොදැනෙන පරිදිය. ලංකාවේද පළතුරු වගාවන්ට සිදුවූ හානියෙන් මෙම අනතුර හොඳින් තේරුම් ගත හැකිය. අද බිබිලේ දොඩම් නැත. ලංකාවේ පැණි දොඩම් සඳහා අනන්‍යතාවය අද නැත. ඒ තැන ලැබී ඇත්තේ, ඕස්ට්‍රේලියානු දොඩමටය. ලංකාවට ආවේණික පැපොල වෙනුවට මැලේසියානු පැපොල ආක්‍රමණිකයකු ලෙස පැමිණියේ, ජනතාවටද නොදැනීය. ලංකාවේ පළතුරු මෙන්ම එළවළු වගාවන් කළ ගොවීන්ද ඊළඟ කන්නයේ වගාවට බීජ සකස් කර ගත්තේ, තමන් විසින්මය. පැරණි කන්නයේ වගාවේ කොටසක් සාම්ප්‍රදායික ආරක්ෂිත ක්‍රම අනුගමනය කරමින් ඊළඟ කන්නයේ වගාවට ඉතිරි කර ගැනීමේ ක්‍රමයක්ම බීජ වගාවේදී ගොවින් අනුගමනය කරන ලදී. නමුත් අද ඒ බීජ හෝ එවැනි තමන්ගේම ක්‍රමයට බීජ සකස් කර ගන්නා ගොවීන් නැත. ඒ වෙනුවට දැන් වර්තමානයේ සිටින්නේ, බහුජාතික සමාගමේ අවශ්‍යතාවයට අනුව සකස් කළ බීජ පමණය. ඒ බීජ හැර වෙනත් විකල්පයක් දැන් ගොවීන්ට ඉතිරිව නැත. බීජ ලබා ගන්නා සමාගමෙන් බීජ සඳහා කෘමි හා වල් නාශක බෙහෙත්ද ලබා ගත යුතුමය.

සම්ප්‍රදායික ලෙස ගොවියාම බීජ සකස් කිරීමට මැදිහත්වනවාට වඩා බීජ වැඩි දියුණු කිරීම සඳහා පර්යේෂණාගාර සහිත වෙනම ආයතන තිබීම හොඳ තත්ත්වයකි. සමාජවාදී රාජ්‍ය පද්ධතියක් පැවති යුගයේ මේ සඳහා වෙන් වූ ආයතන ඉටු කළ සේවය අති මහත්ය. එහෙත් ගැටළුව වන්නේ හුදු ලාභය පදනම් කරගත් බහුජාතික සමාගම් විසින් බීජ අයිතිය තම ප්‍රාග්ධන ආධිපත්‍යය යටතට ගැනීමය. බහුජාතික කොම්පැනියේ බීජ වවා එළදාව ලබා ගතහැකි වුවද එම එළදාවෙන් බීජ හදා ගැනීමට ගොවීන්ට නොහැකිය. ඒ බහුජාතික සමාගම්වල ජානවල හැටිය. දැන් ඒ ජානවල ප්‍රතිඵල ලාංකේය ගොවි ජනතාවද එම එළදාව කනබොන පාරිභෝගික ජනතාවද භුක්ති විඳිමින් සිටිති. නව බීජ පනත ගැන තේරුම් ගත යුත්තේ, ඉහත යථාර්ථයද පිළිගනිමින් හා වටහා ගනිමින්ය.

## ලංකාවේ බීජ බලය

ලංකාවේ බීජ බලය මුළුමනින්ම පැවැතියේ රාජ්‍යය සතුවය. රජයේ බීජ පර්යේෂණ ආයතනය හා රජයේ බීජ ගොවිපල ගොවිජනතාවට බීජ සලයන මූලිකම හා එකම ආයතන විය. ඊට අමතරව ගොවි ජනයාද තමන්ගේම වූ බීජ බැංකු හදාගෙන තිබුණේ ගෙදරමය. ඒ ආසියාතික බැඳීම් අනුව හුවමාරු කර ගැනීමටය. නමුත් දැනට බීජ බලය සම්පූර්ණයෙන්ම පාහේ බහුජාතික සමාගම් වෙත පැවරෙමින් තිබේ. ලෝකයේද බීජ වෙළඳාමෙන් 74% ක පමණ බලය ඇත්තේ, බහුජාතික සමාගම් අතය. එය සමාගම් 10කට පමණ සීමාවූ ඒකාධිකාර බලයක්ය. එම 74%න්ද 50%ක හිමිකාරීත්වය ඇත්තේ, ප්‍රධාන සමාගම් 3කට වන අතර එයින් 2ක්ම දැනටමත් ලංකාවේද ක්‍රියාත්මකය.

පාලනය හා බීජ නිපදවන්නන්ගේ අයිතිය සුරක්ෂිත කිරිමට යැයි කියමින් නව බීජ පනත හඳුන්වාදෙන විට මහපොළොවේ පවතින යථාර්ථය වන්නේ, බීජ නිෂ්පාදනයෙන් 80%කටත් වඩා මෙම බහුජාතික සමාගම් 2ක විසින් ලංකාව තුළ සිදු කිරිමය. රජයේ බීජ ගොවිපළ කිහිපයක්ම මේ වන විටත් බහුජාතික සමාගම් වෙත පවරා අවසන්ය. හිඟුරක්ගොඩ හා පැල්වෙහෙර මීට ආසන්න උදාහරණයන්ය. මහඉළුක්පල්ලම බීජ ගොවිපළද බහුජාතික බූවල්ලන්ට අයත්වීමේ අවදානමක ඇත. අර්තාපල් බීජ නිපදවීම සිදුකළ සීතාඑළිය රජයේ ගොවිපළද පෞද්ගලික අංශයට පවරා ඇත. රජය කොරටු එළවළු (කොටු එළවළු) බීජ නිපදවීම නවතා දමා ඇත. රජය සතුවූ බීජ නිපදවීමේ ඒකාධිකාරී බලය මුළුමනින්ම බහුජාතික සමාගම් වෙත පවරා බීජ නිපදවීමේ අයිතිය සුරක්ෂිත කිරිමට පනතක් ආණ්ඩුව විසින් ගෙනඑන විට එයින් අයිතිය රැකෙන්නේ, ගොවියන්ගේ නොව බහුජාතික සමාගම්වල බව පැහැදිලිය. එම නිසා මෙම පනතම බහුජාතික කොම්පැණි අවශ්‍යතාවය වෙනුවෙන් සකස් කළ එකක් බව අමුතුවෙන් කිව යුතු නොවේ.

## බීජ හසුරවන්නන් හැසිරවීම

මෙම නව බීජ පනත අනුව බීජ නිපදවන්නා ආරක්ෂා කරන අතර බීජ හසුරවන්නා පාලනයට නීති බොහොමයක් පනවා ඇත්තේය. පනත අනුව බීජ හසුරවන්නා යනු ගොවියාය. බීජ නිපදවන්නා බහුජාතික සමාගම් බැවින් සමාගම් හැසිරවීමට නීති නැත. ගොවීන් ආරක්ෂා කිරීමේ වුවමනාවකින් මෙම පනත සකස් කර ඇත්නම් කළ යුත්තේ, දැනටමත් බීජ සමාගම් විසින් සිදු කරන ජාන මංකොල්ලය, සාම්ප්‍රදායික බීජ ව්‍යාප්තිය මර්දනය, ගොවීන්ට සිදුවන බරපතළ අසාධාරණකම් වැළැක්වීමට පියවර ගැනීමය.

දැනටමත් බීජ ඒකාධිකාරය ලබා ඇති බහුජාතික සමාගම් බීජ පැකට් කර ගොවීන්ට දෙනවා මිස ඒවායේ රෝග පරීක්ෂාවක් සිදු කරන්නේ නැත. එසේම බීජ සපයන සමාගම් විසින්ම බීජ සඳහා වෛරස් රෝගවලට බෙහෙත්ද අලෙවි කරන බැවින් අවශ්‍ය නම් බීජ සපයන විටම වෛරස්ද ඇතුල් කර රෝග සහිත බීජම ගොවීන්ට ලබාදීමට හැකියාව ඇත. ඒ අනුව බීජ විකිණීම මෙන්ම බීජ වෛරස් සඳහා බෙහෙත් විකිණීමේද ජාවාරම් ව්‍යාපාරය එකම සමාගම අතට පත්වීමේ අනතුර ඇත.

ගොවි ජනයා වෙනුවෙන් ආණ්ඩුව ගෙනෙන බීජ පනතක් නම් කළ යුත්තේ, එවැනි වංචනික තත්වයන්ගෙන් ගොවි ජනතාව බේරාගැනීම මිස බහුජාතික සමාගම් රැකීම නොවන්නේය, නමුත් මෙම පනතේ අන්තර්ගතය විමසා බැලීමේදී පැහැදිලි වන්නේ ආණ්ඩුව ආරක්ෂා කර ඇත්තේ, බහුජාතික සමාගම් මිස ගොවි ජනතාව නොවන බවයි.

මෙම පනතේ බලතල අනුව බීජ වෙළඳපොළ හා ගොවීන් අතර ගනුදෙනුව නීත්‍යානුකූලව සිදු කරන්නේ, අධ්‍යක්ෂ ජනරාල්වරයාය. ඔහු යටතේ ජාතික බීජ හා රෝපණ ද්‍රව්‍ය උපදේශන සභාවක් පිහිටවනු ලබන අතර එම සභාවට ගොවි ජනතාවගේ නියෝජනයට එක් නියෝජිතයෙකුද බීජ නිෂ්පාදනය හා ආනයනය වෙනුවෙන් බහුජාතික සමාගම් සඳහා එක් නියෝජිතවරයෙකුද පත් කිරීමට යෝජිතය. එසේම එම සභාවේ බලතල හා කාර්ය යටතේ 6වන කාර්ය වන්නේ පුද්ගලික අංශයේ බීජ කර්මාන්තය සංවර්ධනය සඳහා රාජ්‍ය අංශයේ නියෝජිතයන් හා සමග සම්බන්ධීකරණයක් ඇති කිරීම හා බීජ හා රෝපණ ද්‍රව්‍යවලට අදාල ගැටලු සලකා බැලීමය. ඒ 'පෞද්ගලික අංශය' යනු දැනටමත් රාජ්‍ය අංශය සතුව පැවති බීජ ගොවිපළවල බලය අත්පත් කරගෙන ගොවීන් පීඩාවට පත්කර ඇති බහුජාතික සමාගම්ය.

මෙම යෝජිත බීජ පනතේ 20 වන වගන්තියේ සඳහන්ව ඇත්තේ, ''යම් තැනැත්තෙකු විසින් වවනු ලැබූ හා තමාගේ පරිශ්‍රය තුළදී ඔහු විසින් වාණිජ අරමුණකින් තොරව වෙනත් පුද්ගලයෙකු හට වැපිරීමේ හෝ රෝපණය කිරීමේ කාර්ය සඳහා සෘජුව භාරදෙනු ලැබූ හෝ භාරදෙනු ලබන යම් වර්ගයකට හෝ ප්‍රභේදයකට අයත් බීජ හා රෝපණ ද්‍රව්‍ය මෙම පනතට අයත් නොවන බවයි.''

මෙම වචන හරඹය අස්සේ සඟවා ඇති අර්ථය වන්නේ, මෙතෙක් ගොවීන් හට පැවැති තමන් සාම්ප්‍රදායික ක්‍රමයකට සකස් කරගෙන හුවමාරුකර ගන්නා හෝ අලෙවි කර ගන්නා බීජවල අයිතිය එම ගොවීන්ට අහිමි කිරිමයි. මෙම වගන්තිය අනුව බීජ විකිණීමේ හා හුවමාරුවේ බලය හිමිවන්නේ, බහුජාතික සමාගම්වලටම පමණි. දැනටමත් ග්‍රාමීය ගොවීන් පවත්වාගෙන යන බීජ බැංකු ක්‍රමයද ගොවි සංවිධාන විසින් සිදු කරන බීජ විකිණීම සහ හුවමාරුවද මෙම නව තත්ත්වය යටතේ නතරවීමේ අවදානමක් ඇත. දැනටත් නිල්වලා නිම්නයේ වගා කරන 'මා' වී වැනි සාම්ප්‍රදායික වී වගාවන් පවතින්නේ, බහුජාතික සමාගම් විසින් බීජ සැපයීමෙන් නොව ඒ ඒ ගොවීන් වසර දහස් ගණනක් තිස්සේ පවත්වාගෙන ආ බෙදාගැනීමේ හුවමාරුවේ සහ අලෙවියේ ක්‍රම අනුවය.

ගොවීන් අතරේ හුවමාරුව ගොවියාගේ පරිශ්‍රයට සීමා කරන ආණ්ඩුව පෞද්ගලික අංශයේ බීජ වෙළඳාම සංවර්ධනයට අරමුණු කරගෙනම මෙම නව සංශෝධන පනත ඉදිරිපත් කිරීමෙන්ම ආණ්ඩුවේ සහ බහුජාතික සමාගම්වල දේශපාලන අවශ්‍යතාවය තේරුම්ගැනීමට අපහසු නැත. 2003 සම්මත කළ බීජ පනතේ පැනවිය යුතු නියෝග මාලාවන් වත් තවම සකස් කර නොතිබියදී නව පනතක් කෙටුම්පත් කර ඇත්තේ, ගොවි ජනතාවට ඇති ආදරයට නොව බහුජාතික ප්‍රාග්ධනයට ධනපති ආණ්ඩුවල ඇති කැමැත්ත නිසාවෙන්ය. 2002දී රනිල් වික්‍රමසිංහ පාලනය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට හා ලෝක වෙළඳ සංවිධානයට අනුව ඉදිරිපත් කළ 'යළි පුබුදමු ශ්‍රී ලංකා' වැඩපිළිවෙළ තුළ මේ බීජ පෞද්ගලීකරණය නිශ්චිතව සඳහන් කර තිබිණි. රනිල් ලිඛිතව සටහන් කළ දේ මහින්ද චින්තනයේ රාජපක්ෂ පාලනය සඳහන් නොකරම ක්‍රියාත්මක කිරීමට පනත කෙටුම්පත් කර ඇත්තේය. රනිල්-මහින්ද වෙනස එපමණය.

බීජ බලය බහුජාතික සමාගම්වලට පැවැරීමේ අරමුණු ඇතිව ආණ්ඩුව බීජ පනතක් ගෙනෙන බව දැන් පැහැදිලිය. නමුත් ගොවි ජනතාවද තමන්ගේ ගොවි බලය අවතක්සේරු නොකළ යුත්තේය. පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප මංකොල්ලකෑමට ආණ්ඩුව යෝජනා කළේ, පෞද්ගලික අංශයට විශ්‍රාම වැටුපක් ගෙන එන ආකාරයෙනි. විශ්‍රාම වැටුප් මුවාවෙන් එන සැබෑ අනතුර වැඩ කරන ජනතාව කල්තියා හඳුනාගත් නිසාම එම කුමන්ත්‍රණය පරාජය කිරීමට ඔවුහු සමත් වූහ. ගොවි ජනතාවද බීජ ආරක්ෂාවේ මුවාවෙන් ගෙන එන මෙම සැලසුම් පළමු වටයේම තේරුම් ගැනීම කුමන්ත්‍රණයන් පරාජය කිරීමේ පළමු ජයග්‍රාහී පියවර වනු ඇත.






අයුක්ති සහගත ක්‍රමයක් යටතේ නිහඬව සිටීම ඊට සහයෝගය දැක්වීමකි. එය පීඩිතයාද පීඩකයෙකු තරමටම පාපියෙකු බවට පත්කරවයි.

**මාටින් ලූතර් කිං**

# අරගලයෙන් උපන් ජාත්‍යන්තර කාන්තා දිනය



මුළු මහත් විශ්වය පුරා විසිරී සිටින, වැඩ කරන කාන්තාවන් සඳහා වූ ඓතිහාසික සැමරුම් දිනය, එනම් ජාත්‍යන්තර කාන්තා දිනය යෙදී ඇත්තේ, මාර්තු 08 වැනිදාටය. එය, කම්හලේ, ගොවිපලේ, ගෙදර දොර වැඩ කරන කාන්තාවන්, ජීවත්වීමට වඩාත් යහපත් සමාජයක් උදෙසා වූ, සමාජවාදය උදෙසා වූ අරගලයේදී ඔවුන්ගේ ශක්තිය හා සංවිධානාත්මක බව පෙන්වන, පොදු අරමුණු වෙනුවෙන් සටන් කිරීමේ ජාත්‍යන්තර සහයෝගීතාවය පෙන්වන දිනයකි. මේ වනවිට රටවල් (විශේෂයෙන්ම සමාජවාදී පාලනයක් තිබෙන හා තිබූ රටවල් ඇතුළු) 30කට නොඅඩු ප්‍රමාණයක් මාර්තු 08 යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනය නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත්තේද එම දිනයේ ඇති වැදගත්කම නිසාය.

එහෙත් වැඩ කරන කාන්තාවන්ට අමතරව මෙම දිනය සඳහා සූදානම් වන තවත් පාර්ශවයක්ද ඇත. ඒ ධනපති පක්ෂවල නායක කාරකාදීන් හා ව්‍යාපාරික ප්‍රජාවය. ඔවුන් ජාත්‍යන්තර කාන්තා දිනය යොදා ගන්නේ තවත් වටයකින් කාන්තාවන් රැවටීමටත් සූරාකෑමටත්ය. සිය ප්‍රෝඩාකාරී, රැවටිලිකාරී දේශපාලනය දිගටම පවත්වා ගෙන යාමේ අරමුණින් කාන්තාවන් රැවටීමට ධනපති දේශපාලකයෝ මෙම දිනය ප්‍රයෝජනයට ගනිති. ව්‍යාපාරික ලෝකය මේ දිනය යොදා ගන්නේ, මල් ප්‍රදර්ශන, කේක් ප්‍රදර්ශන, විලාසිතා හා මනාලියන් දැක්ම ආදී දේ මගින් කාන්තාවන්ගේ ශ්‍රමය සූරාකමින්, ඔවුන් වෙළෙඳ භාණ්ඩ බවට පත් කරමින් තම මඩි තර කර ගැනීමටය.

### ඓතිහාසික පසුබිම

ධනපති පංතිය කාන්තා දිනයද අනෙකුත් සැමරුම් දින සේම පුහු ආටෝපයෙන් යුත් තවත් එක් උත්සවයක් බවට පත්කර ගත්තද ජාත්‍යන්තර කාන්තා දිනය නම් කෙරුණේ පීඩිත හා දුක්ඛිත ජීවිත ගෙවූ කාන්තාවන්ගේ අරගල ඉතිහාසය තුළිනි. හාමතින් වැඩ කරනවාට වඩා හාමතට එරෙහිව සටන් කිරීම වඩා හොඳ යැයි හඬ නගමින්, සමානාත්මතාවය, සාධාරණත්වය වෙනුවෙන් ලේ හලමින්, ජීවිත පූජා කරමින් කාන්තාවන් සටන් වැදුණු එම අරගල ඉතිහාසය ආරම්භ වන්නේ, යුරෝපයේ කාර්මික විප්ලවයත් සමඟය.

යුරෝපය තුළ 18 වන සියවසේ ආරම්භ වූ කාර්මික දියුණුව 19 වන සියවස මැද භාගය වනවිට ශීඝ්‍ර වර්ධනයක් අත්පත් කරගෙන තිබූ අතර ප්‍රධාන නගරවල විශාල පරිමාණයේ භාණ්ඩ නිපදවන කර්මාන්තශාලා ව්‍යාප්තව තිබුණි. ඒවායින් කර්මාන්තශාලා හිමිකරුවන් උපරිම ලාභ ලැබුවත් කම්කරුවන්ගේ ජීවිත දුක්ඛිතභාවය, දරිද්‍රතාවය විසින් ගිලගෙන තිබුණි. කර්මාන්තශාලාවල සේවය කළ කම්කරුවන්ට දිනකට පැය 12ක් 14ක් සේවය කිරීමට සිදුවුවත් ඔවුන්ට ජීවත්වීමට සරිලන වැටුපක් නොලැබුණි. එම වැඩබිම් තුළ වෘත්තීය අයිතිවාසිකම් පවා ඔවුන්ට හිමි නොවුණි. මෙකල ඉතා නින්දිත ලෙස සුළු වැටුපකට කම්කරුවන්ගේ ශ්‍රමය සූරාකෑමට එරෙහිව යුරෝපයේ සමාජවාදී ව්‍යාපාරයන්ගේ ක්‍රියාකාරකම්ද උත්සන්න වෙමින් තිබුණි.

මේ යුගයේ කාන්තාවන් විශාල වශයෙන් සේවයේ යොදවා ගනු ලැබුවේ, රෙදිපිළි හා ඇඟලුම් ආශ්‍රිත කර්මාන්තයන් තුළය. පිරිමි කම්කරුවන්ට සාපේක්ෂව ගත්විට කම්කරු කාන්තාවන්ගේ තත්වය ඉතා පහත් තත්වයක පැවතිණි. මේ නිසා වාමාංශික ව්‍යාපාරයන් මැදිහත්ව, කම්කරුවන්ට සාධාරණ වැටුපක් ලබා නොදීමට, කාන්තා හා පිරිමි කම්කරුවන්ට සමාන ලෙස නොසැලකීමට හා ඡන්ද අයිතිය ලබා නොදීමට එරෙහිව කම්කරුවන්ව අරගල සඳහා සූදානම් කරමින් තිබිණි. විශේෂයෙන් ධනපති පාර්ලිමේන්තුව තුළ කම්කරු පංතියේ ඡන්ද බලය ශක්තිමත් වීම වැළැක්වීමේ අරමුණින් කාන්තාවන්ගේ ඡන්ද අයිතිය පිළිගැනීමටත් ඒ සඳහා නීති සම්මත කිරීමටත් එකල ධනපති පංතිය මැලිකමක් දැක්වීය. මේ නිසා වැඩබිම් තුළ කාන්තාවන්ගේ අයිතීන් ලබා ගැනීමටත් ඡන්ද අයිතිය ලබා ගැනීමටත් කාන්තාවන්ට අරගල කිරීමට සිදු වූ අතර ඒ සඳහා කාන්තාවන් පෙළ ගැසුණු අවස්ථා ඉතිහාසය තුළ විවිධ රටවලින් අපට හමුවේ. ඒ අතර සුවිශේෂී අරගලයන්ද දැකිය හැක.

1857 මාර්තු 08 දින ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් නගරයට රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තශාලාවල සේවය කරන කාන්තාවන් දහසක් පමණ එක්රැස් වූයේ, වැඩබිම් තුළ සිදුවන ලිංගික හිරිහැරයන්ට, පැය 12 ක වැඩ කාලයට හා අඩු වැටුප් ලබාදීමට එරෙහිව විරෝධතා දැක්වීමටය. එහෙත් පොලීසිය විසින් එම විරෝධතාවට සහභාගි වූ කාන්තාවන්ට පහරදී පළවා හරින ලදී.

> **කාන්තාවට සමානත්වය නමැති ධජයේ ගැබ් වී තිබෙනුයේ, ලිංගික යුද්ධයක් නොව පංති යුද්ධයකි.**
>
> **-ක්ලාරා සෙට්කින්**

මෙම විරෝධතාවට සහභාගි වූ කම්කරු කාන්තාවන් විසින් ඊට අවුරුදු දෙකකට පසුව මාර්තු මාසයේ ඔවුන්ගේ පළමු වෘත්තීය සමිතිය පිහිටුවා ගනු ලැබීය.

කාන්තා අරගල අතර වඩාත් ප්‍රකට වූයේ, 1908 මාර්තු 08 දින එක්සත් ජනපදයේ මැන්හැට්න් නගරයේ රැට්ගා(ර්)ස් චතුරස්‍රයට කම්කරු කාන්තාවන් 15 000ක පමණ පිරිසක් රැස්ව සාධාරණ වැටුපක් දෙන ලෙස, දීර්ඝ වැඩ කාලය කෙටි කරන ලෙස, සමානව සලකන ලෙස, ඡන්ද අයිතිය ලබාදෙන ලෙස හා ළමා කම්කරු ශ්‍රමය නතර කරන ලෙස බලකරමින් පැවැත්වූ විශාල උද්ඝෝෂණ පෙළපාලියය.

මෙසේ විවිධ රටවල කම්කරු කාන්තාවන් තමන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් වදිද්දී, 1910 වසරේ ඩෙන්මාර්කයේ කෝපන්හේගන් නගරයේ පැවැති සමාජවාදී කාන්තාවන්ගේ දෙවන ජාත්‍යන්තර සමුළුවේදී, ජර්මනියේ සමාජවාදී නායිකාවක් වූ ක්ලාරා සෙට්කින් විසින්, කාන්තා අයිතිවාසිකම් හා කාන්තාවන් සඳහා සර්වජන ඡන්ද බලය ඉල්ලා සටන් වැදුණු කාන්තාවන් සැමරීම වෙනුවෙන් ජාත්‍යන්තර කාන්තා දිනයක් නම් කළ යුතු බවට යෝජනාවක් ගෙන එනු ලැබීය. ''කාන්තාවන් සඳහා ඡන්ද අයිතිය සමාජවාදය සඳහා වූ අරගලයේදී ශක්තිය එක්රැස් කිරීමක් වේ'' යන පාඨය යටතේ සෑම රටකම, එකම දිනකදී කාන්තා දිනය සැමරිය යුතු බවටද එම සමුළුවේදී තීරණය විය.

### පළමු කාන්තා දිනය

සමාජවාදී කාන්තාවන්ගේ දෙවන ජාත්‍යන්තර සමුළුවේදී සම්මත වූ යෝජනාවට අනුව, 1911 මාර්තු 19 දින ජර්මනිය, ඔස්ට්‍රියාව, ඩෙන්මාර්කය හා ස්විට්සර්ලන්තය යන රටවල පළමුවරට ජාත්‍යන්තර කාන්තා දිනය පවත්වනු ලැබීය. එම රටවල පැවැත්වූ කාන්තා දින රැලි සඳහා මිලියනයකට අධික කාන්තාවන් හා පිරිමින් ප්‍රමාණයක් සහභාගි වූ බව සඳහන් වේ. ජර්මනියේ හා ඔස්ට්‍රියාවේ විශාල නගරවල පැවැත්වූ රැලිවල ප්‍රචාරක බැනර් ඉවත් කිරීමට පොලීසිය කටයුතු කරද්දී කාන්තාවන් ඊට එරෙහිව නැගී සිටි බවත් එහිදී ලේ වැගිරීමකින් තොරව ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට හැකි වූයේ, පාර්ලිමේන්තුව තුළ සිටි සමාජවාදී නියෝජිතයින්ගේ මැදිහත්වීම නිසා බවත් පැවසේ. එසේම කුඩා නගරවල හා ගම්වල කුඩා ශාලාවන්හිද කාන්තා දින රැලි සංවිධානය කර තිබූ අතර ඒවාටද කාන්තාවෝ විශාල වශයෙන් සහභාගි වූහ.

ජාත්‍යන්තර කාන්තා දිනය මාර්තු 08 දින පැවැත්වීමට තීරණය කෙරුණේ, 1913 වසරේ සිටය. ඒ දිනය යොදා ගැනීමට හේතු වූයේ, 1908 මාර්තු 08 දින රැට්ගා(ර්)ස් චතුරස්‍රයේ පැවැති කම්කරු කාන්තා උද්ඝෝෂණ පෙළපාලියේදී කාන්තාවන් දැක්වූ සටන්කාමීත්වය නිසාය.

### කාන්තා දිනයේ සැබෑ අරමුණ

ධනපති පංතිය තමාට වාසිදායක, ලාභදායක නොවන කිසිවක් නොකරන අතරම ලෝකයේ පවතින සියලු දේ තම පැවැත්ම සඳහා යොදා ගැනීමටද පසුබට නොවන බව අතීතයේ සිට මැනවින් ඔප්පු කර ඇත. ජාත්‍යන්තර කාන්තා දිනයද ඔවුන් යොදාගන්නේ, ඒ අරමුණ සහිතවය. එහෙත් ජාත්‍යන්තර කාන්තා දිනයේ සැබෑ අරමුණ වන්නේ, ධනේශ්වර ආධිපත්‍යයට එරෙහි අරගලය වෙනුවෙන් පුළුල්ව කාන්තාවන් ඒකරාශී කිරීමත් ඔවුන් ඒ සඳහා මෙහෙයවීමත්ය. එම අරමුණ සාක්ෂාත් කරගැනීමට ධනපති පංතිය යටතේ කිසිදිනෙක නොහැකි වන අතර එය කළ හැකි වන්නේ, ශක්තිමත් විප්ලවවාදී ව්‍යාපාරයක මග පෙන්වීම යටතේ පමණි.

වත්මන් ලෝකය දෙස බැලීමේදී පොදුවේ සමාජයක් වශයෙනුත් කාන්තාවන් වශයෙනුත් මුහුණ පා ඇති අර්බුදයන්ගේ වැඩිවීමක් මිස, පීඩාවට පත්වීමේ හා සූරාකෑමේ උග්‍රවීමක් මිස, අයිතිවාසිකම් අහිමි කිරීමක් මිස අන් යමක් දක්නට නොමැත. ධනේශ්වර ක්‍රමය තුළ ලෝකයේ වඩාත් දියුණු යැයි පවසන කුමන රටක වුවද කාන්තාවන්ට පූර්ණ ලෙස අයිතිවාසිකම් හිමි වී නැත; ලිංගික අසමානත්වය තුරන් කර නැත. අසමානත්වය ධනවාදී ක්‍රමයේ මූලික ලක්ෂණවලින් එකක් වන බැවින් එය ආර්ථික හා සමාජීය ක්ෂේත්‍රයන් තුළද විවෘතව දකගත හැකිය. පුද්ගලික දේපළ මත පදනම් වූ ධනවාදී සමාජයේ සමානත්වයක් බලාපොරොත්තු වීමද විහිළුවකි. එවැනි සමාජයක දකිය හැක්කේ, අයිතිවාසිකම් ලබාදීම වෙනුවට අයිතීන් අහිමි කිරීමත්, සමානත්වය වෙනුවට අසමානත්වයත්ය. එබැවින් පූර්ණ ලෙස අයිතිවාසිකම් හා පූර්ණ සමානත්වය ලබා ගැනීමට හැකි වනුයේ, පුද්ගලික දේපළ මත පදනම් වූ අසමානත්වය රජයන ධනපති සමාජ ක්‍රමය වෙනස් කර පුද්ගලික දේපළ නොමැති ආර්ථික හා සමාජීය සමානත්වය ඇති සමාජ ක්‍රමයක් එනම් සමාජවාදය ස්ථාපිත කිරීම තුළ පමණි.

කාන්තාවන්ට යම් ප්‍රමාණයකට හෝ අයිතීන් දිනාගැනීමට හැකි වූයේ, ඉතිහාසයේ ඔවුන් කළ අරගල නිසාය. එබැවින් කාන්තාවන්ගේ අයිතීන්, නිදහස හා සමානත්වය ලබා ගැනීමට හැකි එකම මාර්ගය, සමාජය වෙනස් කිරීමය; සමාජවාදය ගොඩ නැගීමය. ඒ විප්ලවීය වෙනස සඳහා කාන්තා දායකත්වය ලබාදීමය. ජාත්‍යන්තර කාන්තා දිනයේ සැබෑ අරමුණ වෙනුවෙන් ක්‍රියාත්මක වීමය. එසේ නොමැතිව අපට කිසිදිනෙක සැබෑ ජයග්‍රහණයක් අත්කර ගත නොහැකි වනු ඇත.



# නෂීඩ් නොදත් රජය හා ආණ්ඩුව

සිදුවීම් සිදුවන්නේ, කොක් හඬලා සිනාසීමට හෝ හඬා වැලපීමට නොව තේරුම් ගැනීමට යැයි ඕලන්ද ජාතික දාර්ශනික ස්පිනෝසා වරක් පවසා තිබෙනවා. මෙම අදහස නැවත අවධාරණය වන්නේ, අසල්වැසි මාලදිවයිනේදී පෙරබරවාරි මුල සිදුවූ නාට්‍යාකාර සිදුවීම් පෙළ විමසා බලද්දීයි.

ජනාධිපති මොහොමඩ් නෂීඩ්ට ඉල්ලා අස්වන ලෙසට සති තුනක කාලයක් පුරා පැවති විපක්ෂයේ විරෝධතා පසුගිය පෙරබරවාරි 07 වැනිදා කූටප්‍රාප්තියට පත් වූයේ, සන්නද්ධව හමුදා සහ පොලීසියේ සහාය ඇතිව සිදුවූ දේශපාලන කුමන්ත්‍රණයක් මගින් නෂීඩ් බලයෙන් පහකර හැරීමෙනුයි. මේ දක්වා විහිදුණු සිදුවීම් පෙළ දළ වශයෙන් මෙසේ පෙළ ගැස්විය හැකියි.

ස්වදේශික භාෂාවෙන් 'දිවෙහි රාජ්‍යය' යනුවෙන් හඳුන්වනු ලබන දූපත් 1200කින් සමන්විත මාලදිවයින ක්‍රි.ව. 12 වන සියවස තෙක් ලංකාව හා සමගාමී භාෂාවක් හා සංස්කෘතියක් පැවති රටක්. 12 වන සියවසේ සිට වර්ධනය වූ මුස්ලිම් වෙළඳ ආධිපත්‍යය සමඟ සුල්තාන්වරයකුගේ පාලනය යටතේ මාලදිවයින සුන්නි මුස්ලිම් නිකායික මුස්ලිම් සංස්කෘතියකට උරුමකම් කියනවා. පසුව 1887 සිට ඉංග්‍රීසි ආධිපත්‍යයට යටත්ව තිබූ මාලදිවයින 1965 වසරේදී නිදහස ලැබුවා. ජනරජයක් බවට පත්වීමෙන් පසු 1968 සිට 78 දක්වා ඉබ්‍රහිම් නසීර්ගේ ජනාධිපති ධුරය යටතේ පැවැති මාලදිවයිනේ 1978 දී බලයට පත් අබ්දුල් ගයුම් ජනාධිපතිවරයා දශක 3ක කාලයක් විරුද්ධවාදීන් මර්දනය කරමින් ඒකාධිපතියෙකු ලෙස රට පාලනය කළා.

ඒ, 2008 දී පළමු බහු පක්ෂ ජනාධිපතිවරණය පවත්වන තෙක්. එම ජනාධිපතිවරණය සඳහා ගයුම්ගේ මර්දනය තුළ දේශපාලන සිරකරුවෙක් ලෙස සත් වසරක් සිරගතව සිටි මානව හිමිකම් ක්‍රියාකාරිකයෙකු ගයුම් ජනාධිපතිවරයා සමඟ තරඟ වැදුණා. ඔහු නමින් මොහොමඩ් නෂීඩ්. ඔහු ජය ලබනු ඇතැයි ලෝකය විශ්වාස නොකළද අනපේක්ෂිත ලෙස ජනාධිපති පුටුවේ වාඩි වීමට නෂීඩ් සමත් වුණා. දහස් ගණන් මාලදිවයින් වැසියන් 'ප්‍රජාතන්ත්‍රවාදයේ උදාව' පිළිබඳව සටන් පාඨ හඬ නැගුවේ මාලේ අගනුවර පුරා පෙළපාළි පවත්වමිනුයි.

### ඉන්දියානු සරණ යමින්

වසර 30ක් ප්‍රජාතන්ත්‍රවාදය වැළලී තිබූ මේ දූපත් රාජ්‍යයට ප්‍රජාතන්ත්‍රවාදය රැගෙන එන බවටත් ගයුම් පාලනයේ වංචා දූෂණවලට එරෙහිව කටයුතු කරන බවටත් නෂීඩ් පොරොන්දු දී තිබුණා. කෙසේ වුවද ඔහුටත් ඔහුගේ මාලදිවයින් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයටත් ගයුම්ගේ පාලනයට එරෙහි විකල්ප දේශපාලන හා ආර්ථික වැඩපිළිවෙළක් තිබුණේ නැහැ. දිළිඳු මාලදිවයින් වැසියන්ට, සංචාරක කර්මාන්තයෙන් ධනපතියන් අතළොස්සක් උපදනා ධනයෙන් කිසිදු ඵලක් නොවුණා පමණක් නොව ලෝක ආර්ථික අර්බුදයේ බලපෑම හේතුවෙන් ආර්ථික පීඩාවන්ද ඉහළ යමින් තිබුණා. අයවැය පරතරය වේගයෙන් පුළුල් වෙමින් තිබූ අතර පාරිභෝගික මිල ගණන්ද ඉහළ යමින් තිබුණා. නෂීඩ්ගේ ලෝක අවධානය දිනාගත් රංගනය වූයේ, කාලගුණ වෙනස්වීම් කෙරෙහි අවධානය යොමු කර ගැනීම සඳහා මුහුදු පතුලේ කැබිනට් රැස්වීමක් පැවැත්වීමට ඔහු ගත් පියවරයි. කාබන්ඩයොක්සයිඩ් මුදාහැරීම පාලනය නොකළහොත් මුහුදු මට්ටම ඉහළ යාම හේතුවෙන් තර්ජනයට ලක්වන දිවයින් රාජ්‍යයක් වශයෙන් ඔහුගේ ක්‍රියාමාර්ගය ඔහුට කීර්තිය රැගෙන ආවත් රටට වූ ඔහුගේ දේශපාලන පොරොන්දු එතරම් වේගයෙන් ඉදිරියට තල්ලු වුයේ නැහැ. කලාපීය බලවතා වන ඉන්දියාව හොඳින් තබාගත යුතු යැයි සිතූ ඔහු (කලාපයේ බොහෝ පාලකයින් මෙසේ සිතන අය බැවින් නෂීඩ්ගේ අත්දැකීම අවධාරණය කරගත යුතුයි) ඉන්දියාවට කිහිප විටක් සංචාරය කළ අතරම විදෙස් සබඳතා ශක්තිමත් කරගැනීමට පියවර ගත්තා. ඔහු මාලේ ගුවන්තොටුපොළ ප්‍රතිසංස්කරණය ඉන්දියාවට බාර දුන්නේ, අන්තවාදී මුස්ලිම් කණ්ඩායම් ඒ පිළිබඳව නෂීඩ්ට දැඩි ලෙස දෝෂාරෝපණය කරමින් සිටින අතරතුරයි.

ඉන්දීය මුහුදුබඩ රේඩාර් පද්ධතියට සම්බන්ධ කිරීමට හැකිවන ආකාරයෙන් දූපත් 26ක රේඩාර් පද්ධති සවිකිරීමට ඔහු ඉන්දියාවට අවසර දුන්නා. හදිසි අවශ්‍යතාවයක් වෙනුවෙන් ඉන්දීය හෙලිකොප්ටර් 02ක් මාලේහි ස්ථාවරව නතර කර තැබීමට කටයුතු කෙරුණේද ඔහුගේ පාලනය තුළයි. (එහෙත් මේ හෙලිකොප්ටර් ඔහුට කිසිදා පිහිටට ආවේ නැහැ.)

### අර්බුද මැද අතරමංව

නෂීඩ්ගේ පාලනයේ වසර 02ක් ගතවන විටම ආර්ථික අර්බුදය පිටුපසින් දේශපාලන අර්බුදය කරළියට පැමිණියා. ඒ, 2010 ජූනි මාසයේදී ඔහුගේ කැබිනට් මණ්ඩලයේ 13 දෙනෙක් ඉල්ලා අස්වීමත් සමඟයි. මොවුන් ඔහුගේ පාලනයට පාර්ලිමේන්තුවේදී සහාය දක්වන ලද කුඩා පක්ෂවල අය වූ නිසාම මේ දේශපාලන රික්තකය පුරවා ගැනීමට ඔහුට පාලනය අවසන් කරන තුරුම නොහැකි වුණා. අනතුරුව ඔහු පත් කරන ලද කැබිනට් ඇමැතිවරුන්ට පාර්ලිමේන්තුවේ බහුතරය ලබා ගැනීමට නොහැකි වීම නිසා ඇතිවූ ව්‍යවස්ථානුකූල අර්බුදය අවසන් නොවී ඉදිරියට ඇදෙමින් තිබුණා. ඔහුගේ ආර්ථික ප්‍රතිපත්තිවල අඩුපාඩු ලෙස විපක්ෂයට පෙන්විය හැකි තරමින් ආර්ථික අර්බුදය රට තුළ ඉහළ යමින් තිබුණේ මේ අතරතුරයි.

ජනප්‍රසාදය සොයා නෂීඩ්ට කළ හැකිව තිබුණේ, නැවතත් මැතිවරණ පොරොන්දු වෙතට හැරීම පමණයි. 30වසරක ගයුම් පාලනයේ දූෂණයන් පිළිබඳ වරදරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට නෂීඩ් උත්සාහ කළා. ජනාධිපති කොමිෂන් සභා මගින් හඳුනාගත් දූෂණ චෝදනාවකට වරදරු වූ හිටපු ජනාධිපතිගේ සහෝදරයකු (අබ්දුල්ලා යමීන්) ඇතුළු කිහිප දෙනෙක් අත්අඩංගුවට ගෙන මාලදිවයින් අපරාධ

15වැනි පිටුවට



සිදුවීම් සිදුවන්නේ, කොක් හඬලා සිනාසීමට හෝ හඬා වැලපීමට නොව තේරුම් ගැනීමටය.

**ස්පිනෝසා**

# කියුබාව

## දණ නොගැසූ 50 වසරක්



සම්බාධකවලට එරෙහිව කියුබාවේ ඇමරිකා එක්සත් ජනපද කාර්යාලය ඉදිරිපසින් ඇදෙන යෝධ විරෝධතා පෙළපාළියක්

පෙබරවාරි 07 වැනි දින මාලදිවයිනේ දේශපාලන කුමන්ත්‍රණයක් දිගහැරෙද්දී ලෝකයේ අනෙක් කෙළවරේ කියුබාවටද එම දිනය සුවිශේෂී වැදගත්කමක් එක් කළා. ඒ, කියුබාවට එරෙහි එක්සත් ජනපදයේ ආර්ථික සම්බාධකවලට 50 වසරක් සම්පූර්ණ වීමයි.

1962 පෙබරවාරි 03 වැනි දින එක්සත් ජනපදයේ ජෝන් එෆ්. කෙනඩි ජනාධිපතිවරයා 'කියුබානු ආණ්ඩුව ප්‍රසිද්ධියේ පෙළ ගැසී සිටින චීන-සෝවියට් කොමියුනිස්ට්වාදයේ විනාශකාරී ආක්‍රමණයට එරෙහිව' සම්බාධක පැනවීමේ නියෝගයට අත්සන් තැබුවා. එය ක්‍රියාත්මක වූයේ, තවත් දින හතරකට පසුවයි. සැබැවින්ම කියුබාව සමඟ ගනුදෙනු බේරා ගැනීමට එක්සත් ජනපදය අධිරාජ්‍යවාදය පාවිච්චි කළේ සම්බාධක පමණක් නොවේ. CIA සංවිධානයේ 'බේ ඔෆ් පිග්ස්' අසාර්ථක ආක්‍රමණය සිදු වූයේද එම වසරේදීමයි.

වසර 50ක කාලය තුළ ලෝකය තුළ බොහෝ වෙනස්කම් සිදුවුණා. සීතල යුද සමය නිමාවී දශක දෙකකට වැඩි කාලයක් ගතවී තිබෙනවා. එක්සත් ජනපදය, රුසියාව සමග සබඳතා පවත්වනවා. චීනය, ඇමරිකාවේ විශාලතම වෙළඳ සැපයුම්කරුවායි. දශකයකට වැඩි කාලයක් යුද වැදුණු වියට්නාමය සමඟ පවා එක්සත් ජනපදයේ වෙළඳ සබඳතා ශක්තිමත් වෙමින් තිබෙනවා. එහෙත් එක් දෙයක් නොවෙනස්ව තවමත් ක්‍රියාත්මකයි. ඒ, මෙම ආර්ථික සම්බාධකයි. ෆ්ලොරීඩාවේ කියුබානු-ඇමරිකානුවන්ගේ ආශිර්වාද මැද ක්‍රියාත්මක වූ කෙනෙඩිගේ සම්බාධක යෝජනා කියුබාවට එරෙහි විස්තීර්ණ එක්සත් ජනපද වෙළඳ සම්බාධකවල ආරම්භයක් වුණා. ඇමරිකානු විදෙස් පිළිවෙතේ යුධවාදී බව ඉදිරියට යත්ම එය තවත් දැඩි බවට පත් වුණා.

කියුබාවට සැතපුම් 90ක් දුරින් පිහිටි එක්සත් ජනපදයට කියුබාවේ අංක එකේ වෙළඳ සහකරුවා විය හැකිව තිබූ අතර සංචාරක කර්මාන්තයේ ප්‍රධාන මූලය විය හැකිව තිබුණා. එහෙත් සම්බාධක මගින් සමාජවාදී කියුබාව දණ ගස්වා දැමීමට එක්සත් ජනපදය ගන්නා උත්සාහය අසාර්ථක වුවද එමගින් කියුබානු ආර්ථිකයට කර තිබෙන විනාශය සුළු පටු නැහැ. සම්බාධක ඉතා විනාශකාරී වන්නේ, එමගින් කියුබාව සමඟ එක්සත් ජනපද සමාගම්වල සෘජු ගනුදෙනු නතර කර ඇතිවා පමණක් නොව කියුබාව සමඟ ගනුදෙනු කරන විදෙස් සමාගම්වලට එරෙහිව පවා එම සම්බාධක ක්‍රියාත්මක නිසයි. නිදසුනක් ලෙස පසුගිය මාසයේ කියුබාවේ ඉදිකරන ලද දැවැන්ත තෙල් ගවේෂණ අටල්ලක් වෙනුවෙන් 10%කටත් වඩා අඩු එක්සත් ජනපද කොටස් පාවිච්චි කර තිබුණද එය අති විශාල වියදමක් දරා දුර බැහැර සිංගප්පූරුවේ සිට ගෙන ඒමට සිදුව තිබුණා. මේ ආදී වශයෙන් සම්බාධක නිසා කියුබාවට සිදුවී ඇති පාඩුව කියුබාව විසින් වර්ෂයකට වරක් ප්‍රකාශයට පත්කරනවා. පසුගිය වසරේ කරන ලද ගණන් බැලීමට අනුව වසර 49ක කාලය සඳහා එම ඇස්තමේන්තුව මුදල ඩොලර් බිලියන 975ක පාඩුවක්.

කියුබාවට එරෙහි සම්බාධක, ලෝක දේශපාලනයේ අපකීර්තිමත්ම සම්බාධක අවියයි. සම්බාධකවලට එරෙහිව කියුබාව එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යන්තර සංසදවලදී ප්‍රබල හඬක් නඟනවා. එසේම ලෝකයේ අති මහත් ජාතීන් කියුබාවේ හඬ සමඟ එකතු වෙනවා. පසුගිය නොවැම්බරයේදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට ගෙන එන ලද සම්බාධකවලට එරෙහි කියුබානු යෝජනාවට පක්ෂව රටවල් 186ක් ඡන්දය ප්‍රකාශ කළා. ඊට එරෙහිව එක්සත් ජනපදය සමඟ ඡන්දය ප්‍රකාශ කළේ, එහි මැද පෙරදිග සුරතලා වන ඊශ්‍රායලය පමණයි. සම්බාධක පිළිබඳ ලෝක ජනමතය පිළිබිඹු වන මීට වඩා තවත් හොඳ අවස්ථාවක් නැහැ.




පසුබිම් ප්‍රචාරක පුවරුවේ සඳහන් වන්නේ, කියුබානු ජනගහනයෙන් 70%ක් සම්බාධක පැනවීමට පසුව ඉපදුණු අය බවය.

කවුළුව හැර තබමි

# ළමා අපචාර, ස්ත්‍රී දූෂණ සහ ආසියාවේ ආශ්චර්යය



යුරි ගගාරින්, නීල් ආම්ස්ට්‍රෝන් සහ ලැයිකා නැමැති බැල්ලිය හඳට ගොස් වසර කිහිපයකට පසු සමගි පෙරමුණු ආණ්ඩුව මැතිවරණ වේදිකාවේ සිට හඳට ගොස් හඳෙන් හාල් රැගෙනවිත් මෙරට ජනතාවගේ කුසගිනි නිවිවේය. ඉන් පසු මෙරට ජනතාව ධර්මිෂ්ඨ රාජ්‍යයකට රැගෙන ගිය ජේ.ආර් ජයවර්ධන උතුමාණෝ ජනතාවට ඇට අට බැගින් දුන්නෝය. අම්මා කළ දේ දුව නොකළොත් නොට්ටිගේ දුව යැයි උපහැරණයක් ඇති බැවින් විවෘත ආර්ථිකයේ මානුෂික මුහුණුවර නැමැති වෙස් මුහුණ පැළඳ නූතන විහාර මහාදේවිය ලෙස මෙරටට ප්‍රාතුර්භූත වූ චන්ද්‍රිකා කුමාරතුංග තුනයි පනහට පාන් බෙදා දී සූරියකන්දේ සහ බටලන්දේ සියලු වගඋත්තරකරුවන් ගෝල් ෆේස් පිටියේදී එල්ලා මැරුවාය. මේ සියලු අලකලංචි මැද ගොල් ෆේස් පිටියේදී එල්ලා මැරූ රනිල් වික්‍රමසිංහ චුවිංගමයක් හප හපා බේස්ලට්ද රැගෙන නැවත ජනතාව අතරට ආවේය. මේ කිසිවකින් තෘප්තිමත් නොවූ ජනතාව ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය වෙත කැන්දා ගෙන යාම සඳහා ශ්‍රී රෝහණ ජනරංජනලාගේ දෙමුහුන් ඩෙන්ඩ්‍රොබියම් මහින්ද ශිරන්ති රාජපක්ෂලාගේ මහින්ද රාජපක්ෂ රැගෙන ආවෝය.

සවන් දෙන්න, මේ ආසියාවේ ආශ්චර්යයයි.. 2011 වර්ෂය තුළ ආශ්චර්යයමත් ශ්‍රී ලංකාවේ වාර්තා වී ඇති ස්ත්‍රී දූෂණ සංඛ්‍යාව 1635කි. ළමා ලිංගික හිංසන ප්‍රමාණය 1035 ක් වන අතර ළමා අපචාර 1065 ක් වේ. 2005 වසරේදී 300 ක් පමණ වූ මෙම සිද්ධීන් ප්‍රමාණය සිය දහස් ගුණයකින් වැඩි වී ඇත. ''අනේ අපේ දරුවට එහෙම දෙයක් වුණේ නැහැනේ'' යනුවෙන් සිතා සිත සනසාගත් දෙමව්පියන්ගේ දරුවෝද වසරින් වසර මෙහි ගොදුරු බවට පත්වූහ. ආඩම්බරකාර තාත්තා ඉතා සතුටින් සිටී. මන්ද යත් මෙවැනි සිද්ධීන්වලට ලක් වූවන් තම සංචාරක හොටල්වල ෂෝ කේස්වල දමා අලෙවි කිරීමේ හැකියාව ලැබෙන නිසාය. දුරාචාර්ය දේශපාලුවන් ආචාර්යවරුන්ව සිටින රටක කුඩා දරුවන් මතු නොව කිරි දරුවන් පවා ජීවිත දූෂිත ක්‍රමයේ ගොදුරු බවට පත්වීම වැළැක්විය හැක්කේ, ක්‍රමයේ වෙනසකින්ම පමණකි.

# ආක්‍රමණිකයා සිප වැළඳ ගැනීම



ඉන්දියාව විසින් ශ්‍රී ලංකාව ඩැහැගැනීමට බලා සිටින බව මීට වසර 47 කට පෙර ප්‍රකාශ කරනු ලැබුවේ, අන් කවරෙකු නොව ජනතා විමුක්ති පෙරමුණේ නායක රෝහණ විජේවීර සහෝදරයාය. එය ඇසූ කොල්වින් ඇතුළු පැරණි වමේ නායකයින් කිව්වේ, රෝහණ විජේවීරට පිස්සු කියාය. දේශපාලන පිස්සන්ට බුද්ධිමත් දේශපාලකයින් පවා පිස්සන් ලෙස පෙනීම සාමාන්‍ය දෙයකි. ක්‍රම ක්‍රමයෙන් ශ්‍රී ලංකාව තම ගොදුර බවට පත්කර ගැනීමට මාන බැලූ ඉන්දියාව රෝහණ විජේවීර සහෝදරයා එදා කීදේ සැබෑ කරමින් ඉන් වසර 22 කට පසු එනම් 1987 දි ශ්‍රී ලංකාව ආක්‍රමණය කළේය. බලහත්කාරයෙන් මෙරට ගුවන් සීමාවත් මුහුදු සීමාවත් උල්ලංඝනය කළ ඉන්දියානු හමුදාව අප රටට ඇතුළු විය. යැංකි ඩිකී වූ ජේ.ආර් ඉන්දියාව ඉදිරියේ දණ ගැහුවේය. ඉන්දියන් ආක්‍රමණිකයාට එරෙහිව ඉදිරියට පැමිණි මෙරට දේශප්‍රේමී ජනතාව ඉදිරියේ හිටපු අගමැති සිරිමාවෝ බණ්ඩාරනායකත් වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂත් සිටියෝය.

කන්න වූ විට අසූචි වුව දිව්‍ය භෝජනයක් කරගන්නා ධනපති පාලකයෝ ඉන්දියානු ආක්‍රමණිකයා සිහිකිරීම සඳහා පාර්ලිමේන්තුවට නුදුරින් ස්මාරකයක්ද ඉදි කළෝය. නිදහස් අරගලයේ අතීත වීරයන් එල්ලා මැරීමට නියෝග දුන් ටොරින්ටන් චතුරස්‍රය නිදහස් චතුරස්‍රය ලෙස නම් තැබුවේද මෙරට ධනපති පාලකයින්ය.

මෙරට දුක් විඳින ජනතාවගේ සැබෑ නිදහස වෙනුවෙන් දිවි දුන් වීරුවන් ද්‍රෝහීන් බවට පත්කොට ඇති ධනපති පාලකයින් රටේ ස්වෛරිභාවය උල්ලංඝනය කළ ආක්‍රමණිකයන් සිප වැළඳ ගන්නේත් ස්මාරක ඉදිකර උපහාර දක්වන්නේත් ඔවුන් අධිරාජ්‍යවාදීන්ගේ ශ්‍රී ලංකා නියෝජිතයන් වන නිසා නොවේද?

# කිඹුලා ඉගැන්වූ පාඩම



මෑතකදි මුතුරාජවෙලේ සිටියදී ආසියාවේ ලොකුම කිඹුලා රාගම ජනතාවට හමු වුවේය. කිඹුලා පිළිබඳව ජනතාවගේ උනන්දුව වැඩි වූයේ තණකොළ කැපීමට ගිය මිනිසෙකු කිඹුලා විසින් ගොදුරු කර ගැනීමත් සමඟය. මේ කිඹුලාගේ සාමාන්‍ය දිග අඩි 19 ක් පමණ වූ අතර බර කිලෝ ග්‍රෑම් 700 ක් පමණ වේ යැයි සඳහන් විය. මෙම කිඹුලා දෙවැනි වූයේ, ලෝකයේ සිටින ලොකුම කිඹුලාටය. මිනිසා ඌගේ සීමාවට පැමිණියේය. කිඹුලා විසින් තම ආහාරය සඳහා මිනිසා ගොදුරු කර ගන්නා ලදී. කෝපයට පත් මිනිස්සු බොහෝ වෙහෙසක් දරා කිඹුලා අල්ලා ගෙන පහර පිට පහර දී ජීවිතයත් මරණයත් අතර සිටි කිඹුලා දෙහිවල සත්තු වත්තට යැව්වෝය. එහිදි කිඹුලා මිය ගියේය.

ප්‍රෝඩාකාරි විශ්‍රාම වැටුප මගින් පුද්ගලික අංශයේ EPF - ETF අරමුදලේ මුදල් කොල්ලකෑමට රාජපක්ෂ ආණ්ඩුව කටයුතු කළේය. පුද්ගලික අංශ සේවකයෝ තම බිමේ සිට එයට විරෝධය පෑවෝය. ඔවුන්ගේ භූමිය ආක්‍රමණය කළ රාජපක්ෂගේ උපදෙස් රැගත් පොලීසිය මහ දවලේම රොෂේන් චානක ගොදුරු කර ගත්තේය.

කම්කරුවෙකු බිලිගත් රාජපක්ෂ ආණ්ඩුව තම නාස්තිකාර වියදම් පියවා ගැනීම සඳහා අසීමිත ලෙස ඉන්ධන ගාස්තු ඉහළ දැම්මේය. එයට එරෙහිව රට පුරා මතු වූ විරෝධයට ධීවර ජනතාවද එක්විය. රාජපක්ෂගේ උපදෙස් සමඟ හලාවතට ගිය පොලීසිය සහ හමුදාව තම බිමේ සිටි ධීවර කාර්මික ඇන්තනී ප්‍රනාන්දු සොයුරාගේ ජීවිතය බිලි ගත්තේය.

තිරිසන් සතෙකු වූ කිඹුලා විසින් මිනිසෙකු බිලි ගන්නා විට මිනිසුන්ට දැනෙන කම්පාව, දුක රාජපක්ෂ ආණ්ඩුව විසින් මිනිසුන් බිලිගන්නා විට ප්‍රකාශයට පත් නොවන්නේ කුමන හේතුවක් නිසාදැයි විමසා බැලිය යුතුය.

# පොලිටිකල් පංතිය

''ගුඩ් මෝර්නින් සර්''

''සුභ උදෑසනක්..... සුභ අනාගතයක්''

පොලිටික්කා ළමයින්ට උත්තර දුන්නේ ටූ ඉන් වන් ක්‍රමයට.

''ළමයි අද අපේ පාඩම මානව හිමිකම්.''

මිනිහා කළු ලෑල්ලෙ මාතෘකාව ලිව්ව වේගය අධිවේගී පාරේ ලංගම බස් එකක් යනව වගේ.

''මේ මාතෘකාවේ තේරුම එකඑක්කෙනා කියන්න ඕන.''

''අද මිනිහා ජනපති ජනහමුවට සෙට් වෙනව වගේ'' චමියා ලඟම හිටපු වසන්තිට කිව්වා.

''මිනිස්සුන්ට තියෙන අයිතිවාසිකාම්වලට තමයි මානව හිමිකම් කියන්නේ.'' වසන්ති උත්තර දුන්නේ, පවිත්‍රා නෝනගෙ ලාලිත්‍යයෙන්.

''මිනිසෙකුට මිනිසෙකු ලෙස ජීවත් වීමට තියෙන අයිතිය'' දාර්ශනික කතා කියන කමල්ගෙ උත්තරයට කවුරුත් මුකුත් කිව්වේ නෑ.

''මිනිස්සු වැරදි කරන කොට ඒවා පෙන්වා දීමේ පාලකයන්ට තියෙන අයිතිය තමයි මානව හිමිකම් කියන්නේ.''

සිරිපාලයට ආරක්ෂක ලේකම් කෙනෙකු වීමේ ලකුණු තියෙනවා. චමිය ආයිමත් වසන්තිට කිව්වා.

''මානව හිමිකම් කියන්නේ සර් ජිනීවා සමුළුවට.'' කාන්තිගේ උත්තරේට පොලිටික්ක සතුටු උනු බව පන්තියට දැනුනෙ වසන්ති රවාගෙන හිටපු හැටි දැක්කම.

''ඒ මොකද එහෙම කියන්නේ.'' පොලිටික්ක ඉදිරියට පය තියලා වේගවත් පාරකට සූදානම් වන බව චමියට තේරුණා.

''මෙහෙමයි සර් ජිනීවා සමුළුව කියන්නේ අපේ රටේ මිනිස්සුන්ගෙ සල්ලිවලින් මැති ඇමතිවරු ඇතුළු 200 කට විතර මාසයක් සැප පහසු හෝටල්වල වාසය කිරීමේ අයිතිය ලබාදීල තියෙන නිසා.'' චමියගෙ ගුග්ලි පන්දුව නිසා පොලිටික්කා ඉදිරිපාදයේ ආරක්ෂක පියවරකට පසු බැස්ස.

''අවශ්‍ය ඕනම දෙයක් කීමට ලිවීමට තියෙන අයිතිය තමයි මානව හිමිකම් කියන්නේ.''

''ලියන්න කියන්න විතරද අයිතිය ඕන.'' සුනිල්ගෙ කතාවට සිරිපාලය මැදට පැන්නෙ දුමින්ද එක්ක රෑ ස්වීමකට ගිය ගෝඨාභයගෙ විලාසය සිහි කරමින්.

''මෙහෙමයි පාලකයන්ට ජනතාව පීඩාවට පත්කරන්න තියෙන අයිතිය තමයි මානව හිමිකම් කියන්නේ.'' සිසිරගෙ උත්තරේ කාටත් මතක් කළේ මර්වින් සිල්වා.

''මානව හිමිකම් රැකදීම පාලකයන්ගේ වගකීමක්'' පොලිටික්ක පැහැදිලි කළේ මර්වින් වෙනුවෙන් පෙනී ඉන්න මහින්ද වගේ.

''මානව හිමිකම් කියන්නේ, රටක ජනතාවගේ අයිතිය. ඒ වගේම මේ රටේ පාලනයට එරෙහිව යම් රටක් කටයුතු කරනව නම් ඒ රටට විරුද්ධව පාරට බහින්න මිනිස්සුන්ට තියෙන අයිතිය.'' සුගත්ගෙ පැහැදිලි කිරීමට පොලිටික්ක සතුටු උනු බව ඔලුව අතගාන විදියෙන්ම තේරුනා.

''ඒ වගේම සර් රටක් අපේ රටේ ජනතාවගේ අයිතියට ඇඟිලි ගහනව නම් ඒකට විරුද්ධව මිනිස්සු කැමති උනත් අකමැති උනත් බලය පාවිච්චි කරල මිනිස්සු පාරට ගේන එකත් මානව හිමිකම් තමයි.'' කවදත් පොලිටික්කට ගොට්ට අල්ලන රංජි කරපු පැහැදිලි කිරීමට කිසිම ලැජ්ජාවක් නැතිව පොලිටික්ක සතුටු උනා.

''ඒ වගේම සර් දරාගන්න බැරි ජීවන වියදමට විරුද්ධව මිනිස්සුන්ට පාරට බහින්න තියෙන අයිතිය මානව හිමිකම් කියල කියන්න පුලුවන් නේද?''

චමියගෙ බවුන්සර් පන්දුව පොලිටික්කගෙ හිස්වැස්මෙ වැදුණා.

''සර්, ජනතාව පීඩාවට පත් කරමින් රට ණය උගුලක හිර කරන කොට, උපන් නූපන් පරපුරක් රටේ ණයකාරයන් කරන කොට, ඒකට විරුද්ධව මිනිස්සුන්ට පාරට බහින්න තියෙන අයිතියත් මානව හිමිකම් කියලා කියන්න පුළුවන් නේද?'' ඒ වෙලාවෙ චමිය දැම්මෙ යෝකර් පන්දුවක් කියලා හැමෝටම තේරුණා.

''සර්, ජීවත් වෙන්න බෑ. බඩු මිල අඩු කරන්න කියලා ආණ්ඩුවට බලකරන්න මිනිස්සුන්ට තියෙන අයිතියට කියන්නෙත් මානව හිමිකම් කියල තමයි. ඒ වගේම නීතියේ සාධාරණත්වයට බලපෑම් කරන්න එපා කියලා පාලකයන්ට විරුද්ධව අරගල කිරීමත් මානව හිමිකම් තමයි. මිනිස්සුන්ට නිදහසේ ලියන්න කියන්න වගේම අදහස් ප්‍රකාශ කිරීම සඳහා ඉඩකඩ විවෘත කර ගැනීමත් මානව හිමිකම් තමයි. ඒ වගේම තමයි සර්, එහෙම කරන මිනිස්සුන්ට ගහන එක මරන එක මානව හිමිකම් කියල කොහේවත් සඳහන් වෙන්නේ නෑ.''

සමන්ගෙ කථාව ඉවර වෙන්න කලින්ම පොලිටික්කා වෙනද කියන ආයුබොවන් කියන්නෙ නැතුවම පන්තියෙන් පිටවෙලා ගියේ, තමන්ගේ මානව හිමිකම් අයිතිය ආරක්ෂා කරගන්න කියලා හැමෝටම තේරුණා.

## 3 පිටුවෙන් පුපුරායාමේ ලකුණු පෙන්වන...



සමස්ත ණය මුදල සඳහාම 3% දක්වා පොලිය වැඩිකරන බවය. එය ඉතා බරපතළ තත්වයකි. අනෙක් කොන්දේසිය වූයේ, රුපියල පාලනයෙන් ආණ්ඩුව ඉවත්විය යුතු බවය. ආණ්ඩුව මේ කොන්දේසි පිළිගැනීමත් සමග රුපියල පාලනයෙන් ඉවත්වී එය බාල්දුවීමට ඉඩ හැරියේය. මීට අමතරව ඉරානයෙන් තෙල් මිලදී නොගන්නා ලෙසට එක්සත් ජනපදය ආණ්ඩුවට බලකරමින් සිටී. ඒ සඳහා ආණ්ඩුවට බලකිරීමට එක්සත් ජනපදය සතුව මානව හිමිකම් නම් අවිය තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කොමිසම රැස්වන තත්වයක් තුළ එක්සත් ජනපදයට අවනත වීම හැර අන් විකල්පයක් රාජපක්ෂ ආණ්ඩුවට නැත.

අධිරාජ්‍යවාදීන් සිය ආර්ථික අර්බුදයේ බර එක් අතකින් තම රටවල ජනතාව මත පටවන අතර අනෙක් අතින් පරිධියේ පසුගාමී රටවල් මතද පටවයි. ඒ සඳහා පරිධියේ පසුගාමී රටවල ධනපති පාලකයන් හීලෑ කරගැනීමේ 'මන්තර' අධිරාජ්‍යවාදීන් සතුව තිබේ. මහජන මුදල් ගසාකෑම සිය ජීවන වෘත්තිය බවට පත්කරගත් අයිතීන් ඉල්ලන ජනයා මර්දනය කිරීම තම ප්‍රතිපත්තිය බවට පත්කරගත් බලලෝභී ධනපති පාලකයින් ඉදිරියේ ඇත්තේ, තම 'සුරලොව' රැකගැනීම වෙනුවෙන් අධිරාජ්‍යවාදය ඉදිරියේ දණගැසීමය; රටත් ජනතාවත් පාවාදීමය. රාජපක්ෂ පාලනයද මේ කරමින් සිටින්නේ එයයි. ජනතා විරෝධයන් නිසා ධනපති පාලකයින් අධිරාජ්‍යවාදී වුවමනාවන් ඉටුකිරීමට පසුබට වන විට අධිරාජ්‍යවාදීහු 'මානව හිමිකම් අවි' R2P හෙවත් ආරක්ෂා කිරීමට වගවීමේ අවි රැගෙන සටනට එති. සැබෑ ලෙසම මානව හිමිකම් නොරකින හා මානව හිමිකම් කඩ කරන පාලකයින්ට සිදුවන්නේ, ඒ ඉදිරියේ දණ නමා අධිරාජ්‍යවාදී අරමුණුවලට අනුව කටයුතු කරමින් තම පාලනය රැකගැනීමය. අධිරාජ්‍යවාදීන්ගේ බලපෑම් හමුවේ නිවට වන රාජපක්ෂලා ජනතා උද්ඝෝෂණවලට කඳුළු ගෑස් ප්‍රහාර වෙඩි ප්‍රහාර එල්ල කරමින් චණ්ඩි පාට් දමන්නේ මේ සත්‍යයට අනුවය.

කෙසේ වෙතත් ලෝක ආර්ථික අවපාතයේ කුණාටුව දැන් යුරෝපය පසුකරමින් ආසියාව හරහා ලංකාවටද ඇතුල්වී තිබේ. මේ තත්වය තුළ තව තවත් ආර්ථිකය කඩා වැටීම හැර තව තවත් බඩුමිල වැඩිවීම හැර තව තවත් ජනතා සහන කප්පාදු කිරීම හා ජනතාව මත බරපැටවීම හැර අන් දෙයක් බලාපොරොත්තු විය නොහැක. ජනතාව මත බර පටවනවාට අමතරව සමහර ව්‍යාපෘති නවතා දැමීමටද ආණ්ඩුවට සිදුවේ. දැනටමත් වියදම් පාලනය කරන ලෙසත් සමහර ව්‍යාපෘති තාවකාලිකව නවතා දමන ලෙසත් ආණ්ඩුව උපදෙස් දෙමින් සිටින බවට ආරංචි ලැබෙමින් තිබේ. පොදුවේ ගත් විට සෑණකෙළි හමාර වෙමින් තිබේ. මෙම තත්වය විසින් ලෝකය පුරාම මෙන්ම ලංකාව තුළද නිර්මාණය කරන්නේ, අරගලකාරී වාතාවරණයකි. ජනතාව මත පැටවෙන බර දරාගැනීමට නොහැකි වන විට, ජීවත්වීම තවදුරටත් අසීරු වනවිට ඊට ජනතාවගේ පැත්තෙන් ප්‍රතිචාර දැක්වීම බලාපොරොත්තු විය යුතු දෙයකි. තම අයිතීන් ඉල්ලා, තමන්ට සහන ඉල්ලා ජනතාව නගන හඬට පාලකයන් ඇහුම්කන් නොදෙන විට එම ජනතාව වෙත කඳුළු ගෑස් සහ වෙඩි උණ්ඩ මුදා හරින විට සිදුවන්නේ, එම අරගල තව තවත් ව්‍යාප්ත වීම හා තව තවත් උණුසුම් වීමය. අවසානයේ ඒවා පාලකයන්ට ගෙදර යෑමට බලකරන තරමේ ප්‍රබල හා පැතිරුණු ජනතා අරගල දක්වා වර්ධනය විය හැක.

මේ තත්වයේ අනතුර හොඳන්ම තේරුම්ගෙන සිටින්නේ, තම අර්බුදයේ බරපතළකම දන්නා ආණ්ඩුවය. එබැවින් දැන් ආණ්ඩුව ඉදිරියේ ඇත්තේ, නිර්මාණය වන ජනතා අරගල වැළැක්වීම සඳහා ක්‍රම සේවීමය. ඒ සඳහා ආණ්ඩුවට පක්ෂපාත මස්කටු ලෙවකන හොරිකඩ පිරිස් යොදවා ජනතා උද්ඝෝෂණවලට එරෙහිව 'ආණ්ඩුවට සහාය පළකිරීමේ උද්ඝෝෂණ', 'රට බේරා ගැනීමේ උද්ඝෝෂණ' අටවමින් ජනතාවට පහරදීම සඳහා කඳුළු ගෑස් හා කුළුපොලු ඇණවුම් කිරීම සඳහා ආණ්ඩුව පෙළඹෙනු ඇත. සමගි පෙරමුණු ආණ්ඩුව බලයේ සිටි 70-77 වකවානුවේ 1973 කාලයේ සහල්, මිරිස්, සීනි ආදී භාණ්ඩ හිඟවී ඒවායේ මිල වැඩිවී තිබියෙදී සමගි පෙරමුණ වෙනුවෙන් පෙළපාලි යමින් 'සීනි නැතිව තේ බොන්නම්, මිරිස් නැතිව හොදි කන්නම්, මැතිණී අපට කියනවනම් පිදුරු උනත් අපි කන්නම්' යැයි කියූ වර්ගයේ මිනිසුන්ද සිටින රටක ආණ්ඩුවට සහාය පළකිරීමේ උද්ඝෝෂණ පැවැත්වීම ගැන පුදුම විය යුතු නැත. එහෙත් ඉන් අර්බුදයට විසඳුම් නොලැබෙන අතර ජනතාවගේ පීඩාව අඩු වන්නේද නැත. අවසානයේ ජනතාව ඉදිරියේ පවතින්නේ, අරගල කිරීමේ මාවත පමණක් වනු ඇත.

එබැවින් වත්මන් අර්බුදය විසින් නිර්මාණය කරන ජනතා අරගලවලට මුහුණදීමට පහරදීමට, කඳුළු ගෑස් ආනයනය කරමින් රාජපක්ෂ පාලනය සූදානම් වෙද්දී අප සූදානම් විය යුත්තේ, සැබෑ වමේ ප්‍රගතිශීලි බලවේග සූදානම් විය යුත්තේ, ජනතා අරගලයන්ට නායකත්වය දීමටය. ඒ, සරල ආණ්ඩු මාරුවක් වෙනුවෙන් නොව ධනවාදය වෙනස් කරන සමාජ පරිවර්තනයක් සඳහාය. පොදුවේ ගත් විට අර්බුද යනු අභියෝගයන්ය. අභියෝග යනු අවස්ථාවන්ය. අවස්ථාවන් හොඳින්ම උපයෝගී කර ගන්නා ජනතා බලවේග කුමක් සිදු වුවත් අවසානයේදී ජයග්‍රහණය කරනු ඇත. මේ ඒ වෙනුවෙන් සූදානම් වීමේ කාලයයි.

## 7 පිටුවෙන් හිතනවාද...



බවය.
කම්කරුවා ආත්මාර්ථකාමීත්වය නැමැති අයිස් වතුරේ ගිල්වා දමා ඇත. ඔහුගේ ආත්මාර්ථකාමීත්වය කොතෙක්ද යත් තමාගේ වැටුප පමණක් වැඩි කරගැනීමට අරගලයට පිවිසෙන අතර තවත් කම්කරුවෙකුගේ වැටුප් අරගලයක් හේතුවෙන් තමාට මුහුණ පාන්නට සිදුවන අපහසුතාව දරාගැනීමට නොහැකිව ඊට දෙස් දෙවොල් තබයි.

**''ස්වභාවික ස්වාමිවරුන්ට මිනිසා බැඳ තිබුණු අනේකවිධ රදළවාදී බන්ධනයන් අනුකම්පා විරහිත ලෙස සිඳබිඳ දැමූ ධනපති පන්තිය මිනිසෙකු සහ මිනිසෙකු අතර නග්න ස්වාර්ථකාමය හැර, අනුකම්පා විරහිත ලෙස මුදල් ගෙවීම හැර වෙනත් කිසිදු සබඳකමක් ඉතිරි නොකළේය. ආගමික භක්තියද ධීර වීර උනන්දුවද අවරසිකවාදී අනුරක්තතාවයද අරභයා වූ ස්වර්ණමය ආනන්දයන්ද ආත්මාර්ථකාමී ගණන් බැලීම නැමැති අයිස් වතුරේ ගිල්වා දමන ලදී.''** කොමියුනිස්ට් ප්‍රකාශනය 36 පිටුව

ජනතාව සිතන්නේ තමන්ම නොවේ. ඔවුන් සැමදාමත් රැවටිල්ලට සහ ආත්ම රැවටිල්ලට අඥාන ලෙස ගොදුරු වෙති.
එහෙත් නිර්ධන පන්ති පක්ෂය විසින් අධිපති මතවාදයට එරෙහිව ගෙනියනු ලබන දෘඩතර මතවාදී අරගලයේ බලපෑමත් ආර්ථික අරගලය තුළ හා විප්ලවවාදී සටන්පාඨ තුළදී ඔවුන් ලබන පන්නරයත් විසින් අධිපති මතවාදයේ වහල් බැම්මෙන් මුදවාගනු ලබන ඔවුහු ධනපති ක්‍රමය පෙරළා දමා නව ලෝකය ගොඩනගන්නෝ බවට පත්වෙති.

## 5 පිටුවෙන් පක්ෂ කේඩරය හා...



*වන්නේ, පක්ෂය එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාකාරිත්වය විග්‍රහ කරගන්න අසමත් වූ බවයි. මේ සම්බන්ධයෙන් වන ඔබගේ පැහැදිලි කිරීම කුමක්ද?*

*විජිත හේරත් සහෝදරයාඃ*-රෝහණ විජේවීර සහෝදරයා ඉතාම පැහැදිලිව එල්.ටී.ටී.ඊ. සංවිධානයේ අරමුණ හා ක්‍රියාකාරිත්වය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් කරනු ලැබුවා. ඒ න්‍යායික කරුණුවලට විරුද්ධ වෙන්න අද මේ රටේ කිසිදු පුද්ගලයෙකුට හෝ පක්ෂයකට හැකියාවක් ලැබිලා නැහැ. එදාටත් වඩා අද එය වඩාත් නිවැරදියි කියල ඔප්පු වෙමින් තියෙනවා. අපි අද මැදිහත් වෙන්නේ, ඒ පදනමේ සිටයි. එල්.ටී.ටී.ඊ.ය බෙදුම්වාදී, ජාතිවාදී, ෆැසිස්ට්වාදී සංවිධානයක් ලෙස හඳුනාගන්න අපි සමත්වුණා. එය ජාතික සමගිය ගොඩනැඟීමට වගේම සමාජවාදය ගොඩනැඟීමට බාධාවක්ය යන්න ඉතාම පැහැදිලිව අපි දැක්කා. දෙමළ නිර්ධන පංතිය හා එක්ව ලාංකේය විප්ලවය සිදුකිරීමට ඇති ප්‍රධාන බාධකයක් ලෙස අපි එය හඳුනාගත්තා. එය ඉතාම නිවැරදි ස්ථාවරයක්. ඒ වගේම අධිරාජ්‍යවාදීන් හා ඉන්දියාව ලංකාවේ ජාතික ප්‍රශ්නය පදනම් කරගනිමින් එල්.ටී.ටී.ඊ. සංවිධානය පෝෂණය කරන්න, ශක්තිමත් කරන්න මැදිහත් වුණා. එල්.ටී.ටී.ඊ.ය මගින් ක්‍රියාත්මක වුයේ, අධිරාජ්‍යවාදීන්ගේ බෙදුම්වාදී මතවාදයයි. එබැවින් එක පැත්තකින් අධිරාජ්‍යවාදය පැරදවීම සඳහාත් අනික් පැත්තෙන් ධනපති ක්‍රමය පෙරළා දමා සමාජවාදය ගොඩනැගීම සඳහාත් එල්.ටී.ටී.ඊ.ය පරාජය කළ යුතු වුණා. අපි ඒදේ කළා. එය ඉතාමත් නිවැරදි ක්‍රියාමාර්ග යක්. ඒ පිළිබඳ දෙගිඩියාවක් විචිකිච්ඡාවක් අපිට නැහැ. අද අපි උතුරේ දෙමළ අපේම පන්තියේ ජනතාවත් සමග එක්ව විප්ලවය වෙනුවෙන් කටයුතු කරනවා. මේ තත්වය තුළ සිදුවූ සිදුවීම් දිහා හැඟීම්බරව දැකලා තීරණ ගන්න එක දේශපාලනික නැහැ. අදේශපාලනිකයි. ඒ හැඟීම මත සිටගෙන වැරදි න්‍යායික විග්‍රහවලට යෑම ඊටත් වඩා බරපතළ වැරැද්දක්. ඉතින් ඔය අය කරන්න ලැහැස්ති වුණේ ඒක. ඒ වැරදි න්‍යාය පක්ෂය තුළට කාවද්දන්න සියුම් කුමන්ත්‍රණකාරී වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ලැහැස්ති වුණා. නමුත් පක්ෂය ඉතාම පැහැදිලිව අද එය පරාජය කර තියෙනවා. අද පක්ෂය මතවාදී හා සංවිධානමය ඒකමතියක සිට ඉතා ශක්තිමත්ව කටයුතු කරනවා.

## අවසන් පිටුවෙන් ජනතාවගේ අයිතීන්...

මෙසේ මහජනතාව පීඩාවට පත්කරමින් ලබාගන්නා ආදායම් යොදාගන්නේ, රජදරුවන්ගේ කාර්රේස් සඳහාත් සිය ගණන් පිරිවර සමග විදේශ සංචාරවල යෙදීමටත් සංදර්ශන ආර්ථිකයක් මගින් ජනතාව මුලාකිරීමටත් පමණයි. දිනෙන් දින ඉහළ යන ජීවන වියදමට එරෙහිව ජනතාව සාමකාමී උද්ඝෝෂණවල යෙදෙද්දී නිරායුධ ජනතාවට වෙඩිතබා ඝාතනය කරන තත්වයකට ආණ්ඩුව ඇදවැටී තිබෙනවා.
ජනතා ප්‍රශ්න ඉදිරියේ විසඳුම් ලබාදෙනවා වෙනුවට මර්දනය දියත් කළ ඒකාධිපති නායකයන්ට අවසානයේ ජන බලය ඉදිරියේ ගෙදර යාමට සිදුවුණා. සමහර ඒකාධිපති නායකයන් සිරගත කෙරුණා. ජනතාවගේ දැවෙන ප්‍රශ්න වෙනුවෙන් අඛණ්ඩව අරගල කරමින් ජයග්‍රහණ ලබාදීමට ජනතා විමුක්ති පෙරමුණ නායකත්වය දෙනවා. එම සාමකාමී උද්ඝෝෂණ සඳහා සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනාට ඒකරාශීවන ලෙස ඉල්ලා සිටිනවා.'' ටිල්වින් සිල්වා සහෝදරයා කීය.
මෙම ජනමාධ්‍ය හමුව සඳහා ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයාද එක්ව සිටියේය.

## 13 පිටුවෙන් නෂීඩ් නොදත්...



අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කෙරුණේ මෙම තත්වය තුළයි. එහෙත් නෂීඩ් දේශපාලනය තුළ ඉගෙන ගෙන නොසිටි බොහෝ දේ බල දේශපාලනය තුළ ක්‍රියාත්මක වෙමින් තිබුණා. සැබැවින්ම නෂීඩ්ගේ පාලනය අවසන් කිරීමේ බලවේග ඒකරාශි කරවන්නේ, වේගයෙන් දිගහැරුණු මෙම සිදුවීම් ජාලයයි. දූෂණ චෝදනා මත අපරාධ අධිකරණයට පමුණුවන ලද ගයුම් හිතවාදීන් සියලු දෙනා නිදහස් කෙරී නිවෙස් බලා යැවුණා. නෂීඩ් පාලනය ලැජ්ජාවට පත් කළ මෙම සිදුවීම පිටුපස සිටියේ, අපරාධ අධිකරණයේ අගවිනිසුරු අබ්දුල්ලා මොහොමඩ්. මේ ගයුම් හිතවාදී විනිසුරුවරයා අත්අඩංගුවට ගන්නා ලෙස පසුගිය ජනවාරියේ නෂීඩ්, හමුදාවට නියෝග කළා. එය ක්‍රියාත්මක වුවත් ඒ ඔහුට එරෙහි බලවේග වීදියට කැඳවමිනුයි. ශ්‍රේෂ්ඨාධිකරණය හා අධිකරණ සේවා කොමිසම එය ව්‍යවස්ථා විරෝධී බව කියා සිටිද්දී ගයුම්ගේ විපක්ෂය, අබ්දුල්ලා විනිසුරුවරයා නිදහස් කරන ලෙස ඉල්ලා වීදි බැස්සා. මානව හිමිකම් නාමයෙන් බලයට ආ ජනාධිපතිවරයා ඒකාධිපතියෙකු ලෙසට චිත්‍රණය කෙරෙන අතරතුර විපක්ෂයේ නායකයින් නෂීඩ් පාලනයට එරෙහි කැරලිගැසීමක් ඉල්ලා සිටියා.

**ඉල්ලා අස්වනු නැතහොත් මරණය**

විරුද්ධවාදී උද්ඝෝෂණවලට සහාය පළ කරමින් කැරලි ගැසූ පොලීසිය මාලේ හි පාලක ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මධ්‍යස්ථානයකට පහර දීමෙන් විරෝධතා නව තත්වයක් කරා වර්ධනය වුණා. අනතුරුව ආණ්ඩු විරෝධී මගට හමුදාවේ කොටස්ද ඒකරාශී වූයේ, නෂීඩ්ගේ ඉරණම කාලයට බාර දෙමිනුයි. කලින් පැවති ගයුම් පාලනයේ ප්‍රබලයින් කිහිප දෙනෙක් විපක්ෂ නායකයින් සමඟ එක්වී හමුදා ජෙනරාල්වරුන්ගේද සහාය ඇතිව කුමන්ත්‍රණයක් දියත් කර තිබූ බව නෂීඩ් තේරුම් ගෙන තිබුණේ, බලයෙන් පහවීමෙන් පසුවයි. පසුගිය 07 වැනි දින උදෑසන විට මාලදිවයින තම පාලනයේ නොමැති බව නෂීඩ් තේරුම් ගන්නට ඇති. ජාතික ආරක්ෂක හමුදා මූලස්ථානයට ගොස් කැරලි නොග සන ලෙස ඉල්ලා සිටි මොහොතේ ඔහු කී දෙයට කිසිවෙක් ඇහුම්කන් දුන්නේ නැහැ. ඔහු පසුව මාධ්‍යයට කී පරිදි පැය දෙකක කාලයක් තුළ ඉල්ලා අස්වීම ප්‍රකාශයට පත් කරන ලෙසත් නැතහොත් මරණය බලාපොරොත්තු වන ලෙසත් ඔහුට ගිනි අවි මැද තර්ජනය කෙරී තිබුණා. මාලදිවයින් රූපවාහිනියෙන් ඔහුගේ ඉල්ලා අස්වීම ප්‍රකාශයට පත්වීමත් සමග වසර 3ක නෂීඩ් පාලනයේ නිමාව සටහන් වුණා.
මාලදිවයිනේ ආර්ථිකය තුළ ධනවත්ම ව්‍යාපාරිකයින් ඇතුළු ධනපති පංතිය ගොනු වී සිටියේ, ගයුම් හිතවාදී විපක්ෂය සමඟයි.
පෞද්ගලික රූපවාහිනී සේවාවක් (VTV) හිමි ගයුම් හිතවාදී දේශපාලක ක්වාසින් ඊබ්‍රහිම් ඉන් එක් අයෙක් පමණයි. වසර 30ක ගයුම් පාලනය තුළ ධනවත් වූ ඔවුන්ගේ බලය සමාජයේ විවිධ ස්ථර තුළ ශක්තිමත්ව පැවතුණා. දැඩි මර්දනකාරිත්වය තුළ ප්‍රජාතන්ත්‍රවාදයේ සටන්පාඨ ඔසවාගෙන පැමිණි නෂීඩ්ගේ හුදකලා කඩා වැදීමෙන් ඔවුන්ගේ සමාජ සබඳතා කිසිවක් බිඳ වැටී තිබුණේ නැහැ. අධිකරණය, සන්නද්ධ හමුදා, පොලීසිය අල්ලස් දී දිනාගත් ව්‍යවස්ථාදායකය වැනි රාජ්‍ය බලයේ විශාලතම පංගුව ඔවුන් සතුව පවතිද්දී නෂීඩ් සතු වුණේ, 'අහම්බයකින්' ඔවුන් අතින් ගිලිහුණු ජනාධිපති ධූරය නම් ආණ්ඩුවේ කොටසක් පමණයි. දැන් නෂීඩ් බිමට ඇද දමා උප ජනාධිපති මොහොමඩ් වහීඩ් හසන් එම පුටුවේ වාඩි කරවීමෙන් එයද සම්පූර්ණ වී තිබෙනවා.
බලයෙන් පහ කරනු ලැබීමෙන් අනතුරුව පවත්වන ලද කුඩා උද්ඝෝෂණ කිහිපයකින් පසු නෂීඩ්ගේ අපේක්ෂාව 2013 පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය කඩිනමින් ලබාගෙන නැවත ජනාධිපති පුටුවේ හිඳ ගැනීමයි. 2008දී ඔහු වටා සිටි බලවේග අද ඔහු අතහැර ගොස් ඇති ආකාරය බලයෙන් පහවීමෙන් අනතුරුව පෙනී ගිය අතරම ඔහුගේ නැවත ජනපති පුටුවට ඒමේ අපේක්ෂාවට ඉඩකඩ ලැබේද යන්න සැක සහිතයි. ජනාධිපතිවරණය නියමිත දිනට පෙර ලැබේද යන්න කෙසේ වෙතත් ඒ වන විට ඔහුට එරෙහි චෝදනා ගොනුකර නැවත ඉදිරිපත් වීමේ ඉඩකඩ අවුරා තිබීමට ඇති ඉඩකඩ බොහොමයි.

**පිටුපෑ මිතුරන්**

අනෙක් අතට ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බලයට ආ නායකයෙක් මෙසේ කුමන්ත්‍රණයකින් බිමට බස්සවනු ලබද්දී ලෝකයේ ප්‍රතිචාර මගින්ද නෂීඩ්ට තේරුම්ගත හැකි දෙයක් තිබෙනවා. ඒ, බලයේ සිටිද්දී තමන්ගේ මිතුරන් ලෙස පෙනී සිටි රටවල් කුමන්ත්‍රණයේදී හිතාමතා පිටුපා ගිය ආකාරයයි. විශේෂයෙන් ඔහු මෙතරම් උදව් කර තිබූ ඉන්දියාව (මාලේහි ඉන්දියානු මහ කොමසාරිස් මුලේ(Mulay) නෂීඩ්ගේ සමීතමයෙක්) කුමන්ත්‍රණය මොහොතේ නෂීඩ්ට සහය නොදුන්නා පමණක් නොව තත්වය නිරීක්ෂණය කරන බව වත් නොකියා හදිසියේම මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් නව පාලනයට සහය පළ කළා. අවම තරමින් නෂීඩ්ට දුරකථන ඇමතුමක් පවා දීමට සැලකිලිමත් නොවූ ඉන්දීය අගමැති මන් මෝහන් සිං, දූක සැප විමසුවේ නව ජනාධිපති වාහිඩ්ගෙනුයි. මෙසේ වන්නේ, 1988 නොවැම්බරයේදී ගයුම් පාලනය පෙරළීමේ කුලී හේවායින්ගේ (ප්ලොට් සාමාජිකයින් පිරිසක්) කුමන්ත්‍රණයක් දියත් වූ මොහොතේ ඉන්දියාව යුධ, ගුවන් හා නාවික හමුදා යවා එය මැඩ පවත්වා ගයුම් රැකදුන් ඉතිහාසයක් තිබියදීයි. ඉන්දියාව අහක බලාගත් බවට අද නෂීඩ් හා නෂීඩ්ගේ මාලේ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය චෝදනා කරද්දී ඔවුන්ට දේශපාලනයේ ඉගෙන ගැනීමට බොහෝ දේ ඇති බව පෙන්වා දෙමින් මාලදිවයින් ධනපති පංතිය රටේ තුන් ලක්ෂ විසි දහසක ජනතාවගේ ජීවිත පාලනය කිරීම නැවතත් සෘජුව තමන් අතට ගෙන තිබෙනවා. නිවැරදි දේශපාලන දැක්මකින් තොර පුද්ගල මැදිහත්වීම්වලට දේශපාලනයේ යා හැකි දුර මාලේ අර්බුදය විසින් මනාව පෙන්වා දෙනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## ජිනීවා 'නාඩගමේ' ඇත්ත කතාව

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ සැසිවාරය ජිනීවාහිදී ආරම්භ වූ පසුගිය පෙබරවාරි 27දා ආණ්ඩුව බලහත්කාරය මගින් හා කුලියට ගත් 'දේශප්‍රේමී බලඇණි'ද සමඟ වීදි බැස්සේය. ඒ ''රට බේරා ගැනීම සඳහා'' එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී බලවේග පරාජයට පත් කිරීමට ආණ්ඩුව වටා එකතු වන ලෙස ජනතාවට ආරාධනා කරමිනි. ආණ්ඩුව ජනතාවට පැවසුයේ, රටට හා රාජ්‍ය නායකයාට එරෙහිව ජිනීවා මානව හිමිකම් කොමිසමට යෝජනාවක් ගෙන ඒමේ උත්සාහයක් තිබෙන බවත් එය පරාජය කිරීමට පාරට බැසිය යුතු බවත්ය.

බැංකි මූන්ගේ උපදේශක කමිටුව පත්කිරීමට එරෙහිව දින දෙකේ මාරාන්තික 'උපවාසයට' වාඩිවූ ඇමතිවරයා ඇතුළු රාජපක්ෂ ආණ්ඩුවේ ඊනියා දේශප්‍රේමී බලඇණිවල අයිතිකරුවන්ව සිටින ඇමතිවරු මෙහිදී පෙරමුණ ගෙන තිබිණි. ආණ්ඩුව අසාධාරණ ලෙස තෙල් මිල වැඩිකරන විට ඊට එරෙහිව සාමකාමී විරෝධතා පැවැත්වූ ධීවර කාර්මිකයෙක් වෙඩි තබා මරා දමා මානව හිමිකම් අමු අමුවේ උල්ලංඝනය කරන විට කටේ ඇමති මස් කටු හිරකරගෙන ගොළුවන් සේ සිටියේද මේ ඇමතිවරුමය.

කෙසේ වෙතත් ආණ්ඩුව රඟ දක්වන 'ජිනීවා නාඩගමේ' ඇත්ත තත්වය ජනතාව තේරුම් ගත යුත්තේ, රට ගැන අවංක හැඟීමක් ඇති දේශප්‍රේමී ජනයා මෙම 'නාඩගම' විසින් මංමුලා කරනු ලැබීමෙන් වැළැක්වීමටය. 2010 බැංකි මූන්ගේ උපදේශක කමිටුව පත්කරන අවස්ථාවේදීද එම උපදේශක කමිටුවේ සභාපති දරුස්මාන්ට මහජන මුදල්වලින් දිවා භෝජන සංග්‍රහ පැවැත්වූ ආණ්ඩුව, ඒ සියල්ල ජනතාවගෙන් වසං කරමින් රට තුළ ' දේශප්‍රේමී' ජෝගියක් නැටුවේය. ඒ, ජනතාව නොමග යවා ආණ්ඩුවේ ඇත්ත අර්බුදය වසා ගැනීමටය.

දැන් සිදුව තිබෙන්නේද එයයි. ආණ්ඩුවේ 'අධිරාජ්‍යවිරෝධී' උද්ඝෝෂණවල සැබෑ අරමුණ රට රැක ගැනීම නොව ජනතා අප්‍රසාදයට පත්ව ඇති රාජපක්ෂ පාලනය රැක ගැනීමය. පසුගිය දිනවල තෙල් මිල, බස් ගාස්තු හා විදුලි බිල වැඩිකිරීමත් සමඟ ඊට එරෙහිව නිර්මාණය වූ ජනතා උද්ඝෝෂණයන් ආණ්ඩුවට රතු එළි දල්වන ඒවා විය. මිල වැඩිකිරීම්වලට එරෙහිව හා ධීවර කාර්මිකයාගේ ඝාතනයට එරෙහිව පැතිරෙමින් ගිය ජනතා අරගල අබියස ආණ්ඩුව බියට පත්වූ බව පෙනිණ. එලෙස ජනතා උද්ඝෝෂණ හමුවේ කරකියාගත නොහැකිව සිටි ආණ්ඩුවට ජිනීවා සමුළුව හා එක්සත් ජනපදයේ ක්‍රියාමාර්ගය වෙස් වළාගත් ආශිර්වාදයක් විය. ආණ්ඩුව වහාම එම අවස්ථාව තම වාසියට ගත්තේ, රට තුළ ජනතා අවධානය වෙනතකට හැරවීම සඳහා අවසානයේ 'දේශප්‍රේමය' පිටුපස සැඟවෙමිනි.

රාජ්‍ය බලය බලහත්කාරය හා විවිධ අල්ලස් දීම් මගින් ගෙන්වා ගත් පිරිස් සමඟ පොලිස් ආරක්ෂාවද මැද වීදි බට ආණ්ඩුව එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදය පරසක්වල ගසන බවට තර්ජනය කළේය. ලංකාවට අත නොතබන ලෙස ජිනීවා සමුළුවට අනතුරු ඇඟවිය. බාල හින්දි චිත්‍රපටයක වීරයාගේ සටන් දෙස බලා ගැලරියේ සිට විසිල් ගසන ප්‍රේක්ෂකයා මෙන් ලංකාවේ සමහර අයද මේ දෙස දෑස් දල්වා බලා සිටියේ, රාජපක්ෂ පාලනය අධිරාජ්‍යවාදට අභියෝග කරන ආකාරය ගැන උදම් අනමිනි.

එහෙත් සැබෑ ලෙසම සිදුවූයේ කුමක්ද? ආණ්ඩුව රට තුළ පාරට බැස පෙළපාලි යමින් පොදු ජනයා මුලා කරද්දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම හමුවේ ලංකාව වෙනුවෙන් කතා කළ මහින්ද සමරසිංහ ඇමතිවරයා පවසා තිබුණේ, ''උගත් පාඩම් කොමිසමේ නිර්දේශ අනුව දැනටමත් කටයුතු කරන නිසා ජිනීවා යෝජනා අසාධාරණයි.'' යනුවෙනි. එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර රටවල් ශ්‍රී ලංකාවට බලකළේද මානව හිමිකම් කොමිසමට යෝජනාවක් ගෙන ඒමට තීරණය කළේද උගත් පාඩම් කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කරවීමටය. ආණ්ඩුව එය ප්‍රතික්ෂේප කළේ නැත. ආණ්ඩුව කියන්නේ, තමන් එක්සත් ජනපදය ඇතුළු අධිරාජ්‍යවාදී රටවල යෝජනාවලට අනුව ක්‍රියාකරමින් සිටින බවත් ඒ සඳහා තමන්ට කාලය හා අවකාශය අවශ්‍ය බවත්ය. උගත් පාඩම් කොමිසමේ වාර්තාව ක්‍රියාත්මක කිරීම ගැන සහතික වෙමින් මහින්ද සමරසිංහ මහතා ජිනීවා සමුළුව හමුවේ මෙසේ පවසා ඇත. ''ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම හා අදාල චෝදනා පිළිබඳ වාර්තාවේ ඇතුළත් නිර්දේශ පිළිබඳව නීතිපතිවරයා දැනුවත් අතර, ඔහු ඒවා අධ්‍යයනය කරමින් සිටී. ජාත්‍යන්තර රීති අනුව යමින් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම විසින් හඳුනාගත් විශේෂ සිද්ධීන් පිළිබඳව විමර්ශන හමුදා අධිකරණයක් මගින් ආරම්භ කර ඇත.''

මහින්ද රාජපක්ෂ මහතා විදුලි පුටුවේ තැබීමෙන් බේරාගැනීමට ජනතාව පාරට කැන්දන ආණ්ඩුව මානව හිමිකම් කොමිසමට පොරොන්දු වන්නේ, ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම පිළිබඳ විමර්ශනය සඳහා හමුදා අධිකරණයක් ආරම්භ කර ඇති බවය. ඒ අනුව හමුදා නිලධාරීන්ට දඬුවම් කර ඔවුන් බිල්ලට දී ඇඟ බේරා ගැනීමට ආණ්ඩුව දැනටමත් පියවර ගෙන තිබේ.

එපමණක් නොව සමරසිංහ මහතා චැනල් 4 ගැනද සඳහන් කර තිබේ. ''සිවිල් වැසියන් හෝ රෝහල්වලට හා යුද මුක්ත කලාපවලට හානි සිදුකිරීම අරමුණු කරගනිමින් සිවිල් වැසියන්ට එරෙහිව හමුදා විසින් හිතාමතා ප්‍රහාරයක් එල්ල කළාද යන්න ඇතුළුව සිවිල් ජීවිත හානි සහ චැනල් 4 ගැන පරීක්ෂණ පැවැත්වීම හමුදා අධිකරණයේ වරම වේ. එසේ වී ඇත්නම් එම කාර්යයට වගකිව යුතු අය සම්බන්ධයෙන් ගතයුතු පියවර පිළිබඳ නිර්දේශ කිරීමද මෙම පරීක්ෂණ අධිකරණයේ වගකීම වේ.''

චැනල් 4 වාර්තා වැඩසටහන බොරු කිරීමට මහා මෙහෙයුමක් කරන බව රටට කිව් ආණ්ඩුව මානව හිමිකම් කොමිසන් සභාවට සහතික වන්නේ, ඒ පිළිබඳ පරීක්ෂණ පවත්වා වගකිව යුතු අයට දඬුවම් දීමටද සූදානම් බවය. හමුදා අධිකරණයට අමතරව නාවික හමුදා අධිකරණයක්ද පිහිටුවා ඇති බවද ඔහු කියයි. එක්සත් ජනපදය ඇතුළු බටහිර රටවල් ආණ්ඩුවට බල කළේද මෙය කරන ලෙසය. දැන් ආණ්ඩුව කියන්නේ, ඒ සඳහා තවත් සුළු කාලයක් අවශ්‍ය බව පමණි. එසේ නැතිව එක්සත් ජනපද යෝජනාව ප්‍රතික්ෂේප කිරීමක් ආණ්ඩුව සිදුකර නැත.

ආණ්ඩුවේ දෙබිඩි හැසිරීම හෙළි වන්නේ එහිදීය. ජිනීවාවලදී අධිරාජ්‍යවාදය ඉදිරියේ දණ නමා 'ගැත්තාට අනුකම්පා කොට' තව ටික කලක් ලබාදෙන ලෙස ඉල්ලමින් මේ වන විට කළ 'වැඩ ප්‍රමාණය' ගැන වාර්තාවක් ඉදිරිපත් කරන ආණ්ඩුව රට තුළ වීදිවලට බැස පඹයන් පුළුස්සමින් දේශප්‍රේමී වීරයාට රඟපාමින් සිටී. ඒ වෙන කිසිවකට නොව සිය ජනතා විරෝධී ක්‍රියාමාර්ග නිසා ආණ්ඩුවට එල්ල වී ඇති ජනතා විරෝධය ටික දිනකට හෝ යටපත් කර රාජපක්ෂ පාලනයේ දිවි රැක ගැනීම සඳහාය. ආණ්ඩුවේ ජිනීවා නාඩගමට ජනතාව නොරැවටිය යුත්තේ, ඒ නිසාය.

ලංකාවට එරෙහිව මානව හිමිකම් දඩමීමා කරගනිමින් මැදිහත්වන අධිරාජ්‍යවාදයේ බලපෑම් පරාජය කළ යුතුය. එහෙත් එය කළ හැක්කේ, ඊට පාර කපන හා අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රයට අනුව වැඩකරන රාජපක්ෂ පාලනය රකිමින් නොවේ. වර්තමානයේදී අධිරාජ්‍යවාදය පැරදවීමත් රාජපක්ෂ පාලනය ඇතුළු ධනවාදය පැරදවීමත් එකම සටනක් බවට පත්ව තිබේ. සැබෑ දේශප්‍රේමීන් පෙළ ගැසිය යුත්තේ, ඒ සඳහාය.

# ජනතාවගේ අයිතීන් දිනාදීම වෙනුවෙන් අරගල කිරීමට ජ.වි.පෙ. නායකත්වය දෙනවා




### ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

ඔහු මේ බව ප්‍රකාශ කළේ, පසුගිය 16වැනි දින බත්තරමුල්ල, පැලවත්තේ පිහිටි ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී ජනමාධ්‍ය සාකච්ඡාවක් පවත්වමිනි. තෙල්, බස් ගාස්තු, සහ විදුලි බිල ඉහළ දැමීමෙන් පීඩාවට පත් සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනකොටස්වල අයිතීන් දිනාදීම සඳහා ආණ්ඩුවේ කුමන මර්දන මැද්දේ වුවද තම පක්ෂය නායකත්වය ලබාදෙන බවත් ඒ සඳහා පාරට බැස උද්ඝෝෂණය කරන බවත් කියා සිටි ටිල්වින් සිල්වා සහෝදරයා ආණ්ඩුව තෙල් මිල, බස්ගාස්තු සහ විදුලි බිල විශාල වශයෙන් වැඩිකර ජනතාව දැඩි පීඩනයකට පත්කිරීමට එරෙහිව විරෝධතා අඛණ්ඩව පවත්වන බව අවධාරණය කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ප්‍රධාන ලේකම් සහෝදරයා, තෙල්මිල වැඩිකිරීමට සිදුවූයේ, ලෝක වෙළඳපොළේ තෙල් මිල ඉහළයාම නිසා බව හුවාදැක්වීමට ආණ්ඩුව උත්සාහ කළද සත්‍ය වශයෙන්ම සිදුවී ඇත්තේ, එයටත් වඩා ආණ්ඩුවේ බොරු සංදර්ශන වියදම් ජනතාව මත පැටවීම සහ දේශප්‍රේමී සළුපිළි පැළඳ ගනිමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ඇමරිකා එක්සත් ජනපදය ඇතුළු බටහිර අධිරාජ්‍යවාදීන් ඉදිරියේ අවනතවීම නිසා බව පෙන්වා දුන්නේය. මෙම තත්වයට හොඳම උදාහරණය IMF කොන්දේසි ඉදිරියේ පසුගිය අයවැයේදී රුපියලේ අගය 3%කින් බාල්දුකිරීම සහ මේ වන විට එහි අගය පාවීමට ඉඩහැර තිබීම බව ඔහු කීය.

''ආණ්ඩුවට ආදායම් උපයාගැනීම සඳහා ණය ගැනීම දඩ ගැසීම සහ බදු බර පැටවීම හැර වෙනත් කිසිදු විකල්පයක් නැහැ.

15 වැනි පිටුවට

ප්‍රෝඩාකාරී විශ්‍රාම වැටුප් පනතට විරුද්ධව නිදහස් වෙළඳකලාප කම්කරුවන් ගෙනගිය උද්ඝෝෂණයට වෙඩිතබා රොෂේන් චානක ඝාතනය කර එහි මතකයේ උණුසුම යාමටත් පෙර සාමකාමී ධීවර උද්ඝෝෂණයට වෙඩිතබා ඇන්තනී ප්‍රනාන්දු නම් දෙරු පියෙකු ඝාතනය කර ඇතැයිද මෙම ඝාතනය ජනතා විමුක්ති පෙරමුණ දැඩි පිළිකුලෙන් හෙළාදකින බවද ප්‍රකාශ කළ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ආණ්ඩුවේ මෙම වියරු ක්‍රියාමාර්ග පරාජය කිරීම සඳහා සමස්ත ජනතාවට නායකත්වය දීමේ හැකියාව තම පක්ෂයට ඇතැයි අවධාරණය කළේය.

## ආණ්ඩුව අනුගමනය කරන්නේ, අධ්‍යාපනය විනාශ කිරීමේ උපක්‍රමයි

### අනුර දිසානායක සහෝදරයා



මුළු අධ්‍යාපන පද්ධතියේම ගැඹුරු අර්බුද නිර්මාණය කර ඇති ආණ්ඩුව පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ඉඩ දී දුප්පත් දරුවන්ට ඇති අවස්ථාව ඩෝසර් කරමින් සිටින බවත් මෙමගින් ඩෝසර් වන්නේ, රටේ දරු පරම්පරාවේ අනාගතය බවත් අවධාරණය කළ ජවිපෙ දේශපාලන මණ්ඩල සභික අනුර දිසානායක සහෝදරයා මෙම තත්වයට තවදුරටත් ඉඩ දෙනවාද යන ප්‍රශ්නය සමාජය ගැඹුරින් සලකා බැලිය යුතු බව ප්‍රකාශ කළේය.

ඔහු මේ බව පැවසුවේ, පසුගිය 09 වන දින කොළඹ මහජන පුස්තකාලයේදී සමාජවාදී ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද 'අධ්‍යාපනයේ පෙනෙන, නොපෙනෙන අර්බුදය'

02වැනි පිටුවට

## ජ.වි.පෙ. දමිල ජන හමුවක



දෙමළ ජනතාව මුහුණ දෙන ගැටලු විමසා බලන ජන හමුවක් සංවිධානය කිරීමට ජනතා විමුක්ති පෙරමුණ පසුගිය පෙබරවාරි 12වැනිදා පියවර ගත්තේය. බත්තරමුල්ල සමාජවාදී කම්කරු සංගමයේ ප්‍රධාන කාර්යාලයේ පැවති මෙම හමුව හා සමගාමී සාකච්ඡා සඳහා ජ.වි.පෙ. නායක සෝමවංශ අමරසිංහ, මධ්‍යම කමිටු සාමාජික රාමලිංගම් චන්ද්‍රසේකර් ඇතුළු ජ.වි.පෙ. නායකයින් එක්වී සිටියහ.

## ජ.වි.පෙ. සහ ඕස්ට්‍රේලියානු කම්කරු පක්ෂය අතර සාකච්ඡා



ඕස්ට්‍රේලියානු කම්කරු පක්ෂයේ සෙනෙට් මණ්ඩල සභික ඇලෙක්ස් ගැලවර් මහතාගේ විශේෂ නියෝජිත මැතිවු මැරෝසි මහතා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා සමග පැලවත්ත, බත්තරමුල්ල ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පසුගිය 02දා සාකච්ඡාවක් පැවැත්වීය.

මෙහිදී ලංකාවේ කම්කරු ව්‍යාපාරය පිළිබඳව සහ ජනතා විමුක්ති පෙරමුණේ වෘත්තීය සමිති කටයුතු පිළිබඳව සාකච්ඡා කළ බවත් මේවන විට රටේ කම්කරු අරගල සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ නායකත්වය ගෙන කටයුතු කරන බවත් සමාජවාදී සමාජයක් කරා රට පරිවර්තනය කිරීමේ අරමුණ ඇතිව රට තුළ දේශපාලන ක්‍රියාමාර්ග ගෙන ඇති ආකාරයත් ඕස්ට්‍රේලියානු නියෝජිතයාට පැහැදිලි කළ බව විජිත හේරත් සහෝදරයා පැවසීය.

ජනතා විමුක්ති පෙරමුණේ රෙඩ් පවර් ජාත්‍යන්තර පුවත්පත සහ වෙනත් සඟරා කිහිපයක් මැතිව් මැරෝසි මහතාගේ නිරීක්ෂණයට ලක්වූ ආකාරය ඡායාරූපයෙන් දක්වේ.

## තෙල් මිල ඉහළ දැම්මේ ආණ්ඩුවේ නාස්තිය පියවා ගන්නයි

### ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික විජිත හේරත් සහෝදරයා



රටේ ඉතිහාසයේ ඉන්ධන මිල මේ තරම් විශාල ගණනකින් ඉහළ දැමූ පළමු අවස්ථාව මෙය බවත් පසුගිය කාලයේ ආණ්ඩුව බොරු සැණකෙළි පවත්වමින් නාස්කාර වියදම් විශාල වශයෙන් දරමින් වංචා දූෂණවලට ඉඩකඩ සලසමින් මහජන මුදල් ගසා කෑමට ඉඩ සලස්වා තිබූ බවත් පෙන්වා දුන් ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයා රජයේ වියදම් පියවා ගැනීමට අවශ්‍ය මුදල් සොයාගැනීමේ උපක්‍රමයක් ලෙස දිගින් දිගටම ජනතාව පීඩනයට පත්කරමින් සිටින බව කියා සිටියේය.

පසුගිය 11වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට ආණ්ඩුව විසින් තෙල් මිල වැඩිකිරීම පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා 12වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදී ඔහු මේ බව පැවසීය. මෙම අවස්ථාව සඳහා ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජික නලින්ද ජයතිස්ස සහෝදරයාද එක්වී සිටියේය.

වැඩිදුරටත් අදහස් දක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය. ''තෙල් සංස්ථාව පැත්තෙන් සලකා බැලුව හොත් හෙජින් ගිවිසුම අත්සන් කිරීම මගින් රුපියල් බිලියන ගණනක පාඩුවක් සිදුකළා. මුළු කැබිනට් මණ්ඩලයේම අනුමැතිය ඇතුවයි හෙජින් ගිවිසුම අත්සන් කළේ. ඒ වගේම ඊට සම්බන්ධ ජාත්‍යන්තර අධිකරණයේ පවතින නඩු විභාගවලට තවත්

02 වැනි පිටුවට









කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 198/19 හි පදිංචි එම්. ටිල්වින් සිල්වා වන මා විසින් අංක 70 මිෂන් පාර, පිටකෝට්ටේ පිහිටි ආර්. සී. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.